# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,859 — 1969 ජූනි 20 වැනි සිකුරාදා — 1969.6.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 1007 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | 1073 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 1027 | ආණ්ඩුවේ නොවන දැන්වීම | 1078 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම | 1034 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම | 1078 |
| බඩු බාහිරාදිය විකිණීම | 1072 | විවිධ දැන්වීම | — |


[සැ. යු.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රිකාවේ V වැනි කොටසේ—කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මඟීන් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම් පත් ලැයිස්තුවක් ද පළවේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්තම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) පුහුණුවීමේ පාඨමාලාව පහත සඳහන් අයුරු වේ :—

දුම්රිය ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් පිළියෙල කරනු ලබන පරිදි දුම්රිය කර්මාන්තශාලාවන් හිදී ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ දී ද තුන් අවුරුදු පුහුණුවක් ලැබිය යුතු අතර, මෙම කාලසීමාව තුළදී පහත සඳහන් පරීක්ෂණවලින් විශිෂ්ඨ සාමාර්ථයක් ලබාගත යුතුය :—

(අ) ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් නියමිත කර්මාන්ත ශාලීය පුහුණුව පිළිබඳ න්‍යාය හා ප්‍රායෝගික පරීක්ෂණය.

(ආ) රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර විසින් නියමිත පුහුණුව පිළිබඳ න්‍යාය හා ප්‍රායෝගික පරීක්ෂණය ;

(ඇ) දුම්රිය ආරක්ෂක නීති සහ රෙගුලාසි පරීක්ෂණය ;

(ඈ) දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල පමණින්, දුම්රිය දෙපාර්තමේන්තු උපදේශ (පාලන), රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, කාර්‍ය සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, මූදල් රෙගුලාසි ආදිය පිළිබඳ පරීක්ෂණය.

පත්කරනු ලබන්නා දුම්රිය සේවයේ වැඩ පිළිබඳ පළපුරුද්දක් හා පුළුල් අවබෝධයක් මෙන්ම වගකීම ඉසිලීමේ හැකියාවක් ලබනු පිණිස අතිරේක දීමනාවක් නොමැතිව පුහුණුවීමේ කාල සීමාව තුළ දී ඕනෑම තනතුරක වැඩ බැලීම හෝ ඕනෑම රාජකාරියක් කළ යුතුය.

(iii) පුහුණුව ලබන්නාගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කවර අංශයක හෝ පුහුණුව වෙනස් කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට හැකිය. නියමිත කවර කොන්දේසියක් වුවද ඉටු කිරීමට අපොහොසත් වී නම් හෝ පුහුණුවීමේ කවර අවස්ථාවක දී වුවද ස්වකීය වැඩ සහ පැවැත්ම පිළිබඳ සතුටුදායක වාර්තා ලබාගැනීමට නොහැකිවී නම් හෝ ඔහුගේ පත්වීම නතර කිරීමට ඉඩ ඇත.

(iv) ඔහු ආධුනික කාලය තුළ දී සිංහල ප්‍රවීනතා පරීක්ෂණවලින් සමත් විය යුත්තේ ය.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය.—වර්ෂයකට රුපියල් 5,160—360×3—6,240/6,960—360×4, 480×10—රුපියල් 13,200 (වාර්ෂිකව රු. 11,280 ක වැටුපෙහි දැවුරුදු නැවතීමක් හා රු. 6,960 සහ රු. 11,280 ට පෙර කාර්‍යක්ෂමතා කඩඉම් ද වේ.)

සටහන් :

(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 10,800 ක වාර්ෂික වැටුප ඉක්මවීමට ලන්ඩන්හි විදුලිය ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබාගත යුතුය.

(ii) ලන්ඩන්හි විදුලිය ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය හිමි අයදුම්කරුවකු මේ තනතුරකට පත්කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත්, ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුප මත තබනු ලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 7,320 ක වැටුප් පියවරට එළඹීමට පෙර ලන්ඩන්හි විදුලිය ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබාගත හොත්, ඔහු එම සුදුසුකම් ලබාගත් දින සිට රු. 7,320 ක වැටුපක් ලැබීමට සුදුසුවේ.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1969.7.4 වැනි දිනට වයස අවුරුදු 21 කට නොඅඩුවූද, අවුරුදු 35 ට නොවැඩිවූ ද බව ;

(සී) (i) ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධියක් (විදුලි ඉංජිනේරු ශිල්පය) හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇතිබව ; නැතහොත්

(ii) ලන්ඩන්හි විදුලිය ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I, II සහ III වැනි කොටස් වලින් සාමාර්ථයක් හෝ සමාන සුදුසුකමක් ලබා ඇති බව ; නැතහොත්

(iii) ලංකා ඉංජිනේරු ආයතනයේ, විදුලි ඉංජිනේරු විභාගයේ I, II සහ III වැනි කොටස් සමත් වී ඇති බව.

සටහන :

(i) යථෝක්ත සුදුසුකම් ලබා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ වයස අවුරුදු 35 ට වැඩි වුවද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොවැඩි නම් ඔවුන්ට අයදුම් කළ හැකිය.

(ii) 1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරු තනතුරුවලට පත්කරනු ලැබ සිටින ඉංජිනේරුවන් ද මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්ට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී ය.
තැ. පෙ. 500.

6–787/1 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

අංක : ඒබී. 46/එක්ස්. 2103/69.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### සහකාර ලේඛනාරක්ෂක තනතුර

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්ෂක තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර.—1969.7.4.
(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර.—1969.7.11.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව කරනු ලැබේ.

(i) ආධුනික කාලය තුලදී නිලධාරියා විසින් ලේඛන පරිපාලනය පිළිබඳ පුහුණුවක් ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරනු ලබන පරිදි 17 වන ශත වර්ෂයේ ඕලන්ද භාෂාව හෝ මධ්‍ය කාලීන පෘතුගීසි භාෂාව පිළිබඳ දැනීමක් ද ලබා ගත යුතුය.

**3. වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය.

වර්ෂයකට රු. 4,080 න් පටන්ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12 ක් මගින් රු. 8,400 ක වාර්ෂික වැටුප තෙක් වැඩිවෙන වැටුප් ක්‍රමයකි.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.7.4 දිනට වයස අවුරුදු 30 කට නොවැඩි බව. (රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව අදාල නොවේ).

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය, භාෂාව, හෝ නීතිය පිළිබඳ විෂයයන්ගෙන් පළමුවැනි පෙළ හෝ දෙවෙනි පෙළ ගෞරව උපාධියක් ලබා සිටින්නෙකු බව,

(ඩී) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා ප්‍රවීනත්වයක් ලබා ඇති බව.

**සටහන :**

(අ) සිංහල හෝ දෙමළ පිළිබඳ හොඳ දැනීමක් හෝ පෘතුගීසි හෝ ලන්දේසි භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල් වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 12 දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

6–787/2 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒබී. 47/එක්ස්. 2104/69.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වෙනි ශ්‍රේණියේ ආයුර්වේද කථිකාචාර්ය තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වන ශ්‍රේණියේ ආයුර්වේද කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය, මගින් සපයන මුද්‍රිත ආකෘතිපත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර.—1969 ජූලි මස 4 වැනිදා.
(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර.—1969 ජූලි මස 11 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයන්හී සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසරයක් නොමැත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය.

වර්ෂයකට රුපියල් 4,080—360 × 12—8,400 කි. රු. 6,960 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ ආයුර්වේදය පිළිබඳ නොයෙකුත් නිබන්ධ පළකිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්ති හෝ පශ්චාත් උපාධි උසස් සුදුසුකම්වලින් යුතුව රු. 6,960 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටු දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969 ජූලි මස 4 දිනට අවුරුදු 25 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 40 ට නොවැඩි වියයුතුය. (උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන්ට බල නොපායි.)

(සී) පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක පළමුවැනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපෙක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපක අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 12 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

6–787/3 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

ඒබී. 48/එක්ස්. 2105/69.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව—ප්‍රවෘත්ති නිලධාරි තනතුරු

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලයෙන් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රවල වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනවල හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969—ජූලි 4 වැනිදා.
(ආ) පිටරට ඉල්ලුම් පත් : 1969—ජූලි 11 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ආකෘතිපත් තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට, අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකු ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දවූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර, විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු, ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(බී) 1969.7.4 වැනි දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(සී) පළමුවන පෙළ හෝ දෙවන පෙළ ගෞරව විද්‍යා උපාධිධරයකු හෝ පුහුණු විද්‍යා උපාධිධරයෙකු හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යා උපාධිධරයෙකු හෝ ඉංජිනේරු විද්‍යාව හෝ කර්මාන්තඥ පුහුණුව පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලත් විද්‍යා උපාධිධරයෙකු හෝ විය යුතුයි.

(ඩී) ජ්‍යෙෂ්ඨ/අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ වෙනත් උසස් විභාගයකදී හෝ බඳවා ගැනීමේ මාධ්‍යයට අනුකූලව සිංහල/දෙමළ භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් හෝ සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

(ඊ) අධ්‍යාපන උපදේශකවරයෙකු වශයෙන් අවුරුදු තුනකට හෝ පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු වශයෙන් අවුරුදු 5කට හෝ මෙම අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයක විදුහල්පතිවරයෙකු වශයෙන් අවුරුදු 5කට නො අඩු පළපුරුද්දක් ඇත්තෙකු විය යුතුයි.

**සංලක්ෂ්‍යය :**

(i) එහෙත් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක අවුරුදු 10කට අඩු සේවයක් ඇති අපේක්ෂකයන්ට මේ තනතුරු ඉල්ලීම සඳහා සුදුසුකම් නැත.

(2) අධ්‍යාපන සේවයේ අවුරුදු 15ක සේවයක් ඇත්නාවූද, සියලුම කාර්යක්ෂමතා කඩඉම් සමත්වී ඇත්තාවූද, පුහුණු විද්‍යා උපාධිධාරී මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන් වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10ක සේවයක් ඇත්නම් මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැක.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 12 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම්
ගොඩනැගිල්ලේ රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේ දීය.

6–787/5 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/5/214.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1969-70 යුනෙස්කෝ අධිශිෂ්‍යත්ව

යුනෙස්කෝ සංවිධානය විසින් එම සංවිධානයේ 1969-70 නිත්‍ය වැඩ සටහන යටතේ පහත සඳහන් විෂයයන් හි පර්යේෂණ සඳහා පිරිනැමෙන අධිශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

(අ) ඝණ අවස්ථා භෞතික විද්‍යාව
(ආ) මූලික අංශු භෞතික විද්‍යාව

අධිශිෂ්‍යත්ව පැවැත්වෙන්නේ ට්‍රියස්ට්හි සිද්ධාන්තික භෞතික විද්‍යාව පිළිබඳ අන්තර් ජාතික මධ්‍යස්ථානයේ ය. දියුණු වෙමින් පවත්නා රටවල සිද්ධාන්තික භෞතික විද්‍යාර්ථීන්ට, ඔවුන්ගේ පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාමට හා පුලුල් කර ගැනීමට ආධාර හා ධෛර්යය දීම වස්, ඒ රටවල අවශ්‍යතා කෙරෙහි විශේෂ සැළකිල්ලක් ඇතිව සිද්ධාන්තික භෞතික විද්‍යාව වර්ධනය කිරීම මධ්‍යස්ථානයේ ප්‍රධාන පරමාර්ථය වේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ඝන අවස්ථා භෞතික විද්‍යාව පිළිබඳ පර්යේෂණ කටයුතු 1970.1.12 වැනි දින ආරම්භ වී 1970.6.30 වැනි දින අවසන් වන අතර මූලික අංශු භෞතික විද්‍යා පර්යේෂණ කටයුතු 1970.4.1 වැනි දින ආරම්භ වී 1970.9.30 වැනි දින අවසන් වේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ යුනෙස්කෝ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1970.1.12 වැනි දිනට, වයස අවුරුදු 45 ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් භෞතික විද්‍යාව පිළිබඳ දෙවැනි පෙළ (ගෞරව) උපාධියක් තිබිය යුතුයි.

(iv) පර්යේෂණ සඳහා තෝරා ගනු ලබන විෂයයට සම්බන්ධ කාර්යයක කෙළින්ම නියුතු වී සිටිය යුතුයි.

(v) 1969.6.1 වැනි දින වන විට, එකී විෂයය පිළිබඳ අවුරුදු 2 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

(vi) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

6. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන නිලධාරීන්ට ඔවුන් දැනට දරණ තනතුරට අයත් වැටුපම ලැබෙන අතර, ලංකාවේදී ගෙවන ගෙවල් කුලී, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසි ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

7. මීට ඉහතදී මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇති අයදුම් පත් මේ තෝරා ගැනීමේදී සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත් 1969 ජූලි 31 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය අරාක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය,
සෙනේට් මන්දිරය,
කොළඹ 1, 1969 ජූනි 11 වැනි දින දීය.

## උප ලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නම මුලින්)

2. උපන් දිනය :————.

3. ලිපිනය : කාර්යාලය :————.
පුද්ගලික :————.

4. ජාතිය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. විවාහක නම් දරුවන් සංඛ්‍යාව :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. වර්තමාන ශ්‍රේණිය සහ ඊට ඇතුල්වූ දිනය :————.

9. වර්තමාන වාර්ෂික වැටුප :————.

10. දැනට කරන රාජකාරි ස්වභාවය :————.

11. (අ) ගණන් තැබීමේ පළපුරුදුකම් :————.
(ආ) ආයතන වැඩ පිළිබඳ පළපුරුදුකම් :————.

12. සිංහල භාෂාවෙහි දැනට ඇති ප්‍රවීනතාවය :————.

13. සිංහල යතුරු ලිවීමේ දැනට ඇති ප්‍රවීණතාවය :————.

14. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–683 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### මාර්ග යෝජනා ක්‍රම කළමනාකාර තනතුර

රාජ්‍ය දැව සංස්ථාවේ මාර්ග යෝජනා ක්‍රම, කළමනාකරු තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—(අ) සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වය (ඒ. ඇම්. අයි. සී. ඊ.) **හෝ** (ආ) බී. ඇස්. සී. (ඉංජිනේරු). උපාධියත් **සමඟ** මාර්ග තැනීම හා නඩත්තු කිරීමේ වැඩ පිළිබඳ අවුරුදු 3 ක පළපුරුද්දක් **හෝ** (ඇ) රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක ප්‍රධාන පරීක්ෂක හෝ (විශේෂ ශ්‍රේණියේ) කාර්මික සහකාර වැනි ශ්‍රේණියක අවුරුදු 3 ක සේවයක් **සමඟ** මාර්ග තැනීම හා නඩත්තු කිරීමේ වැඩ පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්දක්.

**වයස් සීමාව.**—1969.7.5 වැනි දිනට වයස අවුරුදු 30 ටත් 50 ටත් අතර විය යුතුයි.

**වැටුප් ක්‍රමය.**—මසකට රු. 1,000—50—රු. 1,500 කි. (සියළු දීමනා **සමඟ**)

**සාමාන්‍ය.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

පත්වීම අවුරුදු 3ක කාලයකට ආධුනික තත්ත්වයේ පවතිනු ඇති අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් වැටුපෙන් සියයට පහක් සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුවේ. සංස්ථාව විසින් සියයට දහයක් ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම් පත් තම දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

පහත දැක්වෙන ආකෘතිය ප්‍රකාර සකස් කර ගත් අයදුම්පත් 1969 ජූලි මස 5 වෙනි දිනට හෝ ඊට පෙර කොළඹ 4, අශෝකා උයනේ, අංක 30 දරණ ස්ථානයෙහි, රාජ්‍ය දැව සංස්ථාවේ සේවක කළමනාකාර තැනට ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

අයදුම් පත් ලැබුන බව දන්වනු නොලැබේ.

1969.6.12,
30, අශෝක උයන, කොළඹ 4.

සේවක කළමනාකාර.
රාජ්‍ය දැව සංස්ථාව.

### අයදුම් පත් ආකෘතිය (රාජ්‍ය දැව සංස්ථාව)

........................................... තනතුර සඳහා අයදුම් පත.

1. සම්පූර්ණ නම :————. 2. ලිපිනය :————.
3. (i) උපන් දිනය :————.
(ii) 69.7.5 වැනි දිනට වයස:—අවුරුදු:——, මාස:——, දින :——.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඈමිණිය යුතුයි).
4. අධ්‍යාපන සුදුසුකම් :————. (සහතික පිටපත් ඈමිණිය යුතුය.)
5. කාර්මික/වෘත්තීය සුදුසුකම් :————. 6. පළපුරුද්ද :————.
(සහතික පිටපත් ඈමිණිය යුතුය.)
7. පාසැල හැරයාමෙන් පසු කළ රැකියාවන් :————.
8. දැනට කරන රැකියාව :————.
9. විශෙෂ හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
10. ඔබ ගැන විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :—
1. :————. 2. :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

දිනය :————. අයදුම්කරුගේ අත්සන :————.

6–861 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### සංගීත උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති රජයේ සංගීත විද්‍යාලයයේ සංගීත උපදේශක තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහතින් පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969. 6. 30 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් (පාසල් පරිපාලක ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 1,860—120× 8—රු. 2,820 වේ.

3. **වයස් සීමාව.**—1969. 6. 30 දිනට අවුරුදු 20 ට නො අඩු විය යුතු අතර අවුරුදු 45 ට නො වැඩි විය යුතුයි. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුටම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුයි.

(ii) (අ) ඉන්දියාවේ පිළිගත් සංගීත ආයතනයක උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය හෝ වෙනත් උපාධියක් හෝ ශ්‍රී ලංකා ජාතික කලායතනයේ/රජයේ සංගීත විද්‍යාලයේ/රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයේ සය අවුරුදු සහතිකය හෝ ලංකා ගන්ධර්ව සභාවේ/රජයේ සංගීත විභාගයේ සංගීතය පිළිබඳ අවසාන සහතිකය හෝ ලබා තිබිය යුතුය. මීට අමතරව පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

(ආ) සිතාර්, සරෝද්, බටනලා, ෂෙනායි, වයලින්, එස්රාජ්, සාරංගි, වීණා, ජල තරංග, නල තරංග සබ්වාජ්, තබ්ලා, කෝල්, ඩෝල්, ගැටබෙර, යක්බෙර හා උඩැක්කි යන සංගීත භාණ්ඩවලින් යටත් පිරිසෙයින් එකක් පිළිබඳ විශිෂ්ඨ දක්ෂතාවය හෝ ;

(ඉ) සිංහල ගැමි ගී, ප්‍රශස්ති, වන්නම් හා සෝගී පිළිබඳ විශිෂ්ඨ දක්ෂතාවය හා භාරතීය ගැමි ගී සම්බන්ධව සාමාන්‍ය දැනීම හෝ ;

(ඊ) සිංහල නෘත්‍ය ගීත පිළිබඳ විශිෂ්ඨ දක්ෂතාවය හෝ ;

(උ) උතුරු ඉන්දියානු සංගීතයේ ගායනය පිළිබඳ විශිෂ්ඨ දක්ෂතාවය.

(iii) යටත් පිරිසෙයින් අවුරුදු 3 ක උගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතුය. අවම වශයෙන් කණිෂ්ඨය සමත් වී සිටිය යුතු අතර සිංහල භාෂාවෙන් උගැන්වීමට හා වාර්තා තැබීමට හැකි දැනීමක් තිබිය යුතුය.

**5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවුරුදු 1 ක කාල සීමාවක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලටද තෝරා පත් කරනු ලැබුවන් අනුකූල විය යුතුය.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනයට පසුව එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

7. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම්පත් වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් දැක්වෙන සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක්, (සැ. යු.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

8. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් ලියවිලි මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍යසේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

10. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ඇතුලත පිළිතුරක් නො ලැබුනහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මෙම අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට හෝ ඇයට හෝ අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1969 ජූනි මස 11 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

## ඉල්ලුම් පත්‍රය

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

**රජයේ සංගීත විද්‍යාලයයේ සංගීත උපදේශක තනතුරු**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන් ලියන්න.)

2. තැපැල් ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකිකවන්නේ (අ) පරම්පරාවෙන්ද ? (ආ) ලියා පදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියෙකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.
(ආ) උපන් දිනය :— අවුරුද්ද :——, මාසය :—— දිනය :——.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇයගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමඟ :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

7. අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. පාසලෙන් අස්වූ දින සිට කරන ලද [illegible]රැකියා සම්බන්ධ විස්තර :—

| දෙපාර්තමේන්තුව | දැරූ තනතුර | සේවා කාලය. සිට | දක්වා. |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |

9. ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—
(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න.

10. මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයාගනු ලැබුවහොත්, තෝරීමට කලින් මා නුසුදුසු වීමටත් පත්වීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමටත් මා යටත්වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–750 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ව්‍යාධි වේදය හා භෞත වේදය පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුර

ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ, ව්‍යාධි වේදය හා භෞත වේදය පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**සුදුසුකම් :** අයදුම්කරුවන් නූතන වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලය උපාධිධාරීන් විය යුතු අතර සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන් ගෙන් ඉගැන්වීමට හැකි අය විය යුතු සි.

**දේශන :** දිනකට පැය 2 බැගින් සතියකට පැය 10 ක් පමණ ඉගැන්වීම කළ යුතු ය.

**ගෙවීම :** සියළු දීමනාවන් ඇතුලුව පැයකට රුපියල් 15 ක දීමනා වක් ගෙවනු ලැබේ.

2. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සහිත ඉල්ලුම්පත්‍ර 1969 ජූනි මස 30 වැනි දිනට හෝ ඉන්පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතු ය.

විද්‍යාලයාධිපති.

1969 මැයි මස 24 වැනි දින,
කොළඹ, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.

6–608 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **අයදුම් පත්.**—(අ) මෙහි පහත දැක්වෙන ආදර්ශ සැලැස්ම පරිදි නියමිත ආකෘති පත්‍රයේ පිළියෙල කළ යුතුයි.

(ආ) කොළඹ, තැ. පෙ. අංක 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට පිටතම ලියා එවිය යුතු යි.

(ඉ) 1969.7.10 වනදා හෝ ඊට කලින් හෝ මේ කාර්යාලයයට ලැබෙන පිණිස ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු යි.

**සැලකිය.**—අයදුම් පත බහා එවන කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට අයදුම්පත් " කියා හනක් තැබිය යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වැටුප් ක්‍රමය අවුරුද්දකට රු. 5,880—360—රු. 8,400 ක් වේ.

4. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා තත්‍ව.**—මෙය විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරකි. තෝරා ගනු ලබන නිලධාරියා පත් කරනු ලබන්නේ පළමුවෙන් අවුරුද්දක කාලයක් තනතුරේ වැඩ බැලීමට යටත් කොටය.

5. **තිබිය යුතු සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම :—

(අ) තමා ඉතා යහපත් චරිතයකින් සහ මනා කායික සෞඛ්‍යයෙන් හෙබි බවටත්,

(ආ) රාජකීය සෞඛ්‍ය සමිතියේ සහතිකය දරන බවටත්,

(ඉ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවයේ විශේෂ ශ්‍රේණියේ යටත් පිරිසෙයින් පස් අවුරුද්දක්වත් සේවය කොට ඇති බවටත් පිළිගැණෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු යි.

**සැලකිය.**—1. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක යන දෙපාර්තමේන්තු නිලනාමය යටතේ කටයුතු කරන, විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

2. රාජ්‍ය භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් සේ සැලකේ.

6. සම්මුඛ පරීක්ෂණයේ දී මතු සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබේ :—

(අ) රාජකීය සෞඛ්‍ය සමිතිය විසින් නිකුත් කරන ලද සහතිකය ;

(ආ) සිංහලෙන් එගොඩ වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය ;

**සැලකිය.**—(i) ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අයදුම්පතට අමුණා නො එවිය යුතු යි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කිරීමට නියම කළ කල, එය කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැන සලකා බැලීමක් නැත.

7. අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ පරිපාලක නිලධාරීන් මගිනි. එසේ ද වුවත්, තමන්ගේ අයදුම් පත පිටත් කළ දිනය, අයදුම් පත් බාරගැනීම පියවන දා හෝ ඊට කලින් හෝ මෙහි ලැබෙනු පිණිස ඔවුන් විසින් කෙළින් ම මේ කාර්යාලයයට දන්වා එවිය යුතු යි.

8. අයදුම් පත් ද ඊට සම්බන්ධව වෙනත් ලියුම් කියුම් ද එවිය යුත්තේ කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට ලිපිනය ලියා මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුට නමින් අමතා නොවේ.

9. මේ ගැසට් පතේ I වන කොටසේ II වන ඡේදය පටන් ගන්නා තැන පළ වී තිබෙන්නාවූ ද, රාජ්‍ය සේවයේ තනතුරු කරා දෙන පත්වීම් කෙරෙහි බලපාන්නා වූ ද පොදු කොන්දේසි ද කියවා බලනු යෙහෙකි.

———————,
වී. පී. ඒ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්.

1969 ජූනි 11 දා,
කොළඹ,
තැ. පෙ. අංක 500 හිමි ගාලු මුවදොර,
මහ ලේකම් පායේ සෞඛ්‍ය ඇමැති කාර්යාලයයේ දී ය.

### අයදුම් පතේ ආදර්ශය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර

(1) මුළු නම (පැහැදිලි වටකුරු අකුරෙන්) :————.
(2) පදවිය :————.
(3) දැනට දරන තනතුර :————.
(4) පත්තිය නොහොත් ශ්‍රේණිය සහ ඊට පත්වූ දිනය :————
(5) ලිපිනය : ————. කාර්යාලයය : ————. ගෙදරට : ——
(6) (අ) උපන් දිනය :————.
(ආ) අයදුම් පත් පියවනදාට වයස :————.
(7) අධ්‍යාපන සුදුසුකම් :————.
(8) සිංහලෙන් එගොඩ වූ ඉහළ ම විභාගය :————
(9) රාජකීය සෞඛ්‍ය සමිතියේ සහතිකය දරන්නේ ද යන වග : ————.
(10) විශේෂ සුදුසුකම් කිසිවක් වෙතොත් ඒ පිළිබඳ වගතුග : ————.

ඉහත දැක්වූ තොරතුරු හරිබව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සෞ. වෛ. නිලධාරියාගේ නිර්දේශය.

————,
සෞ. වෛ. නි.

දිනය :————.

වි. කො. ප්‍රධානියාගේ නිර්දේශය

————,
වි. කො. ප්‍රධානියා.

දිනය :————.

6–682 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ✓ ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

### යතුරු ලියන්නකු සඳහා ඇබෑර්තුවක්

මෙම මණ්ඩලයේ සේවයේ යතුරු ලියන්නකු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ වැඩ භාර ගත යුතුය.

(අ) අධ්‍යාපන සුදුසුකම්.—සිංහල, ඉංග්‍රීසි, හා දෙමළ භාෂාව යන විෂයයන්ගෙන් එකක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගය හෝ සමත්විය යුතුය.

(ආ) පඩි ක්‍රමය.—මසකට රු. 80—6—224 මූලික වැටුප හා රජයේ අනුමත අතුරු දීමනා.

(ඇ) වයස.—1.6.69 දිනට අවුරුදු 20 ට අඩු නොවි යුතු අතර එම දිනට අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය.

(ඈ) නිලකාර/කාර්මික සුදුසුකම් හා පලපුරුද්ද—ඉංග්‍රීසියෙන් යතුරුලියනය කිරීමේ හැකියාව විනාඩියකට වචන 35 ක් විය යුතු අතර, සිංහල/හෝ දෙමළ යතුරු ලියනය කිරීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවා කොන්දේසි: —**

1. ආධුනික කාලය අවුරුදු තුනක් වන අතර, සිංහල ප්‍රවීනතා විභාගයෙන් සමත් වි නම් ආධුනික කාලය අවුරුද්දක් වේ.
2. දැනට සකස් කර ඇති මණ්ඩලයේ විධිවිධාන හා ඉදිරියට ඇතිවන විධිවිධානවලට එකඟ විය යුතුයි.
3. ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීම.
4. අර්ථසාධක අරමුදලට තමාගේ වැටුපෙන් 4% සම්මාදම් කිරීම හෝ වෙනත් පිළිගත් අර්ථසාධක අරමුදලට සම්මාදම් කළ යුතු අතර තමාගේ දල වැටුපෙන් 6% මණ්ඩලය විසින් සම්මාදම් කරනු ලැබේ.
5. තනතුරුවලට පත්වන්නන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීති රීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පලපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැකිය.

වයස, අධ්‍යාපන හා පලපුරුද්ද, නිලකාර/කාර්මික සුදුසුකම් (ඇතිනම්) මීට ඉහත දී කළ රක්ෂාව හා ලැබුන වේතනය අයදුම් පතෙහි සඳහන් කළ යුතුයි. තමා ගැන දන්නා දෙදෙනෙකුගේ නම් සඳහන් කළ යුතුය.

**සහතික පත්වල පිටපත් (මුලික පිටපත් නොවේ) ඉදිරිපත් කල යුතුය.**

අයදුම් පත් පහත දැක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ලියා පදිංචි කරන ලද තැපැලෙන් 1969 ජූලි මස 4 වෙනි දිනට ප්‍රථම හෝ එදිනට කොළඹ 5, තැ.පෙ. අංක 718, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

**ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ.** **අයදුම් පත්‍ර ලැබුන බව ද දන්වනු නොලැබේ.**

සභාපති.

ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය,
106, හැව්ලොක් පාර,
කොළඹ 5.

## උප ලේඛනය

### යතුරු ලියන්නාගේ ඇබෑර්තුව සඳහා අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————. 1969.6.1 දිනට නියමිත වයස :————.
4. ජාතිය :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. කලින් කළ රක්ෂාව :————.

| ස්වාමියාගේ නම | තනතුර භාරගත් දිනය | තනතුරෙන් අස්වූ දිනය | තත්ත්වය හා ලැබූ වේතන | සිංහල/දෙමළ යතුරු ලිවීමේ දැනීම |
|---|---|---|---|---|
| (අ) | | | | |
| (ආ) | | | | |
| (ඇ) | | | | |
| (ඈ) | | | | |
| (ඉ) | | | | |
| (ඊ) | | | | |
| (උ) | | | | |

7. තොරතුරු දැනගත හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනය :————.
   (අ) ————.
   (ආ) :————.
8. විශේෂ සුදුසුකම්/අයිතිවාසිකම් ඇත්නම් :————.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැලකිය යුතුයි.**—පහත සඳහන් අවශ්‍යතාවයන් අනුව පිටපත් (මුලික පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුයි.

(අ) උප්පැන්න සහතිකය/නොමැති නම් ඒ වෙනුවට දිවුරුම් පත්‍රයක්.

(ආ) අධ්‍යාපන සහතික.

(ඇ) මෑතක දී ලබාගන්නා ලද සහතික පත් 3 ක්.

(ඈ) කලින් කල වෘතිය සඳහා සහතික පත්.

6–846 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## මාතර දිස්ත්‍රික් උසාවිය

### (අනියම්) ඉංග්‍රීසි ලඝු ලේඛක තනතුර

මාතර දිස්ත්‍රික් උසාවියේ (අනියම්) ඉංග්‍රීසි ලඝු ලේඛක තනතුර සඳහා ඉල්ලුම් පත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම කැඳවනු ලැබේ.

මෙහි දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 ජූලි මස 10 වැනි දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙනසේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "(අනියම්) ඉංග්‍රීසි ලඝු ලේඛක තනතුර සඳහා ඉල්ලුම් පත" යන්න සඳහන් කළ යුතුය.

2. **වැටුප.**—දිනකට රු. 3.50 ක් හා දීමනා

3. **අවශ්‍ය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑම අයදුම් කරුවෙකුම සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) 1969.5.1 වැනි දිනට වයස අවුරුදු 18 ට නො අඩුවූ ද අවුරුදු 50 ට නො වැඩිවූද අයවිය යුතුය.

(ඇ) **අධ්‍යාපන සුදුසුකම්.**—භාෂාව, ලඝු ලේඛන යතුරු ලේඛනය, සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ

(ඈ) (1) සිංහල/දෙමළ භාෂාව,
(2) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය ගණිතය හෝ වාණිජ අංක ගණිතය,
(3) ලඝු ලේඛන යතුරු ලේඛනය, සහ
(4) තවත් විෂයයන් තුනකින් එක අවස්ථාවකදී විෂයයන් පහකට නො අඩුවෙන් ද, යටත් පිරිසෙයින් භාෂාව, ගණිත විෂයයක් සහ ලඝු ලේඛන යතුරු ලේඛනය, ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය ලබා ඇති ලංකා අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ), හෝ

(ඉ) ලංඩන් වාණිජ මණ්ඩලයේ ලංකා පරිපාටිය යටතේ ලබා ගත් වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ හෝ ලඝු ලේඛන යතුරු ලේඛන අංශය) හෝ උසස් වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකද (සාමාන්‍ය වාණිජ හෝ ලඝුලේඛක යතුරු ලේඛක අංශය), හෝ

(ඊ) ලංකා වාණිජ මණ්ඩලය සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිරිනමන ලද වාණිජ විද්‍යා අධ්‍යාපන සහතිකය (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝුලේඛන යතුරු ලේඛන කොටස) නැතහොත් උසස් වාණිජ විද්‍යා අධ්‍යාපන සහතික (සාමාන්‍ය වාණිජ විද්‍යා කොටස හෝ ලඝු ලේඛන යතුරු ලේඛන කොටස), හෝ

(උ) අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයයක් විසින් ප්‍රදානය කරන ලද වාණිජ සහතිකය හෝ උසස් වාණිජ සහතිකය (ලඝු ලේඛන යතුරු ලේඛනය සඳහා) යන මේවායින් එකක්.

(ඌ) **වේගය :—**

1. ලඝු ලේඛනය—මිනිත්තුවකට වචන 80 බැගින්,
2. පිටපත් කිරීම—මිනිත්තුවකට වචන 7 බැගින්,
3. යතුරු ලේඛනය—මිනිත්තුවකට වචන 30 බැගින් වේගයකින්, සහ

(එ) මනා චරිත ශුද්ධියකින් හා යහපත් ශාරීරික සෞඛ්‍යයකින් යුත් අයවිය යුතුය.

**4. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :—**
මෙම පත්වීම හුදෙක්ම අනියම් පදනමක් මත කරනු ඇත. ඊට භාණ්ඩාගාර චක්‍රලේඛ අංක : 682 සහ 685 හි සඳහන් විධිවිධානයන් බල නොපාන බවත් තෝරාගනු ලබන අයදුම්කරුට මෙම පත්වීම නිසා රජය හෝ වෙනයම් ආයතනයක් යටතේ ස්ථිර හෝ තාවකාලික රක්ෂාවක් ඉල්ලා සිටීමට විශේෂ හිමිකමක් නොමැති අතර මහා භාණ්ඩාගාරයේ "එක්ස්" ශාඛාවේ ලියා පදිංචි වීමට ඉල්ලා සිටීමට කිසිදු අයිතිවාසිකමක් නොලැබේ. තනතුරට ස්ථිර පත්වීමක් කළ පසු හෝ තෝරා ගනු ලබන අයගේ සේවාවන් තව දුරටත් අනවශ්‍ය වූ විට හෝ සේවය අවසන් කරනු ඇත.

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් වලට පහත දැක්වෙන සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය
(3) චරිතය පිළිබඳව මෑතදී ලබාගත් සහතික පත් තුනක්

(**සටහන.**—මෙම සහතික පත්වල පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. නියමිත වේලාවක හා ස්ථානයක දී අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ගමන් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

ඩී. ජී. එස්. ඩේවිඩ්,
මාතර දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

### ආදර්ශ අයදුම් පත

### (අනියම්) ඉංග්‍රීසි ලඝු ලේඛන තනතුර

1. සම්පූර්ණ නම:————.
2. දැනට ලිපිනය :————.
3. උපන් දිනය සහ 69.5.1 වැනි දිනට වයස :————.
4. ජාතිය :————.
5. පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙක් ද ? : ————.
6. විවාහකද ?, අවිවාහක ද යන බව :————.
7. දැනට රැකියාවක නියුක්ත නම් එය :————.
8. අධ්‍යාපන සුදුසුකම් :————.
9. වේගය : (1) ලඝු ලේඛනය :————.
   (2) යතුරු ලියනය :————.
10. විශේෂ සුදුසුකම් ඇත් නම් ඒ පිළිබඳ විස්තර :————.
11. චරිතය පිළිබඳ සහතික පත් ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

(අ)
(ආ)
(ඇ)

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් එයින් මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගත හොත් කිසිම වන්දියක් නොගෙවා මගේ සේවය අවසන් කිරීමට හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–780 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

### වැඩමූලික තනතුර (නැව් කාර්මික ශිල්පී)

රාජකීය ලංකා නාවික හමුදාවේ (සිවිල් අංශය) ඉහත සඳහන් වැඩමූලික තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 2,820 න් පටන් ගෙන රු. 120 වැඩිවීම් 9 කින් හා රු. 180 වැඩිවීම් 8 කින් රු. 5,340 තෙක් වැඩිවේ. රු. 3,900 පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. **අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය, භෞතික විද්‍යාව ඇතුලුව තවත් විෂයයන් තුනකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ලබන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) සහතිකය. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ප්‍රදානය කෙරුණු අවස්ථාවේදීම ගණිතය, භෞතික විද්‍යාව සහිතව සමත් නොවූයේ නම් ඉක්බිති කුමන හෝ අවස්ථාවක ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයකින් එම විෂයන්හි ලද සාමාර්ථ පිළිගනු ලැබේ.

(ii) වඩු වැඩ, ලෝහ තහඩු වැඩ, වෑල්ඩිං වැඩ, කම්හල් වැඩ, ඊයම් වැඩ සහ රිවෙට් කිරීම් ආදීවූ නැව් තැනීම හා අලුත් වැඩියා කිරීම සම්බන්ධ වෘත්තීන් පිළිබඳව පිළිගත් ඉංජිනේරු ආයතනය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු පහක ආධුනික කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම.

(iii) ඇවමය සහ වානේ යාත්‍රා අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 8ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබීම. ඇවමය සහ වානේ යාත්‍රා සෑදීම සම්බන්ධයෙන් මනා දැනුමක් හා නෞකා සහ වෙනත් යාත්‍රා වියලි තටාංගත කිරීමෙහිත් වියලි තටාකයෙන් දියත් මගට ගැනීමෙහිත් කෘතහස්ත භාවයක් තිබිය යුතුය. නැව් අලුත්වැඩියා කිරීමේදී උපයෝගී කෙරෙන සියලු උපකරණ විෂයෙහි ද නිපුණත්වයක් තිබිය යුතුය.

එසේ නැතහොත්,

(ආ) (i) ගණිතය භෞතික විද්‍යාව හෝ සාමාන්‍ය විද්‍යාව හෝ විෂයයන් වශයෙන් ඇතුව පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය හෝ මූලික පාඨශාලා හැර යාමේ විභාගය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පාසැලකින් පවත්වන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පාසැලක 8 වැනි පන්තිය නැත්නම් පාඨශාලා කණිෂ්ඨ පන්තිය සමත්ව සිටීම.

(ii) වඩුවැඩ, ලෝහ තහඩු වැඩ, වෑල්ඩිං වැඩ, කම්හල් වැඩ, ඊයම් වැඩ සහ රිවෙට් කිරීම් ආදී වූ නැව් තැනීම හා අලුත් වැඩියා කිරීම සම්බන්ධ වෘත්තීන් පිළිබඳ පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු පහක ආධුනික කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම.

(iii) ඇවමය සහ වානේ බඳ සහිත යාත්‍රා අලුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 10ක ප්‍රායෝගික පළපුරුද්ද ලබා තිබීම හා ඉන් යටත් පිරිසෙයින් අවුරුදු 8ක් කල් පරිපාලන ධුරයක් දරා සිටීම. ඇව සහ වානේ යාත්‍රා තැනීම දියත් මං නඩත්තු කිරීම සහ ක්‍රියා කරවීම පිළිබඳව මනා ඇනීමක් තිබිය යුතුවා මෙන්ම නැව් අලුත්වැඩියා කිරීමේදී උපයෝගී කෙරෙන සියලු උපකරණ විෂයෙහි ද නිපුණත්වයක් තිබිය යුතුය.

4. **අවශ්‍ය වෙනත් සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම්ද ලබා ඇති බවට සෑම අයදුම්කරුවෙක්ම සාක්ෂි සැපයිය යුතුය :—

(i) 1969 ජූලි 1 දිනට වයස අවුරුදු 18 නොඅඩු 45ට නොවැඩිවීම (දෙපාර්තමේන්තු සේවකයින් කෙරේ මෙම වයස් සීමාව බල නොපානු ඇත).

(ii) **යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍යයකින් සමන්විත වීම.**

5. **සේවා නියමයෝ :**

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ද සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගත් අයදුම්කරු කෙටිකාල දැන්වීමකින් රාජකාරි භාරගත යුතුවාක් මෙන්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටද සූදානම්ව සිටිය යුතුය. දැනට කොළඹ, ත්‍රිකුණාමලය, කරෙයිනගර් සහ කල්පිටිය යන ස්ථානයන්හි නාවික හමුදා ආයතනයන් පිහිටුවා ඇත.

6. **සේවා කොන්දේසි.**—තෝරා පත් කර ගනු ලබන අපෙක්ෂකයා රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව රාජ්‍ය සේවයේ නව ප්‍රවේශකයකු නම් :—

(i) පරිවාස කාලය අවුරුදු 3ක් වේ.

(ii) 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම විශේෂ කොට ඇතිව රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් මෙතෙක් පනවා ඇත්තාවූද, මතුවට පැනවිය හැකිවූද, සියලු ව්‍යවස්ථාවලට අවනත විය යුතුය.

(iii) පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාව විෂයෙහි පහත (iv) පරිදි දැනුම ලබා ගත යුතුය.

(iv) පරිවාස කාලය අවසාන සේවයෙහි ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර පත්වීමේ දිනයෙහි සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු 2ක් හා 3ක් ඇතුළත III වැනි ශ්‍රේණියේ රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතුය. නියමිත කාලසීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම් අත්හිටවීමට හේතුවේ. නියමිත කාල සීමාවෙන් පසු තවත් හය මසක් ඇතුළත පරීක්ෂණයන්ගෙන් සමත් නො වුවහොත් වැටුප් වැඩිවීම අත්හිට වීම, වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය වී පරීක්ෂණ සමත්වන තෙක් බලපැවැත්වේ.

(v) පරිවාස කාලය අවසානයෙහි රාජ්‍ය භාෂා විෂයෙහි නියමිත ප්‍රවීණතාවය ලබා නො ගතහොත් අංක 120 හා 121 වැනි පාලන රෙගුලාසි බලපැවැත්වේ.

(ඉහත දැක්වෙන අංක 3, 4 සහ 5 දරන කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගන්නන්ට අදාල වෙයි.)

7. ලංකාවේ පිහිටි එක්සත් රාජධානි කඳවුරු ආපසු ලංකාවට පවරා ගැනීම හේතුකොට ගෙන ලංකාවේ එක්සත් රාජධානි සේවාවන්හි නියුක්තව සිටි 1956 ජූලි 6 වැනිදා හෝ ඊට පසු දිනක අස්කරනු ලැබූ සිවිල් සේවකයන් වෙනුවෙන් පහත සඳහන් පහසුකම් සලසා තිබේ :—

(i) නියම කරන ලද උපරිම වයස් සීමාව තුළ සිටීමට ඉඩ ලැබෙන සේ ඔවුන්ගේ වයසෙන් එක්සත් රාජධානි හමුදා සේවා කාලය අඩු කිරීම.

(ii) **අධ්‍යාපනික සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය අවශ්‍ය සෑම අවස්ථාවකම කණිෂ්ඨයන් කණිෂ්ඨ පාඨශාලා සහතිකය අවශ්‍ය සෑම අවස්ථාවකම අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම 7 ප්‍රමාණයන් ලෙස සැලකීම.

(iii) **ආධුනික කාලය හා පළපුරුද්ද.**—ආධුනික කාලයක් අවශ්‍ය නැත. එහෙත් ඊට සරිලන සේ පළපුරුදු කාලය අවශ්‍ය ආධුනික කාලයට සමාන ප්‍රමාණයක්ම දීර්ඝ වියයුතුය.

8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්වලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඇමිණිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා රෙගුලාසි සඳහා නිකුත් කරනු ලබන සහතික භාර ගනු නො ලැබේ.)

(ii) ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම පිළිබඳ සහතිකය.

(iii) ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික.

(iv) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් චරිත සහතික සැපයීම අවශ්‍ය නොවේ.)

9. මෙම ගැසට් පත්‍රිකාවේ I කොටසේ (II) ඡේදයෙහි ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

10. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන් තම තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

11. කලින් ලත් පළපුරුද්ද සහ යෙදී සිටි රක්ෂාවල් පිළිබඳ විස්තර ඉල්ලා ඇති පරිදි මෙහි පහත සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ දක්වමින් කොළඹ තැ. පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරි වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ "වැඩමූලික නැව් කාර්මික ශිල්පී" තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය යන්න සඳහන් කර 1969 ජූලි 10 දිනට පෙර නාවික හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරී වෙත ඉල්ලුම්පත් එවිය යුතුය.

ඊ. ආර්. සමරසේකර,
සිවිල් පාලන නිලධාරි හා ගණකාධිකාරි,
නාවික හමුදාධිපති වෙනුවට.

1969 ජූනි මස
කොළඹ 1,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේදී ය.

## ආදර්ශ අයදුම්පත

### රාජකීය ලංකා නාවික හමුදාව

### වැඩ මූලික (නැව් කාර්මික ශිල්පී)

1. සම්පූර්ණ නම (ලොකු අකුරෙන්) :————.
2. ලිපිනය :————.
   (1) පුද්ගලික :————.
   (2) කාර්යාලීය :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. සිවිල් තත්ත්වය :————.
6. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග විෂයයන් සමග යොදන්න.) :————.
7. කාර්මික හෝ අනිකුත් සුදුසුකම් :————.
8. ආධුනික, අභ්‍යාස පරිපාටි, පළපුරුද්ද ආදියේ විස්තර :————.
9. පාසැලෙන් අස්වූවාට පසු යෙදුන රක්ෂාවල් සම්බන්ධ විස්තර :————.
10. චරිත සහතික ලබාගෙන ඉදිරිපත් කරන තිදෙනෙකුගේ නම් : ————.
    (i) :————.
    (ii) :————.
    (iii) :————.
11. අනිකුත් තොරතුරු :————.

මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති සියලු විස්තර සැබෑ බවත් නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙක් වන බවද තෝරා ගැනීමෙන් පසු යම් කිසි තොරතුරක් අසත්‍ය බැව් අනාවරණය වුව හොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත් වන බවද මම හොඳාකාර දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–789 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි තනතුර

ලංකා යුද හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ගනු ලබන අපේක්ෂකයා ලංකා යුද හමුදාවේ ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු අතර ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට ඇතුලත් කරනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරු 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයන්හි නියම කර ඇති පරිදි ඔහුගේ නිලයට අනුකූල වූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ලුතිනන් කර්නල් නිලය දක්වා ගෙවනු ලබන මූලික වැටුප් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වේ:

මේජර් නිලයට ඉහල උසස් කිරීම් තේරීම් අනුව වේ.

ලුතිනන් — වාර්ෂික වැටුප රු. 4,800 — රු. 180 වැඩිවීම් 2 සහ රු. 360 වැඩිවීම් 1 — රු. 5,580.

කපිතාන් — වාර්ෂික වැටුප රු. 6,660 — රු. 180 වැඩිවීම් 6 — රු. 7,740.

මේජර් — වාර්ෂික වැටුප රු. 8,820 — රු. 180 වැඩිවීම් 6 — රු. 9,900.

ලුතිනන් — කර්නල් — වාර්ෂික වැටුප රු. 12,105 — රු. 225 වැඩිවීම් 6 — රු. 13,455.

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

(i) නිලධාරීන් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සලසා නොමැති නිලධාරීන්ට, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසරදී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර, නේවාසිකාගාරයක ඉඩකඩ පහසුකම් ලබා දී ඇති නිලධාරීන්ට යුද හමුදා වියදමෙන් කෑම බීම් සපයනු ලබන අතර, ඔවුන්ට මෙම දීමනා අහිමි වේ.

(ii) සේවා හෝ රජයේ විවාහක නිවාසයක් ලබා දී නොමැති විවාහක නිලධාරියෙකුටත්, නේවාසිකාගාර ඉඩකඩ පහසුකම් හෝ ඔහුගේ පදවියට නියමිත විශේෂ නිවාසයක් ලබාදී නොමැති අවිවාහක නිලධාරියෙකුටත්, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව සහ නියමිත කොන්දේසි උඩ ගෙවල් කුලී දීමනා.

(iii) නේවාසිකාගාරය තුළ වාසය කිරීමට අණ ලැබ, නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබ, යුද හමුදා වියදමෙන් කෑම් බීම් සපයනු ලබන කාලපරිච්ඡේදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24 ක කාලයක් වෙනුවෙන් විවාහක නිලධාරියෙකුට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡේදයක් තුල ජීවනාධාර, විශේෂ ජීවනාධාර, යැපීම් සහ වෙනත් නවාතැන් ගාස්තු ගෙවනු නොලැබේ.

(iv) රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසි වලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ.

(v) 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිල ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) **ජාතිය.**—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස.**—ඉල්ලුම්කරුවන් 1969 ජූලි මස 4 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් ඔවුනට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම පිළිබඳ උපාධියක්, සහ

(ii) කෘෂිකර්ම පිළිබඳව අඩු වශයෙන් අවුරුදු 2 ක ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම් පත් තම අත් අකුරින් විය යුතු අතර, 1969 ජූලි මස 4 වැනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත් බහා ලන කවරයෙහි "යුද හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරාපත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබා ගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට, එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේ ය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥපති වෙනුවට.

1969 ජූනි මස 13 වැනි දින.

**ලංකා යුද්ධ හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය :————.
(ලාංකිකයෙකු වූයේ පෙළපතකින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න).

3. ලිපිනය :————.
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය :————.
1969 ජූලි මස 4 වැනි දිනට වයස :————.
අවුරුදු——, මාස :——, දින :——.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය, සහ දැන් ලිපිනය :————.
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහක ද ? අවිවාහකද ? :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේවාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙලෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.

12. ඔබගේ පාසැල් සමග විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුල්වූ දිනය :————.
අස් වූ දිනය :————.
සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය :———— දින සිට ———— දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–788 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

සහකාර අධ්‍යක්ෂ-පාලන තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—මාණ්ඩලික තත්ත්වයේ යටත් පිරිසෙයින් අවුරුදු 8 ක පළපුරුද්දක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව උපාධියක්, හෝ විධායක තත්ත්වයේ යටත් පිරිසෙයින් අවුරුදු 8 කට නොඅඩු සේවාවක් සහිතව රජයේ සේවාවේ හා/හෝ සංස්ථාවක අවුරුදු 20 ක සේවාවක්.

**වයස.**—අවුරුදු 30—45 දක්වා.

**වැටුප් ක්‍රමය.**— සියළු දීමනා සහිතව රු. 720—1200 (04 × 7—50 × 4). රු. 920ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 ජූලි 7 දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වෙත එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ '' සහකාර අධ්‍යක්ෂ, පාලන '' යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

එන්. ඩී. ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්

1969 ජූනි මස වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම්පත

#### ලංකා ගුවන් විදුලිය සංස්ථාව සහකාර අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා අයැදුම්පත

1. සම්පූර්ණ නම :————.
   (1) මුල් අකුරු සහිත නම(මහත්මයාද, මහත්මියද, මෙනවියද යනවග සඳහන් කරන්න)————.
   (2) ලිපිනය :————.
2. උපන් දිනය හා ස්ථානය :————.
   (1) 1969.7. දිනට වයස : අවුරුදු :————. මාස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).
3. ජාතිය :————.
4. අධ්‍යාපන හා පුහුණුවීම් :

| ඉගෙනීම ලැබූ පාසල් හා ආයතන | දිනසිට | දින දක්වා | සමත්වී ඇති විභාග | දරු වගකිවයුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|---|
| | | | | |

5. සමත් වී ඇති උසස්ම විභාගය :————.
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)
6. පළපුරුද්ද(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න.) :————.

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දිනසිට | දින දක්වා | අස්වීමට හේතුව |
|---|---|---|---|---|
| | | | | |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ව:—
   (1) :————.
   (2) :————.
   (3) :————.
8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ තනතුරු :————.
   (1) :————.
   (2) :————.
   (3) :————.
9. වෙනත් විස්තර :————.
10. මෙම අයදුම් පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලද පසුව එය හෙළිවුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

දිනය. :————

————
අයදුම්කරුගේ අත්සන,

-821—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල පහල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උතුරු ගිරුවා පත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

වලස්මුල්ල පහල උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නො වේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනීක හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායභීල, ග්‍රාම සේවක කායභීල, පළාත් පාලන ආයතන කායභීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායභීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිඬ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිඬ ස්ථාන සහ කායභීලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායභීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1969 ජූලි 23 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 ජූනි මස 5 වෙනි දින,
හම්බන්තොට,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

6-619—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### සුළු පරිපාලක පළමුවැනි ශ්‍රේණියේ ඕවර්සියර් තනතුර (යාන්ත්‍රික)—පිට වරාය—ගාල්ල

කොළඹ වරාය කොමිෂන් සභාවට අයත් ගාළු වරාය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඇති වී තිබෙන ඉහත සඳහන් තනතුර උදෙසා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව සකස් කරන ලද ඉල්ලුම් පත්, "වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය, යනුවෙන් ආමන්ත්‍රණය කොට, 1969 ජූනි මස 30 වැනි දින පස්වරු 4.30 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2. මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වසකට රු. 1,320—72—රු. 2,184 යි. රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතයි.

3. සෑම අයදුම්කරුවෙකුටම පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අවුරුදු 15 ට නො අඩු කාලයක් කාර්මිකයකු සහ පරිපාලකයකු වශයෙන් සේවය කරමින් යටත් පිරිසෙයින් අවුරුදු 7 ක පරිපාලකයකු වශයෙන් කම්කරුවන් 50 ස් දෙනෙකුට නො අඩු සංඛ්‍යාවක් පාලනය කර තිබීම සහ කාර්මිකයකු වශයෙන් පිළිගත් ආයතනයක අවුරුදු 5 ට නො අඩු කාලයක් සේවය කර සහතික ඉදිරිපත් කළ යුතුයි.

(ii) කණිෂ්ඨ ප්‍රමාණ සමත් වී සිටිය යුතුයි.

(iii) සැලැස්ම කියවා තේරුම් ගැනීමට හැකිවිය යුතු අතර වැඩ රාජකාරි සම්බන්ධ වාර්තා තබත්තු කිරීමට හැකිවිය යුතුයි.

(iv) සිවිල් ඉංජිනේරු වැඩ ස්ථානවල පාවිච්චි කරණ යාන්ත්‍රික යන්ත්‍රවලට අදාල එදිනෙදා අත්‍යවශ්‍ය අළුත්වැඩියා කිරීම් වැඩ හා යන්ත්‍ර උපකරණවල විශාල සහ සුළු බාධක සොයා ගැනීමට සහ එයට අනුකූල ප්‍රතිකර්ම ගැන දැනුමක් තිබිය යුතුයි.

(v) කර්මාන්ත ශාලාවල පාවිච්චි කරණ යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ ආයුධ, විදින කටු යන්ත්‍ර, පට්ටල් ආදියට අදාල රාජකාරිවල යෙදීම සහ වෑල්ඩින් වැඩ ගැන අවබෝධයක් තිබිය යුතුයි.

(vi) ලියවීමට, කියවීමට, සටහන් තබත්තු කිරීමට සහ කෙටි වාර්තා ලිවීමට දැනුමක් තිබිය යුතුයි.

(vii) වැඩ කටයුතු සඳහා පාවිච්චි කරණු ලබන බඩු බාහිරාදිය සහ ආයුධ ගැන වගකීම භාරගත යුතුයි.

(viii) වැඩ සම්බන්ධ චක්‍ර සහ සැලැස්ම කියවා තේරුම් ගෙන ඒ අනුව වැඩකරුවන්ට උපදෙස් දීමට හැකිවිය යුතුයි.

4. වයස අවුරුදු 29 ට වැඩිවිය යුතුයි.

5. සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලඟදී ලබාගත් චරිත සහතික.

(ඇ) 3 වැනි ඡේදයේ (i) සිට (vii) දක්වා ඇති පළපුරුදුකම් පිළිබඳ සහතික සහ අධ්‍යාපන සහතික.

6. අවශ්‍යවුවහොත් කෙටි දැන්වීමකින් පිට පළාත්වල වැඩට යැමට, නියමිත වේලාවෙන් පසු වැඩ කිරීමට සහ වෙනත් මුරෙන් මුර වැඩ කිරීමට ද බැඳී සිටිය යුතුයි.

7. ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම් පත් ලැබුණ බව ද දන්වනු නොලැබේ.

8. ඉල්ලුම් පත් හෝ මෙම තනතුර සම්බන්ධ එවන සෑම ලිපියක්ම ඉදිරිපත් කල යුත්තේ "වරාය කොමසාරිස් තැන, ඉංජිනේරු අංශය" කියා මිස, මෙම දෙපාර්තමේන්තුවේ වෙනයම් සෙසු නිලධාරියකුගේ පුද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

9. මෙයට අදාල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමු විය යුතුයි.

කේ. එස්. සී. ද ෆොන්සේකා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1969.6.9 දින.

#### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. පුද්ගලික ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි):————.
5. පළපුරුදුකම් පිළිබඳ විස්තර කෙටියෙන් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.
6. වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6-672—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### සැළසුම්කරු තනතුර—1 වන පන්තිය

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ, සැළසුම් ක්‍රියාත්මක අංශයේ 1 වන පන්තියේ සැළසුම්කරු තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර 1969 ජූලි මස 10 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය :—

රු. 3,900 කින් පටන්ගෙන රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 8 කින් රු. 5,340 දක්වා.

**සැ. යු.**—තෝරාගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සලකා බලා මූලික වැටුපට වැඩි වැටුපක් පටන් ගැනීමේ දී භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ගෙවිය හැකිය.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **යෝග්‍යතාවය.**—අයදුම්කරුවන් පහත සඳහන් එක් ගණයකට අයත් විය යුතුය—

(අ) රජයේ සේවයේ නියුක්ත රු. 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සමත්කොට ඇත්තාවූද, රු. 2,820 කට නොඅඩු වැටුපක් ලබන්නාවූද, 2 වන පන්තියේ සැළසුම්කරුවන්,

**හෝ**

(ආ) සැළසුම්කරුවන් විෂයෙහි උපදෙස් දීමට පත්කර ඇති අන්තර් දෙපාර්තමේන්තු මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන රු. 2,460 කට නොඅඩු II වන පන්තියේ සැළසුම්කරුවන්,

**හෝ**

(ඇ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ අවුරුදු 15 කට නො අඩු පළපුරුද්දක් ඇති සැළසුම්කරුවන්.

5. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ :—

(අ) මනා චරිතයකින් හා ශාරීරික සුව්පයකින් යුක්ත බව;

(ආ) 1969 ජූලි මස 10 දිනට වයසින් අවුරුදු 21 කට නොඅඩු හා අවුරුදු 40 කට නොවැඩි බව. (රජයේ සේවයේ නියුක්ත වුවන් සඳහා මෙම වයස් සීමාව බලපාන්නේ නැත);

(ඇ) (I) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපන සහතිකපත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළින් සාමාර්ථය ලබා සිටීම හෝ ඊට සමාන හෝ උසස් පරීක්ෂණයකින් සමත් වී තිබීම;

**සහ**

ඊට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම්වලින් **එකක්** තිබීම :—

(II) 1. ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පාඨමාලාව (සැළසුම්කරුවන්ගේ පාඨමාලාව) හෝ සම තත්ත්වයේ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 2 ක ආධුනික කාලය;

**හෝ**

2. ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලක වරුන්ගේ හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 1 ක ආධුනික කාලය;

**හෝ**

3. අවුරුදු 3 ක කාලයක් ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණීන්හි පස්වරු පන්තිවලට සහභාගී වී තිබීම සහිතව ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ

වරලත් ඉංජිනේරු හෝ වරලත් ගෘහනිර්මාණ ශිල්පීන් යටතේ අවුරුදු 4 ක නිත්‍ය ආධුනිකයකු වශයෙන් සේවය කර තිබීම ;

හෝ

4. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳව 2 වැනි පෙළ පරීක්ෂණය 1947 ට පෙර සමත් වී තිබීම.

6. අයදුම්කරුවන් විසින් තම අයදුම් පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක්. (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතිකපත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නො ලැබේ).

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික—කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(iii) ළඟදී ලබාගත් චරිත පිළිබඳ සහතික පත් 3 ක්.

7. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුළින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳවූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ජී. ජී. ඞී. එස්. පී. ගුණතිලක,
සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය :
සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. අංක 1322, කොළඹ 1.
12.6.69.

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### 1 වන පන්තියේ සැළසුම්කරුවකුගේ තනතුර සඳහා වූ අයදුම්පත් ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. තනතුර :————.
6. පත්වූ දිනය :————.
7. වැටුප (වාර්ෂික) :————.
8. අධ්‍යාපනික සුදුසුකම් (5 (ඇ) (1) ඡේදය යටතේ) :————.
9. කාර්මික සුදුසුකම් (5 (ඇ) (11) ඡේදය යටතේ) :————.
10. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.
11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.
12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත් නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–686/1—69.6.20 අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### සැළසුම්කරු තනතුරු, II වන පන්තිය

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශයේ II වන පන්තියේ සැළසුම්කරු තනතුරු 2ක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර 1969 ජූලි මස 10 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය : රු. 1,260න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින්වූ වැටුප් වර්ධක 21 කින් රු. 3,780 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මෙම තනතුරට හිමිය. රු. 2,820ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

**සැ. යු.**—තෝරාගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සළකා බලා මූලික වැටුපට වැඩි වැටුපක් පටන් ගැනීමේ දී භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ගෙවිය හැක.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත වේ. පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්කි ඉදිරිපත් කළ යුතුය :—

(අ) මනා චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බව,

(ආ) ඉල්ලුම්කරුවන් 1969 ජූලි 10 දිනට වයසින් අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි බව, (රජයේ සේවයේ නියුක්තවූවන් සඳහා මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) (i) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළින් සාමාර්ථය ලබා සිටීම සහ ඊට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් තිබීම.

(ii) 1. ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පාඨ මාලාවක් (සැළසුම්කරුවන්ගේ පාඨමාලාවක්) හෝ සම තත්ත්වයේ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 2ක ආධුනික කාලය ;

හෝ

2. ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන්ගේ හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම සහ අවුරුදු 1ක ආධුනික කාලය ;

හෝ

3. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය කිරීම සඳහා වූ සන්ධ්‍යා හෝ අර්ධකාලීන පාඨමාලාවේ විවිධ ශ්‍රේණිවල, (එනම්, I, II සහ III වැනි කොටස්) ත්‍රි වාර්ෂික සන්ධ්‍යා පන්ති අනුගමනය කර තිබීම සහ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් හෝ බලපත්‍රලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන්ගේ හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ අවුරුදු 4ක් අඛණ්ඩව ආධුනිකත්වයක් සේවය කර තිබීම. (මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 1,620ක් නොඉක්මවන වැටුප් පිය වරක් මත පත්කිරීම සඳහා සළකා බලනු ඇත.) ;

හෝ

4. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කර්මාන්තය II කොටසේ විභාගයෙන් 1947ට පෙර සමත්වී සැළසුම්කරුවකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ සමාගමක හෝ දෙවර්ෂය කට වැඩි කාල සීමාවක් සේවය කර තිබීම ;

5. ප්‍රසිද්ධ ඉංජිනේරුවන් හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවරුන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැළසුම්කරුවකු වශයෙන් පස් වර්ෂයක් සේවය කර තිබීම.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක් (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ).

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික—කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(iii) ළඟදී ලබාගත් චරිත පිළිබඳ සහතික පත් 3ක්.

6. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුළින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳවූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ජී. ජී. ඞී. එස්. පී. ගුණතිලක,
සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය :
සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. අංක 1322, කොළඹ 1.

12.6.69—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

### ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය II වන පන්තියේ සැළසුම්කරුවන්ගේ තනතුරු සඳහාවූ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.
6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිම වරට කළ රක්ෂාව : ————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. කාර්මික සුදුසුකම් (සමර්ථවූ විභාග සඳහන් කරන්න) : ————.
9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.
10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.
11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.
12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත් නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–686/2—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### මෙහෙයුම් අංශ සහායක තනතුර

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය යටතේ මෙහෙයුම් අංශ සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 ජූලි මස 10 දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය :— රු. 1,620න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වර්ධකවලින් රු. 3,780 දක්වා.

**සටහන :** තෝරාගත් අයදුම්කරු තනතුරෙහි ස්ථිර කිරීමෙන් පසුව ඔහු කලින් දැරූ පත්වීමේ වැටුපට වැටුප් වර්ධකයන් 5කට නොවැඩි වැටුප් තලයක් මත තබනු ඇත.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය.

4. **යෝග්‍යතාවය.**—ඉල්ලුම්කරුවන් සාමාන්‍ය ලිපිකරු සේවයේ සහ සමාන ලිපිකරු සේවාවල සාමාජිකයකු වියයුතු අතර, අඩු වශයෙන් රජය යටතේ අවුරුදු 10ක් සේවය කර තිබිය යුතුය.

**සටහන.**—යාන්ත්‍රික ඇඳීම පිළිබඳ දැනීමක් සහ සේයා ප්‍රොජෙක්ටර යන්, එපිඩියස්කෝප් ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර ආදිය ක්‍රියාකරවීමේ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

5. **වයස.**—ඉල්ලුම්කරුවන් 1969 ජූලි මස 10 දිනට අවුරුදු 30කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45කට නොවැඩි විය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ජී. ජී. ඩී. එස්. පී. ගුණතිලක,
සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

තැ. පෙ. 1322,
කොළඹ 1,
1969 ජූනි මස 12 දින.

### ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සැළසුම් ක්‍රියාත්මක අංශය

#### මෙහෙයුම් අංශ සහායක තනතුර සඳහා ආදර්ශ අයදුම්පත් ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට දරන තනතුර :————.
6. පත්වූ දිනය :————.
7. කලින් දරන පත්වීම් දින සහිතව :————.
8. වර්තමාන වැටුප :————.
9. වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–686/3—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### පොත් තබන්නන්ගේ තනතුර—II වන III වන ශ්‍රේණි

යථෝක්ත තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**III වන ශ්‍රේණිය.**—වැටුප් රු. 280—7×10—රු. 350 සියළු දීමනා ඇතුළු මාසික වේතනය.

**II වන ශ්‍රේණිය.**—වැටුප් රු. 345—7×15—රු. 450 සියළු දීමනා ඇතුළු මාසික වේතනය.

**සුදුසුකම් :**

(අ) **වයස.**—1969.7.15 දිනට අවුරුදු 20-30 අතර විය යුතුයි.

(ආ) **අධ්‍යාපනය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගය අංක ගණිතය/ වානිජ අංක ගණිතය සහ ගණාධිකරණය සහිත විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හෝ හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ උසස් සුදුසුකම්.

(ඇ) **පළපුරුද්ද.**—රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ සමාගමක පිළිවෙලින් III වන ශ්‍රේණියට අවුරුදු 3ක හා II වන ශ්‍රේණියට අවුරුදු 6 ක පළපුරුද්ද තිබිය යුතුයි.

**සේවා කොන්දේසි :**

(අ) මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුට මණ්ඩලීය අණ පනත් යටතේ අර්ථසාධක අරමුදලේ වරප්‍රසාද ලැබෙනු ඇත.

(ආ) පත්වීම මුල් වතාවට අවුරුදු 3 ක පරිවාසන කාලයකට යටත් වේ.

(ඇ) රජයේ භාෂා ප්‍රතිපත්තියට යටත් විය යුතු වේ.

(ඈ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පුල්මුඩේ හෝ චීනවරායේ අප කායර්‍යාලයන්හි සේවය කළ යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමටද සූදානම්ව සිටිය යුතුයි.

දැනට රජයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලයක හෝ සේවයේ නියුතු නිළධාරීන්ගේ අයදුම් පත් සිය ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, එම ඉල්ලුම් පත් සලකා බලනු ලබනුයේ 65.8.20 දින අංක 666 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයනට යටත්වය. 1969.1.9 ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අය මෙම දැන්වීමට අයදුම් පත් ඉදිරිපත් නොකළ යුතුයි. සියළුම අයදුම්කරුවන් විසින් අයදුම් කරනු ලබන ශ්‍රේණිය පැහැදිළිව අයදුම්පතේ සඳහන් කළ යුතුයි.

නියමිත ආකෘති පත්‍ර නොමැත. අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස, සිංහල භාෂා ප්‍රවීණතාව ඇතුළු වෙනත් අවශ්‍ය තොරතුරු සඳහන් ඉල්ලුම් පත්‍ර උප්පැන්න සහතිකයේත්, පළපුරුද්ද පිළිබඳ සහතික වලත්, ලඟදී ලබාගත් චරිත සහතික දෙකකත් පිටපත් ද අමුණා 1969 ජූලි 15 වැනිදාට හෝ ඊට පෙර, කොළඹ 7, 22/2, තර්ස්ටන් පාරේ, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතිනම් කායර්‍යාලයට පැමිණ භාර දිය යුතුයි.

සෝ. ඉගලහේවා,
ලේකම්/සේවක නිළධාරී,
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

22/2, තර්ස්ටන් පාර,
කොළඹ 7,
1969 ජූනි මස 10 දින.

6–853—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මනෝ වෛද්‍ය සේවාවේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුර සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍ර බාර ගැනීම 1969 ජූනි මස 30 වැනි දායින් අවසන් කෙරේ.

වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා පහත සඳහන් කොට ඇති අය වෙත ලියා විමසන්න. එසේ එවන ලිපි පහත අත්සන් කොට ඇති අයගේ පෞද්ගලික නමට ලියා නො එවිය යුතු ය.

ඩී. බී. ගුණසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1969 ජූනි මස 9 දින,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැපැල් පෙට්ටි අංකය 500,
ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලය,
කොළඹ 1.

6–652—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### II වැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුර

කොළඹ වරාය කොමිෂමේ මාස්ටර් ඇටෙන්ඩන්ට් නිලධාරිගේ අංශයේ II වැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුර සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ. මෙහි පහතින් දක්වෙන ආකෘතියට අනුකූලව සකස් කැරුණු ඉල්ලුම් පත් 1969 ජූලි මස 10 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ වරාය කොමිෂමේ නාවික අංශයේ වරාය කොමසාරිස් වෙත ලැබිය යුත්තේ ය. කිසිදු ඉල්ලුම්පතක් මෙම දෙපාර්තමේන්තුවේ කිසි නිලධාරියෙකු වෙත පෞද්ගලික වශයෙන් යොමු කෙරෙන පරිදි නො එවිය යුත්තේ ය.

2. **වැටුප.**—මෙම තනතුරට අදාල වූ වැටුප් පරිමාණය වාර්ෂික වශයෙන් රුපියල් 3,180—120 සහ 180—රු. 5,340 වන්නේ ය.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම ඉල්ලුම්කරුවකු විසින් ම තමන්—

(අ) 1969 ජූලි 10 වැනි දින වනවිට වයසින් අවුරුදු 25 ට නොඅඩු බැව් ද, අවුරුදු 45 ට නොවැඩි බැව් ද, (දැනටමත් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නිරත නිලධාරීන් කෙරෙහි මෙම වයස් සීමාව අදාල නොවේ.)

සහ

**(ආ) (ඉල්ලුම්කරු කොළඹ වරාය කොමිසමේ සේවකයෙකු නම්)—**

(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සාමාර්ථය ලැබුවකු බවත් (බෝට්ටු තැනීමේ හෝ අලුත්වැඩියා කිරීමේ හෝ නැව් අලුත්වැඩියා කිරීමේ හෝ වැඩ කටයුතු පිළිබඳව එසේ නැත හොත් වෘත්තු වැඩපලක, පරිපාලක තනතුරක් දරමින් බොහෝ කාලයක පළපුරුද්දක් දරන ඉල්ලුම්කරුවන්, මෙම තනතුර සඳහා නියමිත අනෙක් අවශ්‍යතාවයන් සපුරා ලනුයේ නම් අධ්‍යාපනික සුදුසුකම් මතුයේ සලකා බලනු ඇත.)

(2) පිළිගත් බෝට්ටු සෑදීමේ එසේ නැතහොත් නැව් අළුත්වැඩියා කිරීමේ කර්මාන්තාංගනයක එසේ නැතහොත් යාන්ත්‍රික ඉංජිනේරු වැඩපලක, වෘත්තිය රැකියාවකට අදාලව ආධුනික කාලයක් සපුරා ලීමෙන් පසු, එම වෘත්තිය පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා ඇති අතර, ඉන් **කොටසක්**, සුලු පරිපාලකයෙකු (බෝට්ටු හෝ නැව් අලුත්වැඩියා කිරීමේ කර්මාන්තාංගනයක නම් වඩා මැනවි) වශයෙන් සේවය කොට ඇති බැව් ද,

(3) යාත්‍රා නිර්මාණය කිරීමෙහිලා අදාලවන, නිර්මාණ කොටස්වල භාවිතය, ඒවා සවි කෙරෙන ස්ථාන පිළිබඳව පරිපූර්ණ දැනීමක් දරණ බැව් ද,

(4) තමන්ගේ භාරයට පවරනු ලබන නව නිර්මාණ කටයුතු, අළුත්වැඩියා කිරීම් හා යථා තත්ත්වයේ පවත්වාලීමේ කටයුතු පිළිබඳව වැය ප්‍රමාණ ඇස්තමේන්තු කිරීමටද, සැලසුම් සටහන් වටහා ගැනීමටද, තමන් වෙත පවරනු ලබන කටයුතු වලට අදාලව පරිමාණ සටහන් සකස් කිරීමටද, ආකෘති ආධාරයෙන්, යාත්‍රා කොටස් නිර්මාණය කිරීමෙහිලා පරිපූර්ණ දැනීමක් දරන බැව් ද,

(5) සේවකයන් විශේෂයෙන්ම පුහුණු සේවකයන් ලවා වැඩ කටයුතු කරවීමෙහි හා ඔවුන් පාලනයෙහි හැකියාවක් දරන බැව් ද,

එසේ නැතහොත්

**(ඇ) (ඉල්ලුම්කරු දෙපාර්තමේන්තුව මගින් පුහුණු කළ අයෙකු නම්)—**

(1) භෞතික විද්‍යාව හා ගණිතය විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ හා අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් බැව් ද,

(2) නියමිත පුහුණු කිරීමේ පරිපාටියකට අනුකූලව රජයේ වැඩපලක අවුරුදු 5 ක් විශේෂ ආධුනිකත්වයක් සම්පූර්ණ කොට ඇති බැව් ද,

(3) ඉහතකී ආධුනික කාලය තුළදී, රජයේ කාර්මික විද්‍යාලයේ අවුරුදු 3, යාන්ත්‍රික ඉංජිනේරු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බැව් ද,

(4) අවුරුදු 5 ක ආධුනික කාලය අවසානයේ දී පැවති දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත්ව ඇති බැව් ද,

(5) රජයේ දෙපාර්තමේන්තුවකට සම්බන්ධ වැඩපලක **I වැනි ශ්‍රේණියේ සුලු** පරිපාලකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් එක් අවුරුද්දකවත් සේවයක් සම්පූර්ණ කොට ඇති බැව් ද,

(6) යාත්‍රා නිර්මාණය කිරීමෙහිලා අදාලවන, නිර්මාණ කොටස්වල භාවිතය, ඒවා සවි කෙරෙන ස්ථාන පිළිබඳව පරිපූර්ණ දැනීමක් දරන බැව් ද,

(7) තමන්ගේ භාරයට පවරනු ලබන නව නිර්මාණ කටයුතු, අලුත්වැඩියා කිරීම හා යථා තත්ත්වයේ පවත්වාලීමේ කටයුතු පිළිබඳව වැය ප්‍රමාණ ඇස්තමේන්තු කිරීමටද, සැලසුම් සටහන් වටහා ගැන්මටද, තමන් වෙත පවරනු ලබන කටයුතු වලට අදාලව පරිමාණ සටහන් සකස් කිරීමටද ආකෘති ආධාරයෙන්, යාත්‍රා කොටස් නිර්මාණය කිරීමෙහිලා පරිපූර්ණ දැනීමක් දරන බැව් ද,

(8) සේවකයන් විශේෂයෙන්ම පුහුණු සේවකයන් ලවා වැඩ කටයුතු කරවීමෙහි හා ඔවුන් පාලනයෙහි හැකියාවක් දරන බැව් ද,

එසේ නැතහොත්

**(ඈ) ඉල්ලුම්කරු රජයේ පුහුණු කිරීමේ පරිපාටියකට බාහිර වූවෙකු නම්—**

(1) පිළිගත් ඉංජිනේරු ආයතනයක එසේ නැතහොත් රජයේ දෙපාර්තමේන්තුවක ෆෝර්මන් ශ්‍රේණියේ සේවය කරන්නකු බැව් ද,

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථය ලද්දකු බැව් ද,

(3) ආධුනික කාලයද ඇතුළුව අවුරුදු 15 ක පළපුරුද්දක් ලැබ ඇති අතර, ඉන් අවුරුදු 8 කට නොඅඩු කාලයක් පරිපාලන තනතුරක සේවය කර ඇති බැව් ද,

(4) තමා යහපත් චරිතයක් හා ශාරීරික සෞඛ්‍යයක් දරන බැව් ද,

(5) යාත්‍රා නිර්මාණය කිරීමෙහිලා අදාලවන, නිර්මාණ කොටස්වල භාවිතය, ඒවා සවිකෙරෙන ස්ථාන පිළිබඳව පරිපූර්ණ දැනීමක් දරන බැව් ද,

(6) තමන්ගේ භාරයට පවරනු ලබන නව නිර්මාණ කටයුතු, අලුත්වැඩියා කිරීම් හා යථා තත්ත්වයේ පවත්වාලීමේ කටයුතු පිළිබඳව වැය ප්‍රමාණ ඇස්තමේන්තු කිරීමටද, සැලසුම් සටහන් වටහා ගැන්මට ද, තමන් වෙත පවරනු ලබන කටයුතුවලට අදාලවන පරිමාණ සටහන් සකස් කිරීමටද, ආකෘති ආධාරයෙන්, යාත්‍රා කොටස් නිර්මාණය කිරීමෙහිලා පරිපූර්ණ දැනීමක් දරන බැව් ද,

(7) සේවකයන් විශේෂයෙන්ම පුහුණු සේවකයන් ලවා වැඩ කටයුතු කරවීමෙහි හා ඔවුන් පාලනයෙහි හැකියාවක් දරන බැව් ද,

සතුටුදායක පරිද්දෙන් සනාථ කළ යුත්තේ ය.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත දැක්වෙන සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම ඉල්ලුම් පත්‍රවලට අමුණා ඉදිරිපත් කළ යුත්තේ ය :—

(අ) උප්පැන්න සහතිකය (**සැලකිය යුතුයි.**—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා වලට අදාල රෙගුලාසි මාලාවේ අභිලාශයන් සඳහා නිකුත් කැරුණු උප්පැන්න සහතිකය හෝ භාරගනු නොලැබේ.)

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය.

(ඇ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය හා තනතුර සඳහා ඔහුගේ යෝග්‍යතාව දැක්වෙන පරිදි වූ මෑතදී ලබා ගැනුණු සහතික තුනක්.

**සැලකිය යුතුයි.**—මෙම සහතික පිටපත් ආපසු ඉල්ලුම්කරුවන් වෙත නොඑවේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුලින්ම ප්‍රසිද්ධ කොට ඇති, රජයේ සේවයේ තනතුරු වලට පත්කිරීම් වලට අදාල සාමාන්‍ය කොන්දේසි කියවා බැලීම මැනවි.

ජී. ඕ. හෙන්ඩ්‍රිකස්,
වරාය කොමසාරිස් වෙනුවට.

1969 ජූනි මස 12 දින,
කොළඹ 1.
වරාය කොමිෂන් සභා කාර්‍යාලයයේදී ය.

## කොළඹ වරාය කොමිසම

### II වැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුර සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. නම සම්පූර්ණ වශයෙන් :————.
(පැහැදිලි අකුරින්)
2. ස්ථිර ලිපිනය :————.
3. වයස හා උපන් දින :————.
(උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතු ය.)
4. ජාතිකත්වය හා එය ලබාගත්තේ කෙසේ ද යනවග :————
5. (අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තාගේ :————.
(ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මීමුත්තාගේ :————.
(උපන් ස්ථාන)
(ඉල්ලුම්කරු හා ඔහුගේ පියා යන දෙදෙනාම ලංකාවේ ඉපිද ඇත්තේ නම් (අ) හා (ආ) පමණක් පිරවිය යුතුය. ඉල්ලුම්කරු හෝ ඔහුගේ පියා හෝ ලංකාවෙන් පිටත දී ඉපිද ඇත්තේ නම්, (අ), (ආ), (ඇ), (ඈ) යන සියල්ලම පිරවිය යුතු ය.)
6. විවාහක ද අවිවාහක ද යනවග :————.
7. ඇත්වීමෙන් අවශ්‍ය ඇති අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණන්න.)
8. උගත්තේ කොහිද යනවග හා ඉන් ඉවත්වූයේ කවදා ද යනවග :————.
9. වෘත්තීය හා/එසේ නැතහොත් කාර්මික සුදුසුකම් :————.
10. පාසලින් අස්වූවාට පසු තමන් විසින් දරන ලද රැකියාවන් ඒ සේවා පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව :————.
11. කිසි සන්නද්ධ සේවයක සේවය කර ඇත්තේ ද, එසේ නම්, ඒ සේවයන් පිළිබඳ විස්තර :————.
12. වර්තමාන රැකියාව හා ලබන වැටුප :————.
13. යාත්‍රා නිර්මාණය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද සවිස්තරව : ————.
14. කම්කරුවන් පාලනය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද සවිස්තරව :————.
15. සිංහලයෙන් හා දෙමළෙන් ඔබට කථා කළ හැක්කේ ද :————
16. විශේෂයෙන් දැන්විය යුතු කිසි කරුණක් වේ නම් ඒවා : ————.
17. චරිත සහතික ලබා ගැනුනු අයගේ නම් හා තනතුරු :————.
(ඒ සහතික වල පිටපත් අමුණන්න.)

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් දක්වා ඇති විස්තර සත්‍ය බවටත්, නිවැරදි බවටත් මම මින් සහතික කරමි. මෙහි සඳහන් කැරුණු කිසියම් කරුණක් අසත්‍ය යයි, සාවද්‍ය යයි පිළිගනු ලැබුව හොත්, ඒ වරද සොයා ගැනුනේ මා තෝරා ගැනීමට කලින් නම්, මා අපේක්ෂකයෙකු වශයෙන් නුසුදුස්සෙකු යි නිගමනය කරනු ලැබීමටද, ඒ වරද සොයා ගැනුනෙන් මා තනතුරට පත් කරනු ලැබීමෙන් පසුව නම් කිසියම් වන්දි ගෙවීමක් රහිතව සේවයෙන් පහ කරනු ලැබීමට ද මා යටත් වන බැව් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–767 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා සංචාරක මණ්ඩලය

**ලංකා හෝටල් පාසැලේ තුන් අවුරුදු සාමාන්‍ය කෑම සැපයීමේ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමට සිසුන් ඇතුළත් කර ගැනීම අයදුම්කරුවන් තෝරා ගැනීමේ සාමාන්‍ය කොන්දේසි :**

1. **වයස :**

1.7.69 ට අවුරුදු 18—21 විය යුතුය.

2. **අධ්‍යාපනික සුදුසුකම් :**

(අ) වාර දෙකකට නොවැඩි ගණනක දී, අ. පො. ස. (සාමාන්‍ය) පරීක්ෂණයේ විෂයයන් හයකින් සමත් විය යුතුය.

(ආ) ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යා විෂයයන්ගෙන් සමත් වී ඇති අයැදුම්කරුවනට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) සිංහල සහ/හෝ දෙමළ භාෂාව කථා කිරීමේ සහ ලිවීමේ මනා දැනුමක් අවශ්‍ය වේ.

(ඈ) ප්‍රංශ හෝ ජර්මන් භාෂාව පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. අයැදුම්කරුවන් ලාංකික පුරවැසියන් විය යුතුය.

4. අයැදුම්කරුවන් විසින් උප්පැන්න සහ චරිත සහතික දෙකක (2) පිටපත් ඉදිරිපත් කළ යුතුය.

5. ඉගැන්වීමේ ගාස්තුව සහ ප්‍රායෝගික පුහුණුව සඳහා ගාස්තු අය නොකෙරේ.

6. තෝරාගත් අයදුම්කරුවන් 1969 ඔක්තෝබර් මස සිට හෝටල් පාසැලේ නේවාසිකාගාරයේ නවාතැන් ගැන්ම අපේක්ෂා කෙරේ.

7. තෝරාගත් අපේක්ෂකයා නේවාසිකාගාරයේ නවාතැන් ගන්නා කාලය තුළදී, කෑම, බීම, ඉඳුම් හිටුම් යනාදිය සඳහා මසකට රු. 100ක මුදලක් ගෙවිය යුතුය.

තවද තෝරාගත් අපේක්ෂකයා විසින් :—

(අ) ලියාපදිංචි කිරීමේ ගාස්තු රු. 25.00.

(ආ) කැඩුම් බිඳුම් සඳහා තැන්පත් මුදල රු. 30.00.

(ඇ) ඇඳුම් මැසීමේ ගාස්තු රු. 70.00 ක් පමණ.

(ඈ) මූලික උපකරණ සඳහා ගාස්තු 30 ක් පමණ.

ගෙවිය යුතුවේ.

8. පාඨමාලාව සතුටුදායක ලෙස හදාරා අවසන් වූ සහ අවශ්‍ය පරීක්ෂණ සමත් වීමෙන් පසු, පාසැල විසින් අයදුම්කරුවනට සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

9. දැනට මෙම පාඨමාලාව විවෘතව ඇත්තේ පිරිමි අයැදුම්කරුවනට පමණි.

10. තෝරාගත් අපේක්ෂකයිනට සේවය කිරීමේ පුහුණුවක් ලබා දෙන අතර, හෝටල පාසැල විසින් එයට ගාස්තුවක් නොගෙවනු ලැබේ.

11. (අ) අයැදුම්කරුවන් විසින් ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "සාමාන්‍ය කෑම සැපයීමේ පාඨමාලාව" යැයි සටහන් කළ යුතුය.

(ආ) තෝරාගත් අපේක්ෂකයා විසින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුවේ.

12. මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍රවල මෙම අයැදුම් පත සකස් කර එවිය යුතුය.

13. ආකෘතිපත්‍ර තැපෑලෙන් ලබා ගැනීමට කැමැත්තක් දක්වන අයැදුම්කරුවන්, තම නම සහ ලිපිනය සඳහන්, මුද්දරයක් සහිත දිගු ලියුම් කවරයක් එවිය යුතුය.

14. අයැදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 1969 ජූලි 27 වේ.

**15. අපේක්ෂකයින් තෝරා ගැනීමේදී ඔවුන් විසින් කරනු ලබන කුමන අන්දමේ බලපෑමක් වුවද ඉල්ලුම්පත අයෝග්‍යවීමට හේතුවේ.**

විද්‍යාලයාධිපති,
ලංකා හෝටල් පාසැල.

ලංකා හෝටල් පාසැල,
25, ගාලු මුවදොර මැද පාර,
කොළඹ 2.

6–866 — 69.6. 20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : 1/23/4/13 (ජී)

## සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂාවන් හා ගිණුම් පිළිබඳ පරීක්ෂණය—1969 පෙබරවාරි

සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ පහත නම් සඳහන් අයදුම්කරුවන් 1969 පෙබරවාරි මස 23 වැනි දින පවත්වන ලද සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ 'සී' උපග්‍රන්ථයේ නියම කොට ඇති පරීක්ෂණයේ දී ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති විෂයයන් ගෙන් සමත් වී ඇති බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | දෙපාර්තමේන්තුව | විෂය |
|---|---|---|
| අදිකාරි, ච. | වන සත්ව | ගිණුම් |
| අදිකාරි, ස. | විභාග | ගිණුම් |
| අන්තෝනිපිල්ලෙයි, ෆ්‍රෙ, ෆ්‍රා. | මහෙස්ත්‍රාත් උසාවිය, යාපනය | ගිණුම් |
| අබ්දුල් රහිම්, මො. සු. මො. | පළාත් පාලන අමාත්‍යාංශය | දෙමළ (බී) |
| අබේරුවන්, කු. අ. නි. ජ. | සෞඛ්‍ය | ගිණුම් |
| අබේසිංහ, ක. ආ. | කච්චේරිය, කුරුණෑගල | ගිණුම්, සිංහල (ඒ), සිංහල (බී) |
| අභයවර්ධන, ජ. අ. මු. පි. | ආනයන හා අපනයන පාලන | ගිණුම් |
| අමරතුංග, බෙ. ආ. | අලෙවිකිරීමේ | සිංහල ඒ සහ බී |
| අමරවංශ, ලො. දෙ. ඩැ. | සමාජ සේවා | ගිණුම් |
| අරුන්තවවෙල්වම්, මු. වෙ. | රෙජිස්ට්‍රාර් ජනරාල් | දෙමළ ඒ සහ බී |
| ආනන්ද, මු. | රජයේ වැඩ | දෙමළ ඒ සහ බී |
| ආරියපාල, කා. ත. | කච්චේරිය, හම්බන්තොට | ගිණුම් |
| උභයරත්න, වී. වී. | ඉඩම් සංවර්ධන | ගිණුම් |
| එදිරිසූරිය, මෙ. | කච්චේරිය, මාතර | ගිණුම් |
| ඒකනායක, ගු. බ. | කෘෂිකර්ම | ගිණුම් |
| ඒකනායක, මු. ක. | මැතිවරණ | සිංහල ඒ සහ බී |
| කන්දසාමි, සු. | කච්චේරිය, මඩකලපුව | දෙමළ (බී) |
| කනගලිංගම්, ස. | කච්චේරිය, යාපනය | දෙමළ ඒ සහ බී |
| කනගසභාපති, සෙ. | වාරිමාර්ග | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| කනේසු, සෝ. | රජයේ වැඩ | ගිණුම් |
| කරුණාරත්න, ර. කො. ලො. ද ලි. | ලංකා මහ කොමසාරිස් කාර්යාලය, පකිස්තානය | ගිණුම් |
| කරුණාරත්න, රු. දේ. | කච්චේරිය, අනුරාධපුරය | ගිණුම් |
| කලන්සූරිය, උ. | කච්චේරිය, රත්නපුර | ගිණුම් |
| කළුආරච්චි, වි. නෝ. | සෞඛ්‍ය | ගිණුම් |
| කුමාරසිංහ, ර. | කම්කරු | ගිණුම්, සිංහල ඒ සහ බී |
| කුමාරසිරි, දේ. පි. | කච්චේරිය, ගාල්ල | ගිණුම් |
| කුමාරසිරි, ව. අ. | මහා භාණ්ඩාගාරය | ගිණුම් |
| කුරුප්පු, දෙ. ඩෙ. නා. | කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය | සිංහල (ඒ) |
| කොහොවල, සී. | අධ්‍යාපන ,ගම්පහ | ගිණුම් |
| ගනේෂ්, ක. | කච්චේරිය, අනුරාධපුරය | ගිණුම් |
| ගෆූර්, පි. මො. අ. | සෞඛ්‍ය | දෙමළ ඒ සහ බී |
| ගවරතැන්න, ප්‍රෙ. | කච්චේරිය, මාතලේ | ගිණුම් |
| ගුණතිලක, හේ. ප. | කච්චේරිය, කුරුණෑගල | සිංහල ඒ සහ බී |
| ගුණම්, ක. | දේශීය ආදායම් | ගිණුම් |
| ගුණරත්න, ප. රා. | කම්කරු | සිංහල ඒ සහ බී |
| ගුණවර්ධන, බ. ආ. කැ. | අධිකරණ සේවා කොමිෂන් සභාව | සිංහල ඒ සහ බී |
| ගුණවර්ධන, ලි. ආ. | අධ්‍යාපන, කෑගල්ල | ගිණුම් |
| ගුණසිංහ, ප. ලි. | සමාජ සේවා | ගිණුම් |
| චන්ද්‍රසේකර, ව. මු. ස. | අධ්‍යාපන, කුරුණෑගල | ගිණුම් |
| චන්ද්‍රසේකර, ජා. | අලෙවිකිරීමේ | ගිණුම්, සිංහල ඒ සහ බී |
| ජයරත්න, හ. ආ. නි. | කච්චේරිය, රත්නපුර | ගිණුම් |
| ජයතිලක, තෙ. මු. | කච්චේරිය, බදුල්ල | ගිණුම්, සිංහල ඒ සහ බී |
| ජයවීර, සේ. | රජයේ වැඩ | සිංහල ඒ සහ බී |
| ජයසිංහ, ම. ආ. | ආහාර පාලන | සිංහල ඒ සහ බී |
| ජයසිංහ, සී. | රජයේ වැඩ | ගිණුම්, සිංහල ඒ සහ බී |
| ජයසිංහ, හ. හ. | අධ්‍යාපන, ගම්පහ | ගිණුම් |
| ජයසූරිය, එ. | රබර් පාලන | ගිණුම්, සිංහල ඒ සහ බී |
| ජිනදාස, අ. | ආහාර පාලන | සිංහල ඒ සහ බී |
| ජිනදාස, ක. ප. | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන | සිංහල ඒ සහ බී |
| ජිනසේන, සා. ක. | අධිකරණ අමාත්‍යාංශය | සිංහල ඒ සහ බී |
| ටිකිරිබණ්ඩා, තෙ. මු. ඥ. | කච්චේරිය, කුරුණෑගල | ගිණුම් |
| ඩයස්, දෙ. වෝ. නි. | සෞඛ්‍ය | ගිණුම් |
| තනබාලසිංගම්, නා. | කෘෂිකර්ම | දෙමළ (ඒ) |
| තංගරාජා, ස. | අධ්‍යාපන, යාපනය | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| තිරුණාවුකරසු, ක. | කෘෂිකර්ම | දෙමළ ඒ සහ බී |
| තිලකරත්න, චි. ප්‍රෙ. | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ | සිංහල ඒ සහ බී |
| තුරෙයිරාජා, ස. ජේ. | අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය | ගිණුම් |
| තෙන්නකෝන්, තෙ. මු. ස. වි. | ආහාර | ගිණුම්, සිංහල ඒ සහ බී |
| තොටවත්ත, දො. ෂෙ. | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන | සිංහල ඒ සහ බී |
| ත්‍යාගරාජා, මු. | කච්චේරිය, යාපනය | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| ද අල්විස්, හ. ක. ච. | තක්සේරු | ගිණුම් |
| ද කුරුකුල, කු. ඇ. සු. | සෞඛ්‍ය | ගිණුම් |
| දයානන්ද, ජ. ප්‍රෙ. | මහෙස්ත්‍රාත් උසාවිය, කුලියාපිටිය | ගිණුම්, සිංහල ඒ සහ බී |
| දසනායක, සේ. මු. | කච්චේරිය, කුරුණෑගල | ගිණුම්, සිංහල ඒ සහ බී |
| දිසානායක, වී. | දේශීය ආදායම් | ගිණුම් |
| ධනපාල, ග. ලි. | ජාතික නිවාස | ගිණුම් |
| ධර්මදාස, ර. මු. | මහා භාණ්ඩාගාරය | සිංහල ඒ සහ බී |
| ධර්මදාස, හේ. මු. | අලෙවි | සිංහල ඒ සහ බී |
| ධීරසේකර, වී. ද සි. | වාරිමාර්ග | සිංහල ඒ සහ බී |
| නිත්‍යානන්දවේල්, සී. | රජයේ රස පරීක්ෂණ | ගිණුම් |
| නිශ්ශංක, ර. ගෙ. පි. | වාරිමාර්ග | සිංහල ඒ සහ බී |

| නම | දෙපාර්තමේන්තුව | විෂය |
|---|---|---|
| පලිහේන, ජෝ. හෙ. | සමාගම් රෙජිස්ට්‍රාර් | ගිණුම් |
| පාලිතරත්න, සෙ. න. | රෙජිස්ට්‍රාර් ජනරාල් | සිංහල ඒ සහ බී |
| පියදස, ප. ක. | දේශීය ආදායම් | ගිණුම් |
| පියසේන, වි. | අධ්‍යාපන, කළුතර | ගිණුම් |
| පෙරේරා, තු. දෙ. ව. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | ගිණුම් |
| පෙරේරා, කු. එ. සෙ. | රජයේ වැඩ | සිංහල ඒ සහ බී |
| පෙරේරා, කු. ජෝ. බෙ. | ප්‍රවාහන අමාත්‍යාංශය | ගිණුම් |
| පෙරේරා, ම. සි. නෙ. | රජයේ වැඩ | සිංහල ඒ සහ බී |
| ජේමවර්ධන, ප. ආ. | අලෙවි කිරීමේ | ගිණුම් |
| ප්‍රැන්සිස්, අ. දෙ. | ආහාර පාලන | සිංහල ඒ සහ බී |
| ප්‍රෑටනිට්, ම. ක්‍රි. ඩ. | ගණන් පරීක්ෂණ | ගිණුම් |
| බණ්ඩාර, වි. අ. මු. ක. | සමුපකාර සංවර්ධන | සිංහල ඒ සහ බී |
| බුද්ධදස, ව. | සමාජසේවා අමාත්‍යාංශය | ගිණුම්, සිංහල ඒ සහ බී |
| බුසෝ, ර. න. අ. | කච්චේරිය, කළුතර | පහළ දෙමළ ඒ සහ බී |
| බෙරුගොඩ, බෙ. ආ. නි. | කච්චේරිය, කළුතර | ගිණුම් |
| බෝගහවත්ත, මී. ලො. | වාරිමාර්ග | සිංහල ඒ සහ බී |
| මඩුගල්ල, ම. ව. අ. බ. | විභාග | ගිණුම් |
| මනතුංග, මැ. ති. | සෞඛ්‍ය | සිංහල ඒ සහ බී |
| මයිල්වාගනම්, වෙ. | කච්චේරිය, ත්‍රිකුණාමලය | ගිණුම් |
| මාණික්කවාසගර්, වී. | ගණන් පරීක්ෂණ | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| මැදවැව, මැ. ගෙ. සු. | ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු | සිංහල ඒ සහ බී |
| රගුනාතපිල්ලෙයි, සි. | කච්චේරිය, වවුනියාව | ගිණුම්, දෙමළ (බී) |
| රණතුංග, ගු. ස. | කෘෂිකර්ම | ගිණුම් |
| රණවීර, වි. ච. සු. ආ. | රජයේ වැඩ | සිංහල ඒ සහ බී |
| රත්නම්, සෝ. ච. | රෙජිස්ට්‍රාර් ජනරාල් | ගිණුම් |
| රත්නසිංහම්, අ. | සෞඛ්‍ය | දෙමළ ඒ සහ බී |
| රාජපක්ෂ, පි. | පළාත් පාලන අමාත්‍යාංශය | සිංහල ඒ සහ බී |
| රූපසිංහ, රූ. සු. ර. | අලෙවි කිරීමේ | ගිණුම්, සිංහල ඒ සහ බී |
| ලියනගේ, ඩේ. | කච්චේරිය, මාතර | ගිණුම් |
| වනිසේකර, ක. බ. | ගණන් පරීක්ෂණ | ගිණුම් |
| වල්පිට, ඩේ. | ස්වදේශ අමාත්‍යාංශය | සිංහල ඒ සහ බී |
| වික්ටර්, සේ. දෙ. තො. | දේශීය ආදායම් | ගිණුම් |
| වික්‍රමසිංහ, දෙ. මා. | කෘෂිකර්ම | ගිණුම් |
| විජේකෝන්, අ. වි. මු. මැ. බ. | ස්වදේශ අමාත්‍යාංශය | සිංහල ඒ සහ බී |
| විජේසේකර, ව. මා. | පොලිස් | සිංහල බී |
| විතානවසන්, ච. | රජයේ වැඩ | ගිණුම් |
| විනායගමූර්ති, ස. | කච්චේරිය, යාපනය | ගිණුම් |
| විමලසේන, ජී. | කච්චේරිය, කෑගල්ල | සිංහල ඒ සහ බී |
| විල්ප්‍රඩ්, අ. හැ. | කච්චේරිය, ගාල්ල | ගිණුම් |
| විල්සන්, අ. දෙ. | දේශීය ආදායම් | සිංහල ඒ සහ බී |
| වීරවර්ධන, ජේ. | කච්චේරිය, කෑගල්ල | ගිණුම් |
| වේලුම්මයිලුම්, න. | අධ්‍යාපන, යාපනය | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| සමරනායක, න. ප. | කච්චේරිය, පොළොන්නරුව | ගිණුම් සිංහල (ඒ) |
| සමරවික්‍රම, මා. වි. හේ. ස. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | සිංහල ඒ සහ බී |
| සමරවීර, නි. ධ. | කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය | ගිණුම් |
| සරත්චන්ද්‍රදස, ආ. ප. | කච්චේරිය, ගාල්ල | සිංහල ඒ සහ බී |
| සාලි, හ. මො. | මහා භාණ්ඩාගාරය | සිංහල ඒ සහ බී |
| සින්නදුරෙයි, සෙ. | මහා භාණ්ඩාගාරය | දෙමළ ඒ සහ බී |
| සිරිපාල, මා. දෙ. | සමාගම් රෙජිස්ට්‍රාර් | ගිණුම්, සිංහල ඒ සහ බී |
| සිරිවර්ධන, ධ. | වාරිමාර්ග | සිංහල ඒ සහ බී |
| සිරිසේන, ආ. සෝ. | පළාත් පාලන අමාත්‍යාංශය | සිංහල ඒ සහ බී |
| සිරිසේන, කා. තැ. ගො. | කච්චේරිය, ගාල්ල | ගිණුම් |
| සිල්වා, ස. රි. | විභාග | ගිණුම් |
| සිල්වා, ස. ම. සු. | කච්චේරිය, මොනරාගල | ගිණුම් |
| සිල්වා, සු. ආ. ල. | ගොවිජන සේවා | ගිණුම් |
| සිවපාතම්, ක. | ගොවිජන සේවා | ගිණුම්, දෙමළ ඒ සහ බී |
| සිවරාජා, ම. | අලෙවි කිරීමේ | ගිණුම් |
| සිවසුබ්‍රමානියම්, මා. | සෞඛ්‍ය | දෙමළ ඒ සහ බී |
| සිංහලගේ, පි. | සමුපකාර සංවර්ධන | ගිණුම්, සිංහල ඒ සහ බී |
| සුගතපාල, සෙ. යා. | කම්කරු | සිංහල ඒ සහ බී |
| සුගතවංශ, සි. ජේ. | කච්චේරිය, කෑගල්ල | සිංහල ඒ සහ බී |
| සුන්තරලිංගම්, අ. | විදුලි | දෙමළ ඒ සහ බී |
| සෙනෙවිරත්න, වි. රො. | අධ්‍යාපන, කුරුණෑගල | ගිණුම් |
| සෙල්වනායගම්, තේ. | කොන්ත්‍රාත් කොමිෂම | ගිණුම් |
| සෙල්වරාජා, නා. | දේශීය ආදායම් | දෙමළ ඒ සහ බී |
| සේනාරත්න, ම. ලි. | කච්චේරිය, කොළඹ | සිංහල ඒ සහ බී |
| සේනාරත්න, වි. සි. | තක්සේරු | ගිණුම් |
| හෙට්ටිතන්ත්‍රිගේ, දෙ. සි. | පොලිස් | ගිණුම් |
| හේරත්, පි. | අධ්‍යාපන, මහනුවර | ගිණුම් |
| හේරත්, හේ. මු. ගු. | කම්කරු | සිංහල ඒ සහ බී |

මෙහි පහත නම් සඳහන් අපේක්ෂකයින් සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ 'සී' උපග්‍රන්ථයේ නියම කර ඇති සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය දැන් සම්පූර්ණ කර ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අදිකාරි, ව. | වන සත්ව |
| අන්තෝනිපිල්ලෙයි, ෆ්‍රේ. ෆ්‍රැ. | මහෙස්ත්‍රාත් උසාවිය, යාපනය |
| අබේරුවන්, කු. අ. නි. ජ. | සෞඛ්‍ය |
| අබේසිංහ, ක. ආ. | කච්චේරිය, කුරුණෑගල |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අභයවර්ධන, ජ. අ. මු. පි. | ආනයන හා අපනයන පාලන |
| අමරවංශ, ලො. දෙ. ඩැ. | සමාජ සේවා |
| උභයරත්න, වි. වි. | ඉඩම් සංවර්ධන |
| ඒකනායක, ගු. බ. | කෘෂිකර්ම |
| කනක්කහේවා, ධ. | කම්කරු |
| කනගසභාපති, සේ. | වාරිමාර්ග |
| කනේසු, සෝ. | රජයේ වැඩ |
| කලන්සූරිය, උ. | කච්චේරිය, රත්නපුර |
| කළුආරච්චි, වි. නෝ. | සෞඛ්‍ය |
| කුමාරසිංහ, ර. | කම්කරු |
| ගනේෂ්, ක. | කච්චේරිය, අනුරාධපුරය |
| ගුණතිලක, හේ. ප. | කච්චේරිය, කුරුණෑගල |
| ගුණම්, ක. | දේශීය ආදායම් |
| ගුණරත්න, ප. රා. | කම්කරු |
| ගුණසිංහ, ප. ලි. | සමාජ සේවා |
| ගුණසේකර, ලෙ. වො. ර. | කච්චේරිය, ගාල්ල |
| චන්ද්‍රසේකර, ජා. | අලෙවි කිරීමේ |
| ජයතිලක, තෙ. මු. | කච්චේරිය, බදුල්ල |
| ජයවීර, සේ. | රජයේ වැඩ |
| ජයසිංහ, ම. අ. | ආහාර පාලන |
| ජයසිංහ, සි. | රජයේ වැඩ |
| ජයසිංහ, හ. හ. | අධ්‍යාපන, ගම්පහ |
| ජයසූරිය, එ. | රබර් පාලන |
| ජිනදස, අ. | ආහාර පාලන |
| ජිනදස, ක. ප. | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන |
| ජිනසේන, සා. ක. | අධිකරණ අමාත්‍යාංශය |
| ටිකිරිබණ්ඩා, තෙ. මු. ඥ. | කච්චේරිය, කුරුණෑගල |
| ඩයස්, දෙ. වෝ. නි. | සෞඛ්‍ය |
| තනබාලසිංගම්, නා. | කෘෂිකර්ම |
| තංගරාජා, ස. | අධ්‍යාපන, යාපනය |
| තිරුණාවුකරසු, ක. | කෘෂිකර්ම |
| තිලකරත්න, වි. ප්‍රේ. | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ |
| තුරෙයිරාජා, ස. පේ. | අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය |
| තෙන්නකෝන්, තෙ. මු. ස. වි. | ආහාර |
| ත්‍යාගරාජා, මු. | කච්චේරිය, යාපනය |
| ද අල්විස්, හ. ක. ගු. | ස්වදේශ අමාත්‍යාංශය |
| ද කුරුකුල, තු. ඇ. සු. | සෞඛ්‍ය |
| දයානන්ද, ජ. ප්‍රෙ. | මහෙස්ත්‍රාත් උසාවිය, කුලියාපිටිය |
| දසනායක, සේ. මු. | කච්චේරිය, කුරුණෑගල |
| පෙරේරා, කු. ජෝ. බ. | ප්‍රවාහන අමාත්‍යාංශය |
| පොන්නයියා, සා. | මහා භාණ්ඩාගාරය |
| ප්‍රනාන්දු, වි. සෙ. | බන්ධනාගාරය |
| බණ්ඩාර, වි. අ. මු. ක. | සමූපකාර සංවර්ධන |
| බුද්ධදස, ව. | සමාජ සේවා අමාත්‍යාංශය |
| මනතුංග, මැ. තී. | සෞඛ්‍ය |
| මයිල්වාගනම්, වෙ. | කච්චේරිය, ත්‍රිකුණාමලය |
| මාණික්කවාසගර්, වි. | ගණන් පරීක්ෂණ |
| මැදවැව, මැ. ගෙ. සු. | ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| මෙන්ඩිස්, ව. සි. | සිවිල් ගුවන් සේවා |
| රත්නම්, සෝ. ව. | රෙජිස්ට්‍රාර් ජෙනරාල් |
| රණතුංග, ගු. ස. | කෘෂිකර්ම |
| රණවීර, වි. ච. සු. ආ. | රජයේ වැඩ |
| රාජපක්ෂ, අ. | රෙජිස්ට්‍රාර් ජෙනරාල් |
| රාජපක්ෂ, පි. | පළාත් පාලන අමාත්‍යාංශය |
| රිවඩ, ක. දෙ. | පිස්කල්, අවිස්සාවේල්ල |
| රූපසිංහ, රූ. සු. ර. | අලෙවි කිරීමේ |
| ලියනගේ, ජි. දෙ. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය |
| ලියනගේ, ඩේ. | කච්චේරිය, මාතර |
| වනිසේකර, ක. බ. | ගණන් පරීක්ෂණ |
| වල්පිට, ඩේ. | ස්වදේශ අමාත්‍යාංශය |
| විජේසේකර, ව. මා. | පොලිස් |
| විතානවසන්, ව. | රජයේ වැඩ |
| විනයාගමූර්ති, ස. | කච්චේරිය, යාපනය |
| විල්සන්, අ. දෙ. | දේශීය ආදායම් |
| වීරකෝන්, වී. මු. ගු. | අධ්‍යාපන, කුරුණෑගල |
| වීරවර්ධන, ජේ. | කච්චේරිය, කෑගල්ල |
| වේලුම්මයිලුම්, න. | අධ්‍යාපන, යාපනය |
| සමරවීර, නි. ධ. | කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය |
| සිරිපාල, මා. දෙ. | සමාගම් රෙජිස්ට්‍රාර් |
| සිරිසේන, ආ. සෝ. | පළාත් පාලන අමාත්‍යාංශය |
| සිරිසේන, කා. තැ. ගො. | කච්චේරිය, ගාල්ල |
| සිල්වා, ස. ම. සූ. | කච්චේරිය, මොණරාගල |
| සිල්වා, ස. රි. | විභාග |
| සිවපාතම්, ක. | ගොවිජන සේවා |
| සිවරාජා, ම. | අලෙවි කිරීමේ |
| සිංහලගේ, පි. | සමූපකාර සංවර්ධන |

| නම | | | දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| සුගතපාල, සෙ. යා. | ... | ... | කම්කරු |
| සෙල්වනායගම්, කේ. | ... | ... | කොන්ත්‍රාත් කොමිෂම |
| සේනාරත්න, වි. සි. ... | ... | ... | තක්සේරු |
| හේරත්, අ. ... | ... | ... | ලංකා මහ කොමසාරිස් කාර්යාලය, පකිස්තානය |
| හේරත්, පි. ... | ... | ... | අධ්‍යාපන, මහනුවර |

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 ජුනි මස 11 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

6–687—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අම්පාරේ හාඩි ජොෂ්ය කාර්මික ආයතනයට සිසුන් බඳවාගැනීම—කාර්මිකයින්ගේ පාඨමාලාව—1969–70

1969–70 අධ්‍යායන වසරට මේ ආයතනයේ (දෑවුරුදු විද්‍යාලීය හා එක් අවුරුදු කාර්මික ප්‍රායෝගික පුහුණුව) කාර්මිකයින්ගේ පාඨමාලාවට සිසුන් ඇතුලත් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලබා ඇති අයදුම් කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. සුදුසුකම් :

(අ) වයස.—1969.1.31 දිනට වයස අවුරුදු 16ට නොඅඩු විය යුතුය. වයස 20 ට අඩු අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) අධ්‍යාපන සුදුසුකම්.—අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් එක් වරකදී සමත් විය යුතු අතර යටත් පිරිසෙයින් විද්‍යා විෂයයන් 2ක් ඇතුළුව විෂයයන් 3 කින් සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

3. මෙම ආයතනයට බඳවාගනු ලබන්නේ පිරිමි සිසුන් පමණක්ය.

4. පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා සියලුදෙනාම ආයතනයේ ශිෂ්‍ය නිවාසයෙහි නතර විය යුතුය.

5. මෙහි පහත දක්වෙන 1 වැනි ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත් තමන් උගත්/ඉගෙන ගන්නා මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතිය පාඨශාලාවේ ප්‍රධාන තුමාට හැකිතාක් ඉක්මණින් යැවිය යුතුය. බාහිර අපේක්ෂකයන් තමන් අන්තිම වරට උගත් පාසැලේ ප්‍රධාන තුමා මගින් ඉල්ලුම්පත් එවිය යුතුය.

6. පාසැල් ප්‍රධානීන් විසින් ඔවුන්ට ලැබී ඇති අයදුම්පත් මැනවින් පරීක්ෂාකර පහත දක්වෙන අංක 2 දරණ පෝර්මය අනුව කාර්මිකයින්ගේ පාඨමාලාව හැදෑරීමෙහිලා අයදුම්කරුවන්ට ඇති සුදුසුකම් ගැන නිර්දේශ කළ යුතුය. මෙසේ සුදුසුකම් නිර්දේශ කිරීමේදී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික ක්‍රියාකාරිත්වය හා බාහිර විෂයමාලා වැඩ කටයුතු පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. අම්පාරේ හාඩි ආයතනයේ සහ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ කාර්මිකයින්ගේ පාඨමාලාවේ අවුරුදු දෙක අවසාන විභාගයෙන් උසස් ලෙස සමත්වන සිසුන් 50 දෙනෙකු පමණ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ පවත්වනු ලබන ඉංජිනේරු උපාධියට සමාන පස් අවුරුදු ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලැබේ.

7. විද්‍යාලයාධිපතීන්, ඉල්ලුම්පත්‍ර සහ උපලේඛනය නම නිර්දේශද සහිතව 1969 ජූලි 20 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ කෙළින්ම අම්පාරේ හාඩි ජොෂ්ය කාර්මික ආයතනයේ ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

8. එදිනට පසු ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. විජයරත්න,
ආයතනාධිපති, හාඩි ජොෂ්ය කාර්මික ආයතනය.

1969.6.12 දින,
හාඩි ජො.කා.ආ., අම්පාර.

### I ආකෘතිය

### අම්පාරේ හාඩි ජොෂ්ය කර්මික ආයතනයේ කාර්මික පාඨමාලාවට ඇතුළුවීම සඳහා ඉල්ලුම් පත්‍රය

සැ.යු.—හුදෙක් ඉහත සඳහන් නිවේදනයේ දක්වෙන වයස් සීමාවට අයත් හා අධ්‍යාපනික සුදුසුකම් දරන්නවුන් පමණක් ඉල්ලුම් පත් එවිය යුතුයි.

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලිව)
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. 1969.1.31 දිනට වයස : අවු :————. මාස :————. දින :————.
5. ජාතිකත්වය :————.
6. ස්ත්‍රී පුරුෂ භාවය :————.
7. මවගේ, පියාගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
8. මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතීය පාඨශාලාවේ නම සහ ලිපිනය :————.
9. ඉහත සඳහන් නිවේදනයේ 2 (ආ) ඡේදයේ දක්වෙන අධ්‍යාපන සුදුසුකම් ලබාගත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වූ වර්ෂය සහ මාසය : ————.

(ආ) සමත්වූ විෂය හා තත්වය (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන, විශිෂ්ට සාමාර්ථය, ආදි වශයෙනි.)

| විෂය : | සාමාර්ථ තත්ත්වය : |
|---|---|
| 1. ශුද්ධ ගණිතය | ........................... |
| 2. භෞතික විද්‍යාව | ........................... |
| 3. භාෂාව | ........................... |
| 4. ............................ | ........................... |
| 5. ............................ | ........................... |
| 6. ............................ | ........................... |

10. බාහිර වැඩ :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

II ආකෘතිය

## ඉල්ලුම්පත් උපලේඛනය

පාසැලේ නම :......................................................

| අංකය | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | උපන් දිනය | සමත් විෂය හා ශ්‍රේණි | අ.පො.ස.සා. පෙළ සමත් වර්ෂය | ඉගෙනීමේ දක්ෂතාවය | පාසැල් ප්‍රධානියාගේ නිර්දේශ හා වෙනත් විස්තර |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

6–759 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1969

1969 මැයි මස 9 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයට ප්‍රතිශෝධනයකි.

2. එම ගැසට් නිවේදනයේ 7 වැනි ඡේදයේ (බී) විශේෂ සුදුසුකම් යටතේ පහත දැක්වෙන සංශෝධන කරනු ලැබේ :—

(ඒ) **ඉංග්‍රීසි පාඨමාලාව සඳහා** පහත දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් ලබා ඇති අය ද සුදුස්සෝ වෙති :—

(i) පළමුවැනි හෝ දෙවැනි පෙළ ඉංග්‍රීසි ගුරු සහතිකය.

(ii) සහතික පත්‍ර ප්‍රදානය සඳහා විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබූ විභාගයක දී ප්‍රදානය කරන ලද ඉංග්‍රීසි උපගුරු සහතිකය. (සේවය සඳහා පමණක් ප්‍රදානය කරන ලද සහතික මේ ගණයට අයත් නොවේ.) ඉංග්‍රීසි උගන්වන ගුරුවරුන් සඳහා පැවැත්වෙන විභාගයේ ව්‍යවස්ථා යටතේ යම් කොටසකින් නිදහස් කිරීම එම කොටසින් ලැබූ සාමාර්ථ්‍යයක් සේ මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා නොපිළිගැනේ.

(බී) **ගණිත පාඨමාලාව සඳහා** ගැසට් නිවේදනයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම්වල

(i) (ආ) පහත දැක්වෙන අයුරු සංශෝධනය කරනු ලැබේ :—

(i) (ආ) ඉහත සඳහන් විෂයයන් එකකින් සම්මාන සාමර්ථ්‍යයක් හා භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් සාමර්ථ්‍යයන්,

(සී) **විද්‍යාපාඨමාලාව සඳහා** ගැසට් නිවේදනයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම්වල (i) (ආ) පහත දැක්වෙන අයුරු සංශෝධනය කරනු ලැබේ :—

(i) (ආ) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ලබන ලද සාමාර්ථ්‍යයන්.

(එෆ්) **ගෘහ විද්‍යා පාඨමාලාව සඳහා** ගැසට් නිවේදනයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම්වල (i) (ඇ) ඡේදයේ සඳහන් විෂයයන්වලට "සාමාන්‍ය විද්‍යාව" විෂයයද එකතු කර ඇත.

3. 1968 දෙසැම්බර් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට එහි ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයට ද මෙම විභාගයට ඉල්ලුම් කළ හැකිය.

4. ඉහත සඳහන් සංශෝධන අනුව විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් 1969.6.30 දක්වා භාරගනු ලැබේ.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස

1969 ජූනි මස 10 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදීය.

6–820—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද, විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයන්හි දී ද 1969/70 වර්ෂයේ පැවැත්වෙන අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමාව සඳහා පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයන්හි ද පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස දැනට රජයේ පාසැල්වල හෝ අධ්‍යක්ෂ පාලිත පාසැල්වල සේවය කරන උපාධිධාරී ගුරුවරුන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1969.7.4 වැනි දින හෝ ඉන් පෙර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිවරයාට ලැබෙන සේ පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර එවිය යුතුවේ.

**සංලක්ෂ්‍යය.**—යම්කිසි ඉල්ලුම් පත්‍රයක් තැපෑලේදී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපනයක් ගැන සලකා බැලිය නොහැකිය. ස්වකීය ඉල්ලුම් පත්‍රය එවීමට අවසාන දිනය දක්වා පමා වන ඉල්ලුම්කරුවන් විසින්ම එසේ පමාවීමෙන් වන පාඩුව විඳ දරාගත යුතුය.

2. මෙම ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කාලීනය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු විසින් ම තමා—

(අ) ලංකාවේ පුරවැසියකු බවට,

(ආ) 1969.1.1 දිනට වයස අවුරුදු 45 කට නොවැඩි බවට,

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු බවට,

(ඊ) උපාධිය ලැබීමෙන් පසු 1969.1.1 දිනට අවුරුදු 5 කට නොඅඩු කාලයක් අධ්‍යක්ෂ පාලිත පාසැලක හෝ රජයේ පාසැලක හෝ ගුරු විද්‍යාලයක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබෙන බවට,

(i) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරියා විසින් හෝ පත්වීම අනුමත කරනු ලැබ පිළිගත් පෞද්ගලික පාසැලක යෝග්‍ය ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කර ඇති සේවය ද 5 අවුරුදු ඉගැන්සීමේ පළපුරුද්ද ගණන් ගැනීමේ දී පිළිගනු ලැබේ. මෙම කාර්යය සඳහා, 1951 දී ගාස්තු අය කරන පාඨශාලා බවට පත් වූ උපකෘත පාඨශාලා

සහ

1960.12.1 දින ගාස්තු අය නොකරන පෞද්ගලික පාසැල් බවට පත්වූ පාඨශාලාත් පිළිගත් පෞද්ගලික පාඨශාලා වශයෙන් සැළකේ.

(ii) ප්‍රාචීන පණ්ඩිත සහතිකම මත උපාධි වැටුපෙහි පිහිටවනු ලැබූ, ප්‍රාචීන පණ්ඩිත සහතිකය ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන්ට මෙහි අවශ්‍යව ඇති අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්ද සඳහා, ඔවුන් උපාධිධාරී වැටුප් ක්‍රමයෙහි පිහිටුවන ලද දිනයේ සිට සේවය ගණන් ගැනීමට ඉඩදෙනු ලැබේ.

(උ) ඉංග්‍රීසි/සිංහල/දෙමළ පිළිබඳ මනා දැනුමක් ඇති අයෙකි බවට ද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. **පාඨමාලාව**—

(අ) අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නියමිත කාලය එක් අවුරුද්දකි.

(ආ) මෙම පාඨමාලාව පවත්වනු ලබන කාල සීමාව තුළ කවර අවස්ථාවක හෝ තමාගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක වන ගුරුවරු පාඨමාලාවෙන් නවත්වනු ඇත.

5. **තෝරා ගැනීම.**—ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. විභාගය 1969.8.11 දින විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

**විභාගයේ විෂයයන්**—

(1) වත්මන් තතු පිළිබඳ සාමාන්‍ය තොරතුරු හා දැනුම—අධ්‍යාපන ප්‍රශ්න පිළිබඳ තොරතුරු හා දැනුම

(2) සාමාන්‍ය බුද්ධිය

6. විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවල අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සිංහල මධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. එබැවින් එම විශ්ව විද්‍යාලයයන්හි පාඨමාලා හැදෑරීම සඳහා ඉඩකඩ සැලසිය හැක්කේ සිංහල භාෂාව පිළිබඳ මනා ප්‍රවීනතාවයක් ඇති අය සඳහා පමණකි. පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පවත්වනු ලබන පාඨමාලාව ඉංග්‍රීසි පිළිබඳ ප්‍රවීනතාවයක් ඇති අය සඳහා පැවැත්වේ.

7. **ශිෂ්‍යත්ව/ගිවිසුම**—පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිමවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක කාල පරිච්ඡේදයක් දෙපාර්තමේන්තුව යටතේ සේවය කිරීමට පොරොන්දු වෙමින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සමග බැඳුම්කරයකට හා ගිවිසුම් පත්‍රයකට තෝරාගත් ඉල්ලුම්කරුවන් ඇතුළත් විය යුත්තේ ය. එහෙත්, පුහුණුවීමේ වියදම් රු. 10,000 කට වැඩි හා රු. 20,000 කට අඩුවන අවස්ථාවන්හි බැඳුම්කරයේ කාල පරිච්ඡේදය අවුරුදු 7 ක් වන්නේ ය.

8. නියමිත කාල සීමාව තුළදී ඩිප්ලෝමා උපාධිය ලබා ගැනීමට අසමත් වන ඕනෑම අපේක්ෂකයෙකු විසින් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු කාලයේ දී වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද සම්පූර්ණ මුදල ආපසු රජයට ගෙවිය යුතුය.

9. **අධ්‍යයන නිවාඩු**—තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට සම්පූර්ණ කාල වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. එවැනි ඉල්ලුම් කරුවන් විසින් අධ්‍යයන නිවාඩු සඳහා දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති මත එම කාර්යාලය වෙත ඉල්ලුම් කළ යුතුයි.

10. විභාගාපේක්ෂකයා රුපියල් විස්සක් වටිනා මුද්දර අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුය. මුද්දර එක පිට එක ඇලවිය යුතු නැත.

වැඩ බලන අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජූනි මස 13 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
ගුරු විද්‍යාල ශාඛාවේ දීය.

## පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයන්හි ද 1969-70 වර්ෂයේ පැවැත්වෙන අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමාව සඳහා වන පශ්චාත් උපාධි පාඨමාලාවලට ඇතුළත්වීමේ ඉල්ලුම් පත්‍රයයි

1. (i) සම්පූර්ණ නම :————.
(මයා./මහත්මිය/මෙනවිය/පූජ්‍ය)

(ii) (මුලකුරු සහිතව) නම :————.

2. (අ) උපන් දිනය :————.
1969.1.1 වැනි දිනට වයස අවු :————. මාස :————
(ආ) ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි අංකය :————.

3. ලිපිනය :————.
(i) රාජකාරි :————.
(ii) පුද්ගලික :————.

4. අධ්‍යාපනය ලැබූ විශ්ව විද්‍යාල :————.
(අනු පිළිවෙළින්)

5. උපාධිය :———— විශ්ව විද්‍යාලය :———— වර්ෂය :————.
අංශය ඒ/බී සාමාන්‍ය/විශේෂ
සාමාර්ථ/ගෞරව පන්තිය/කොටස
ප්‍රථම/ද්විතිය/තෘතිය/සාමාර්ථය :————.
උපාධිය සඳහා ගත් විෂයයන් :————.
විශ්ව විද්‍යාලයේ දී අධ්‍යාපන ලැබූ මාධ්‍යය :————.

6. පාසැලේ දී හෝ ඉන් පසුව හෝ ලබාගත් ශාස්ත්‍රීය හා වෙනත් විශිෂ්ඨතා :————.

7. දැනට උසුලන තනතුර :————.
**තත්ත්වය.**—විද්‍යාලයාධිපති, I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය. උප විද්‍යාලයාධිපති විශේෂ තනතුර, I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය/උපගුරු, ගෞරව උපාධිධාරී/උපාධිධාරී :————.
පාඨශාලාව : රජයේ/අධ්‍යක්ෂපාලිත :————.

8. (i) ඉගැන්වීමේ පළපුරුද්ද : අවුරුදු :—— මාස :—— කාල පරිච්ඡේදය:———— පාසැලේ නම, ඉගැන්වූ විෂයයන්, මාධ්‍යය, පන්තිය සිට තෙක්
(1)
(2)
(ii) උපාධිය ලැබීමෙන් පසු 1969.1.1 දිනට අධ්‍යක්ෂ පාලිත/රජයේ පාසලක ඉගැන්වීමේ පළපුරුද්ද :————.

9. ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.
සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම්කරුට ඉගැන්විය හැකි විෂයයන් හා ශ්‍රේණි :————.
විෂයය :————. උසස්ම පන්තිය :————.

10. ඉල්ලුම්කරුයේ වාසියට හේතුවන කවර හෝ විශේෂ අධ්‍යයන හෝ ප්‍රකාශන :————.

11. ඉල්ලුම්කරුගේ පාසැලට සහාය ලැබෙන විෂය මාලාවෙන් බාහිර ක්‍රියා කාරිත්වයන් :————.

12. ඉල්ලුම්කරු විසින් සහභාගි වූ පාසැලෙන් බැහැර සාමාජික හා සුභ සාධක ක්‍රියා කාරිත්වයන් :————.

13. ස්වකීය ඉල්ලුම් පත්‍රයට වාසිවන පරිදි ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීමට කැමති වෙනත් තොරතුරු :————.

14. මීට ප්‍රථම ලබා ඇති අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර හා බැඳුම් කරයේ කාලපරිච්ඡේදය :————.

15. ඔබට විරුද්ධව විභාග කිරීමට නියමිත කිසියම් විනයානුකූල පරීක්ෂණයක් ඇත්තේ ද එසේ නම් එහි විස්තර : ————.

16. ඔබ මෙම පරීක්ෂණයට පෙනී සිටීමට කැමති මාධ්‍යය සඳහන් කරන්න :————.

---

මුද්දර අලවා
අවලංගු කරන්න.

---

ඉහත සඳහන් කළ සියළුම තොරතුරු නිරවද්‍ය බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(ඉල්ලුම්කරු සේවයෙහි නියුක්ත පාසැලේ ප්‍රධානයා මගින් මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුයි.)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) පින්තාරු තීන්ත සැපයීම සඳහා 1969.7.15 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

පින්තාරු තීන්ත සැපයීම සම්බන්ධයෙන්, ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින්, කොළඹ 7, බුලර්ස් පාරේ අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් සවකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, අධිකාරිතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969.7.14 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම් කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජූනි මස 20 දින,
කොළඹ දී ය.

6–764—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

1969 ඔක්තෝබර් 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා පහත සඳහන් සැපයීම් සඳහා කොළඹ, තැ. පෙ. 593, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදාවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඒ ඒ සැපයීම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| I<br>සැපයීම | II<br>ටෙන්ඩර භාරගන්නා අන්තිම දිනය | III<br>ටෙන්ඩර් ආකෘති නිකුත් කරන අන්තිම දිනය |
|---|---|---|
| (අ) ත්‍රිකුණාමලයේ, යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට මස් සැපයීම ... | 9.7.1969 | ... 8.7.1969 |
| (ආ) කොළඹ, යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට අළුත් මාළු සැපයීම ... | 9.7.1969 | ... 8.7.1969 |
| (ඇ) ත්‍රිකුණාමලයේ, යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට අළුත් මාළු සැපයීම ... | 9.7.1969 | ... 8.7.1969 |
| (ඈ) වැලිසර, රාජකීය ලංකා නාවික හමුදාවට මස් සැපයීම ... | 11.7.1969 | ... 10.7.1969 |
| (ඉ) වැලිසර, රාජකීය ලංකා නාවික හමුදාවට අළුත් මාළු සැපයීම ... | 11.7.1969 | ... 10.7.1969 |
| (ඊ) වැලිසර, රාජකීය ලංකා නාවික හමුදාවට උදය ආහාර ද්‍රව්‍ය වර්ග සැපයීම ... ... | 11.7.1969 | ... 10.7.1969 |
| (උ) කොළඹ, රාජකීය ලංකා නාවික හමුදාවට උදය ආහාර ද්‍රව්‍ය වර්ග සැපයීම ... ... | 11.7.1969 | ... 10.7.1969 |
| (ඌ) කාරෙයිනගර් හි, රාජකීය ලංකා නාවික හමුදාවට, එළවළු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන, මස්, අළුත් මාළු සහ උදය ආහාර ද්‍රව්‍ය වර්ග සැපයීම ... ... | 15.7.1969 | ... 14.7.1969 |
| (එ) වැලිසර, රාජකීය ලංකා නාවික හමුදාවට, එළවළු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන සැපයීම ... | 16.7.1969 | ... 15.7.1969 |

2. අයදුම්කරුගේ මුදල්, තරාතිරම ගැන සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුමක් මත, ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර ආකෘති පත් ඒ ඒ සැපයීම ඉදිරියෙහි III වැනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12.00 දක්වා කොළඹ, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදාවේ, නාවික ආහාර හා නිළ ඇඳුම් අංශයේ, මාණ්ඩලික නිලධාරි (ආහාර) විසින් නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් එක් එක් සැපයීම් සඳහා රු. 75 බැගින්, නැවත ලබාගත හැකි ටෙන්ඩර තැන්පත් මුදලක් ගෙවිය යුතුයි. චෙක් පත් භාර නොගැනේ. මුදල් ඇණවුම් නාවික හමුදාධිපති නමින් විය යුතුය.

4. ටෙන්ඩර ආකෘති පත් ඉල්ලුම්කරුවන් තම තමන්ගේ සම්පූර්ණ නම සහ ලිපින ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර ආකෘති පත් ඉල්ලුම්කරුවන් තමන් ටෙන්ඩර කිරීමට කැමති අසවල් ස්ථානයේ අසවල් සැපයීම සඳහා බව සඳහන් කිරීම වැදගත්ය.

රා. කදිර්ගාමර්,
රෙයාර් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

1969 ජූනි මස 8 වැනි දින,
නාවික ආහාර හා නිළ ඇඳුම් අංශය,
මූලස්ථානය, රාජකීය ලංකා නාවික හමුදාව,
කොඩිගහ වීදිය, තැ.පෙ. 593,
කොළඹ 1.

6–633 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## යුද්ද හමුදා මූලස්ථානය

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ—

(අ) යාපනය, මන්නාරම, මුලතිව්, සිලාවතුරේ, වෙම්පන්කුන්ඩු සහ අයියකච්චි යන හමුදා කඳවුරුවලට පළාපූ දර සැපයීම හා බැරැක්ක සහ ආරෝග්‍යශාලාවල කිලුටු රෙදි හා හමුදා භටයින්ගේ කිලුටු රෙදි ඇපිල්ලීම් කරදීමේ සේවාවන් සැපයීම ;

(ආ) වෙම්පන්කුන්ඩු හමුදා කඳවුරට එළවලු, පලතුරු, මස් වර්ග හා අලුත් මාලු සැපයීම

සඳහා 1969 ජූලි මස 8 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ බාල දක්ෂ මාවත, (පහළ වැව පාර) යුද්ද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත් ලබා ගැණීම සඳහා යුද්ද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ.) තැන්පත් කර සිටිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර්පත් 1969 ජූලි මස 7 වෙනි දින දහවල් 12 දක්වා යුද්ද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ බාල දක්ෂ මාවත, යුද්ද හමුදා මූලස්ථානයෙන් දැන ගත හැකිය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ද හමුදා ආඥපති.

1969 ජූනි මස 12 දින,
යුද්ද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

6–753 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## 1969-70 මුදල් වර්ෂය තුළ කොළඹ (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය), මහනුවර (බෝගම්බර බන්ධනාගාරය, මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය), මහර බන්ධනාගාරය, යාපනය බන්ධනාගාරය සහ කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරට කෑම ද්‍රව්‍ය සැපයීම

කොළඹ (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය), මහනුවර (බෝගම්බර බන්ධනාගාරය, මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය), මහර බන්ධනාගාරය, යාපනය බන්ධනාගාරය සහ කුණ්ඩසාලේ එළිමහනේ සිරකඳවුරට 1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට වර්ෂ 1970 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා ..කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ, ''වෙළඳ ද්‍රව්‍ය'' වශයෙන් මිස ''ආහාර'' ක්‍රමයට නොවේ. ටැන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති යම් උපලේඛනයට හෝ උපලේඛනයන්හි ඉහත සඳහන් සියලුම විෂයයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. ''අ'' සිට ''උ'' දක්වා සඳහන් උපලේඛනයන්ගෙන් ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිළ ගණන් ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් භාරගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලාගත යුතුයි :—

**උපලේඛනය (ආ)***
හරක් මස්
එළු මස්
ලිවර්
කුකුලු මස්
බිත්තර

**උපලේඛනය (ඇ)**
නොයෙක් වර්ගයේ මාළු
නොයෙක් වර්ගයේ කරවල

**උපලේඛනය (ඈ)**
පොල්
තැඹිලි

**උපලේඛනය (ඉ)**
කුළුබඩු

**උපලේඛනය (ඊ)***
(අ) කොළ එළවලු
(ආ) පළතුරු එළවලු
(ඇ) පිටි සහිත එළවලු
(ඈ) අන්‍ය එළවලු

**උපලේඛනය (උ)**
එළකිරි

**සැ.යු.**—මහනුවර බන්ධනාගාර වෙනුවෙන් ටෙන්ඩර් කැඳවනු ලබන්නේ ''ආ'' උපලේඛනයේ දක්වෙන ද්‍රව්‍යයන් සඳහා පමණක්ය.

***සටහන.**—(i) කරවල සහ අළුත් මාළු පිළිබඳ වෙන වෙනම ටෙන්ඩර් මණ්ඩලය විසින් සලකා බලනු ඇත.

(ii) බිත්තර සහ අමුමිරිස් ඇතුළු එළවලු වර්ග කොන්ත්‍රාත්කරුවන් ගෙන් ගනු ලබන්නේ බන්ධනාගාර ගොවිපළවල් වලින් ලැබෙන බිත්තර සහ අමු මිරිස් ඇතුළු එළවලු වර්ගවල අඩුපාඩු පිරවීම සඳහා පමණක්ය.

3. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ''සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව'' කියා එවිය යුතුයි.

එක ටෙන්ඩර් පෝර්මයක සඳහන් කළ යුත්තේ එක උපලේඛනයක් සඳහා මිළ ගණන් පමණකි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ, කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ඩබ්ලිව්. ජේ. ද සිල්වා මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ ''...........බන්ධනාගාරයට ..............................උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය'' කියා ලියා මෙහි 9 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35ට කොළඹ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝරමයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (9 වෙනි ඡෙදය බලන්න) පෙර දින ප.ව. 3.30 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් වූනි නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධව කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

(අ) කොළඹ බන්ධනාගාර (වැළිකඩ, කොළඹ රිමාන්ඩ් සහ මැගසින්).

| | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|---|
| උපලේඛනය (ආ) | ... | 100 0... | 1,500 0 | |
| ,, (ඇ) | ... | 100 0... | 1,500 0 | |
| ,, (ඈ) | ... | 100 0... | 1,500 0 | |
| ,, (ඉ) | ... | 100 0... | 1,500 0 | 11.7.69 |
| ,, (ඊ) | ... | 100 0... | 1,500 0 | |
| ,, (උ) | ... | 100 0... | 500 0 | |

(ආ) මහනුවර බන්ධනාගාරය (බෝගම්බර සහ මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය) ... ... 15.7.69

(ඇ) මහර බන්ධනාගාරය ... ... 15.7.69

(ඈ) යාපනය බන්ධනාගාරය ... ... 17.7.69

(ඉ) කුණ්ඩසාලේ එළිමහන් සිරකඳවුරට ... 17.7.69

| | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. |
|---|---|---|---|
| උපලේඛනය (ආ) | ... | 100 0... | 1,500 0 |
| ,, (ඇ) | ... | 100 0... | 1,500 0 |
| ,, (ඈ) | ... | 100 0... | 1,500 0 |
| ,, (ඉ) | ... | 100 0... | 1,500 0 |
| ,, (ඊ) | ... | 100 0... | 1,500 0 |
| ,, (උ) | ... | 100 0... | 500 0 |

10 එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛනය සඳහා තැන්පත් කරනු ලබන මුදල වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරන මිළ ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම, එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට ඔවුන් වෙනුවෙන් ඇප කරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම් ඉදිරිපත් කළ යුතු ය.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට සුදුසු ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ සඳහන්ව ඇත. අවශ්‍ය සියලුම විස්තර මෙම දැන්වීමේ 6 වෙනි ඡෙදයේ සඳහන් කාර්යාලයෙන් ලබාගත හැක.

13. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින් ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම්, කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ, ලාංකිකයන් පමණකි.

17. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම්, දේපොල ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදයම් පාලක තැන විසින් සහතික කරන ලද රපෝර්තුවක් එවිය යුතු ය. දේපොල විස්තර ද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්තුකරුවකු නිවේදනයේ සඳහන් ටෙන්ඩර් කැඳවනු ලබන කොට්ඨාශයේ හෝ පළාතේ හැර ඉල්ලුම් කරනු ලබන්නේ නම් කුමන කොට්ඨාශයක හෝ කොට්ඨාශවල එම කොන්ත්‍රාත්තු තමා ඉටුකර ඇද්දැයි සඳහන් කළ යුතුය.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. එබඳු නිළධාරියකු ගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිළධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිළධාරියා ද වේ.

19. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කායඝාලයෙන් ලබාගත හැක.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1969 ජුනි මස 8 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

6–609 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### පානීය පරිපාක ස්ප්‍රීතු ඉම්පීරියල් ගැලුම් 3,25,000 හෝ මැට්‍රික් ටොන් 1,175 ක් සැපයීම සඳහා ලෝකව්‍යාප්ත ටැන්ඩර් කැඳවීම

පානීය පරිපාක ස්ප්‍රීතු ඉම්පීරියල් ගැලුම් 3,25,000 ක් හෝ (මැට්‍රික් ටොන් 1,175 ක්) සැපයීම සඳහා කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ, තැ. පෙ. 552, ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් 23 වැනි අඟහරුවාදා පූ. භා. 10 දක්වා ටැන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පිහිටි සුරාබදු කොමසාරිස්ගේ කර්යාලයෙන් මේ සඳහා නියමිත ආකෘති පත්‍ර ලබාගත හැක.

3. කච්චේරියකින් හෝ කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති සුරාබදු කොමසාරිස් ගේ කාර්යාලයෙන් රුපියල් 100 ක තැන්පත් මුදලක් සඳහා රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් පසු 1969 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා දවල් 12 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1969 ජුනි මස 11 වැනි දින.

6–688 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගාල්ල උප කොටස

1969 ජූලි මස 11 වැනි දින පෙරවරු 10 දක්වා තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටැන්ඩර් පත් භාරගනු ලැබේ.

ටැන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

1. ගාලු දිස්ත්‍රික්කයේ අලුත් පහල කැසූ ඇල වැඩි දියුණු කිරීම.
2. ගාලු දිස්ත්‍රික්කයේ පුවක්ගහ ඇල ප්‍රකෘතිමත් කිරීම.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ලියා පදිංචි සමිතිද ඇතුළුව මේ වැඩය සඳහා ටැන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. 1969 ජූලි 10 වැනි දින දවල් 12 වන තෙක් කාර්යාල වේලාවන් තුළදී ගාල්ල, මාතර, තිස්ස, හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරුවන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ෆෝර්මවල ටැන්ඩර් පත් සකස් කළ යුතුය. ටැන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටැන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම එක් වැඩක් සඳහා රු. 25 ක ටැන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටැන්ඩර් වැඩිදුර විස්තර කාර්යාල වේලාව තුලදී ගාල්ල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ජේ. එම්. ඩී. එල්. සෙනවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගාල්ල උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 69.6.9.

6–607— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969.7.7 වෙනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ :—

කෝපි ඇට හොණ්ඩර 11 යි.
වියළි මිරිස් හොණ්ඩර 13 යි.
මාදුරු රාත්තල් 15 යි.

2. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම් පත් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (ෆෝර්ම) ඔබගේ වැඩිම මිළ ගණන සඳහන් කර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රාකර “ ගොවි ද්‍රව්‍ය මිළට ගැනීම ” යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර සභාපති, කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ යන ලිපිනයට ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ, එක් ටෙන්ඩර් ෆෝර්මයක් වෙනුවෙන් රු. 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළ හැක.

4. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1969.7.7 වෙනි දින පස්වරු 2.30 ට ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහතකී දිනයේ දී ඉහතකී වේලාවට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5. කොන්දේසි නොමැති වන අතර ටෙන්ඩර් ස්ථිර විය යුතුයි. ටෙන්ඩර් පත් එවීමට අදහස් කරන්නවුන්ට කුණ්ඩසාලේ, පාඇල් ගොවිපලේ කළමනාකරු හමුවී කාර්යාල වේලාවන් තුල සඳහන් ද්‍රව්‍ය තොග පරීක්ෂා කල හැක.

6. තෝරාගත් ටෙන්ඩර් කරුවන් විසින් ඒ බව ඔවුන්ට දන්වා දස දිනක් තුල එහි සඳහන් මුලු මුදල ගෙවිය යුතුය. මුදල ගෙවා දින දහ හතරක් තුල එම බඩු ගෙන යා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථාන යේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දැන්වූවා සේ සලකනවා ඇත. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෙන අන්දමකට තීරණය නොකල හොත් නියමිත කාලසීමාව තුලදී ගෙන නොගොස් ගබඩාවේ ඉතිරි වෙන බඩු නැවත විකුණා දැමීම හෝ වෙනත් සුදුසක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර් කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කල නොහැක.

15. 1934 වර්‍ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත් කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීමට අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධ වීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මඟින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්‍ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ රජයේ ගොවිපලේ කළමනාකරුගෙන් දැනගත හැකිය.

ජී. ටී. ජිනෝන් දදස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

1969 මැයි මස 30 වන දින,
පේරාදෙණියේ දීය.

6–678 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ සීතාඑළිය ක්ෂෙත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩපලට ගොඩනැගිලි උපකරණ සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත සඳහන් ගොඩනැගිලි උපකරණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නුවරඑළියේ ක්ෂෙත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩපලට සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූලි මස 4 වැනි දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| ටෙන්ඩර් අංක | | විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| ඇල්.කිව්. 06.03.21 | ... | (අ) කළුගල් 6″ සිට 9″ | කියුබ් 35 යි |
| | | (ආ) කළුගල් 4″ සිට 6″ | කියුබ් 125 යි |
| | | (ඇ) මැටල් 2″ ... | කියුබ් 75 යි |
| | | (ඈ) මැටල් ¾″ ... | කියුබ් 10 යි |
| | | (ඉ) වැලි ... | කියුබ් 25 යි |
| | | (ඊ) හුනු ... | බුසල් 5 යි |
| | | (උ) අළුහුනු ... | බුසල් 5 යි |
| ඇල්.කිව්. 06.03.22 | ... | (අ) 6″ × 4″ × 14′... | 1 ශ්‍රෙණියේ 15 යි |
| | | (ආ) 4″ × 2″ × 1′... | 1 ශ්‍රෙණියේ 40 යි |
| | | (ඇ) 4″ × 3″ × 7′ ... | හල්මිල්ල 30 යි |
| | | (ඈ) 4″ × 3″ × 8′ ... | හල්මිල්ල 30 යි |
| | | (ඉ) 10″ × 1″ ... | කොස්ලෑලි දි.අ. 350යි |
| | | (ඊ) 12″ × 1″ × 10′... | ගිනිසපුලෑලි දි.අ. 800යි |
| | | (උ) 12″ × 1″ × 8′... | ගිනිසපුලෑලි දි.අ. 800යි |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියම තත්ත්වයෙන් හා සැපයුම් විස්තර වලට අනුව තිබිය යුතුය.

3. ටෙන්ඩර් කරුවන්ට මෙම කොටස් දෙකෙන් කොටසකට හෝ කොටස් දෙකටම ටෙන්ඩර් කළ හැකිය.

4. 1969.7.4 වැනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ දෙපිටපතකින් සකස් කරන ලද ටෙන්ඩර් හොඳින් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා '' සීතා එළියට ගොඩනැගිලි උපකරණ සැපයුම '' සඳහා ටෙන්ඩර් යනුවෙන් ලියුම් කවරයේ උඩ වම් කෙලවරේ සඳහන් කර එවිය යුතුයි.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට සති 4ක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිනුමට, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවෙහි දී හෝ ටෙන්ඩර් කරන මුළු මුදලින් 5% මුදලක් ඇප වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කළ යුතුය. මෙම ඇප මුදල ආපසු ගෙවන්නේ සතුටුදයක අන්දමින් ටෙන්ඩරය අවසන් කළ පසුය.

7. එසේ කිරීමට යම් ටෙන්ඩර් කරුවෙකුට නියම කළ දින සිට දින 10 ක් ඇතුලතදී එම මුදල තැන්පත් නොකළහොත් වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඔහුගේ නමද ඇතුලත් කිරීමට සිදු වෙනවා ඇත.

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

9. ටෙන්ඩර් සියල්ල එකක් හෝ ඉන් කොටසක් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

එල්. ආර්. ඒල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූනි මස 3 වෙනි දින,
පේරාදෙණිය, ගන්නොරුවේ,
කෘෂිකර්ම ඉංජිනේරු අංශයේ දීය.

6—685 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පශු පස්චාත් මරණ පර්යේෂනාගාරය—ගන්නොරුව, පේරාදෙණිය

1. පශු පස්චාත් මරණ පර්යේෂනාගාරයක් තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.7.19 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 20,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.7.3 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූනි මස 11 වෙනි දින,
සිවිල් ඉංජිනේරු අංශයේ දී,
අංක 457, ගාලු පාර,
කොළඹ 3.

6–755 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—මාතලේ දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

1. තවලංකොයේ දික්දෙනියේ අමුන ඉදි කිරීම.
2. මිල්ලවානේ ගනේ වඟලේ ගොඩවේල්ල සෑදීම.
3. මොරගොල්ලේ අලුත්වැව හෙවත් ශ්‍රමදාන වැව දියුණු කිරීම.
4. වහකෝට්ටේ පලාපත්වල ගමේ වෙලේ මහ වේල්ල බැඳීම.
5. දමුනුමුල්ලේ පලු සියඹලා වැව ප්‍රතිසංස්කරණය.
6. ගලේවෙල කලහකැලේ වැව දියුණු කිරීම.
7. පල්දෙනියේ ඇලේ කඩවල බැඳීම.
8. ඇලගමුවේ ඇල වැඩි දියුණු කිරීම.
9 ඇලගමුවේ තලාගොඩ ඇල වේල්ල සකස් කිරීම.
10. පුවක්පිටියේ ගලපිට වැව වැඩි දියුණු කිරීම.
11. බෙලියාකන්දේ ඉහල අලුත්වැවේ වාන් ඇල සෑදීම.
12. නිලගම වැව දියුණු කිරීම.

13. වල්මෝරුවේ වෙලේ පෝටාව සෑදීම.
14. මොරගොල්ලේ ඇල වේල්ල අළුත්වැඩියාව.
15. කැඳන්ගමුවේ කලටුවාදෙන අමුන අළුත්වැඩියාව.
16. යාපාගම වැවේ ගංවතුර හානි වැඩ.
17. කඹුක්කදවන්ල තිඹරි අත්තා වැවේ ගංවතුර හානි වැඩ.
18. අඹන හින්ගගේ අමුන සහ වේල්ල දියුණු කිරීම.
19. නිකවැහැර දෙගල්ලේ වැව ප්‍රතිසංස්කරණය.
20. පුවක්පිටියේ පතනේ ගෙදර ඉදිකඩ බැන්ද ඇලේ අස්වැද්දුමට ජලය සැපයීම.
21. ඉඹුල්පිටියේ රංගම ඇල පලල් කිරීම සහ වේල්ල තර කිරීම.
22. නුගපිටියේ අගස්කුඹුර අමුනේ අගස්තිපුර පිහිල්ල ඇල අලුත්වැඩියා කිරීම.
23. පිටවල එපිට ගම්මැද්දේ අමුනේ ඇල දියුණු කිරීම.
24. බෝධිකොටුවේ දෙමටගහවත්තේ වෙල්යායේ අමුන ඇල දියුණු කිරීම.
25. පඹිවිට ඇල වේල්ල කැඩීයාම ප්‍රතිසංස්කරණය හා කවඩියා මුල්ලේ පැන්නුම ඉදි කිරීම.
26. බණ්ඩාරපොල යටලවෙල ඇලෙන් උඩ යායේ අමුනේ සහ ඇලේ අලුත්වැඩියාවන්.
27. පුවක්පිටියේ ගමේ වෙලේ පෝටා ඉදි කිරීම.
28. යටවත්තේ සියඹලා කුඹුරේ ඇලේ පැතිබැම්ම බැඳීම.
29. ඇටන්වල රත්නින්දේ ඇල සංවර්ධනය.
30. වේරගම මාපාගෙදර වෙලේ කඩාබුව බැඳීම.
31. කහගල මැකරල් හේනේ අමුනේ ඇල දියුණු කිරීම.
32. අලුත්කුඹුරේ ගමේ වැව දියුණු කිරීම.
33. කවුඩුපැලැල්ලේ අමුන ඉදි කිරීම.
34. ගුරලවෙල කුඩාගොඩ අමුන ඉදි කිරීම.
35. මකුලුගස් වැවේ ඉහලවෙලේ වැව දියුණු කිරීම.
36. රදාවෙල වේල්ලේ පෝටා සෑදීම.
37. මෙල්පිටියේ වැවත්තාවේ අමුන බැඳීම.
38. මේල්පිටියේ හංකොලේ අමුනේ කඩක්කරය බැඳීම.
39. කළුන්දාව කොරකහ වැවේ වාන අලුත්වැඩියාව.
40. හැලඹගහවත්තේ වරාගොල්ලේ අමුන අලුත්වැඩියා කිරීම.
41. අම්බොක්ක මහඇලේ අමුන අලුත්වැඩියා කිරීමේ ඉතිරි වැඩ.
42. දිවිල්ලේ අඹේවෙල අමුනේ ගංවතුර හානි වැඩ.
43. පොත්තටවෙල එගොඩ වෙල අමුන අළුත්වැඩියාව.

2. සෑම ටෙන්ඩර්පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකග නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූලි මස 5 දින දවල් 12 දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "................................ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර, 1969 ජූලි මස 7 දින දවල් 12 ට පෙර මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතූන් උඩ, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූලි මස 8 දින පෙ. ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර්පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩබ්ලිව්. ටී. බී. අරඹේපොල,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මාතලේ දිස්ත්‍රික්කය.

මාතලේ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 ජූනි මස 11 දින දීය.

6–757 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව නි. මි. යෝ. ක්‍රා. ගබඩාවල වැඩ අවසන් කිරීම

පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව නි. මි. යෝ. ක්‍රා. ගබඩාවල (බු. 50,000 ක ධාරිතාවය ඇති ගබඩා දෙකයි) වැඩ අවසන් කිරීම සඳහා 1969 ජූලි මස 11 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් බාරගනු ලැබේ.

2. රුපියල් 250ක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබා ගන්නා ලද ආකෘතිපත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රු. 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් "කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි 10 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබා ගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර්පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

ඩී. පී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූනි මස 20 වෙනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

6–690 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

**උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශය :**

(1) මූංවත්ත මහ ඇළ ප්‍රතිසංස්කරණය.
(2) නාපටවෙල රතඹපිටිය ඇළ ප්‍රතිසංස්කරණය.
(3) ඉඩම්පිටිය සියඹලාගස්තැන්න ඇළ ප්‍රතිසංස්කරණය.
(4) වදවල රත්නින්දේ ඇළ ප්‍රතිසංස්කරණය.
(5) ඇකිරිය එළඹුරේ ඇළ ප්‍රතිසංස්කරණය.
(6) හඟුරන්කෙත වදවල ඇළ ප්‍රතිසංස්කරණය.
(7) වැල්ලගිරිය මහ ඇළ ප්‍රතිසංස්කරණය.
(8) ඉඩම්පිටිය ගොඩගෙඩිය ඇළ ප්‍රතිසංස්කරණය.
(9) ඇකිරිය කප්පර ගොල්ල ඇළ ප්‍රතිසංස්කරණය.
(10) දෙණිකෝ දේදුනුඅමුණනේ ඇළ ප්‍රතිසංස්කරණය.
(11) මාපනාවතුර මීපේ ඇළ ප්‍රතිසංස්කරණය.
(12) විල්වල පුණ්ඩරුඅරාවේ ඇළ ප්‍රතිසංස්කරණය.
(13) විල්වල පිටහ ඇළ ප්‍රතිසංස්කරණය.
(14) උඩවෙල ගල්දෝවේ ඇළ ප්‍රතිසංස්කරණය.
(15) වැල්ලගිරිය කීනබැද්දේ ඇළ ප්‍රතිසංස්කරණය.
(16) මූංවත්ත පොල්කුඹුර ඇළ ප්‍රතිසංස්කරණය.
(17) ආදවෙල-උනගොල්ල ඉලුක්පැස්ස ඇළ ප්‍රතිසංස්කරණය.
(18) වැටකේ පොත බානගල ඇළ ප්‍රතිසංස්කරණය.

**වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය :**

(19) පල්ලේගම පේඩිවෙල ඇළ ප්‍රතිසංස්කරණය.
(20) කුඹුක්වෙල ගන්නිලේ ඇළ ප්‍රතිසංස්කරණය.
(21) කුඹුක්වෙල දුනුකේගොල්ල ඇළ ප්‍රතිසංස්කරණය.
(22) මාලියද්ද උඩාඅරාවේ ඇළ ප්‍රතිසංස්කරණය.
(23) තෙරිපැහැ දොඩම්තැන්නේ ඇළ ප්‍රතිසංස්කරණය.
(24) තෙරිපැහැ හිඟුරුවෙල ඇළ ප්‍රතිසංස්කරණය.
(25) බටගොල්ල මානිල්වෙල ඇළ ප්‍රතිසංස්කරණය.
(26) බටගොල්ල වටරක්ගොඩ ඇළ ප්‍රතිසංස්කරණය.
(27) බටගොල්ල මිල්ලපිටිය උඩඇළ ප්‍රතිසංස්කරණය.
(28) බටගොල්ල ඇලෙන්පල්ලහේන ඇළ ප්‍රතිසංස්කරණය.
(29) කුඹල්ගමුව අස්වැද්දුම ඇළ ප්‍රතිසංස්කරණය.
(30) කුඹල්ගමුව කොට්ටවත්ත ඇළ ප්‍රතිසංස්කරණය.
(31) අඹන්වැල්ල නාරංගස්අරාවේ ඇළ ප්‍රතිසංස්කරණය.
(32) රූපහ කිතුල්පාගම ඇළ ප්‍රතිසංස්කරණය.

**කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය :**

(33) රම්බඩගම මැදදෙවතුර ඇළ ප්‍රතිසංස්කරණය.
(34) මාවෙල උඩමා ඇළ ප්‍රතිසංස්කරණය.
(35) මාවෙල බානගල ඇළ ප්‍රතිසංස්කරණය.
(36) මැතගම දෙල්වත්තේ ඇළ ප්‍රතිසංස්කරණය.
(37) කඩදොරපිටිය මඩකුඹුරවත්තේ ඇළ නොහොත් වරලේ ඇළ ප්‍රතිසංස්කරණය.
(38) සංගිලිපාලම-මල්හැව මහ ඇළ ප්‍රතිසංස්කරණය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූලි මස 9 දින දවල් 12 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත්කොට ඒ බවට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "......සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර, 1969 ජූලි මස 9 වෙනි දින ප. ව. 2.30 ට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩරය භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින්

ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකා වෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත් සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූලි මස 10 වෙනි දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරී තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මූලගණන් පරීක්ෂා කිරීමට උවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇස්. ඩී. එච්. සුපියරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 ජූනි මස 9 වෙනි දින දීය.

6–689— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**රඹුක්කන නි.මි.යෝ.ක්‍රා. ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර්**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන නි.මි.යෝ.ක්‍රා. ගබඩාව ඉදි කිරීම සඳහා 1969 ජූලි මස 11 වෙනි සිකුරාදා ප. ව. 2. 30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. රුපියල් 50 ක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රු. 10,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි මස 10 වෙනි දින දවල් 12. 00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූනි 20 වෙනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

6–760 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**වීරේලර් දෙකක් සහිත "කොමර්" කැබ් එකක් සහ "කෝල්ස්" දොඹකරයක් විකිණීම**

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාරතැනගෙන් ඉහත සඳහන් වාහන මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්වූ ජූලි මස 22 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් ෆෝර්මවලයි. වර්ෂ 1969ක්වූ ජූලි මස 18 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ ජූලි මස 22 වන අඟහරුවාදා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ ජූනි මස 20 වෙනි දින දීය.

6–676 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කොළඹ දිස්ත්‍රික්කයේ පහත සඳහන් ජනපදයන්හි තැනීම් වැඩ සඳහා 1969 ජූලි 4 දින දවල් 12 දක්වා ම විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

වැඩ විස්තර—

මීරිගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ ගොඩැල්ලවත්ත ජනපදයේ බෝක්කු 2.

මීරිගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කුමන්දවත්ත ජනපදයේ බෝක්කු 2 ක් හා නාන ළිඳක් තැනීම.

මීරිගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කාමරාගාවත්ත පොදු නාන ළිඳක් තැනීම.

මීරිගම ප්‍රදේශීය ආදායම් කොට්ඨාශයේ පරගොඩ ජනපදයට බෝක්කුවක් තැනීම.

මීරිගම ප්‍රදේශීය ආදායම් කොට්ඨාශයේ දොරොව්ව ජනපදයේ පාරේ, බෝක්කු තැනීම.

මිනුවන්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වලහේන වත්ත ජනපදයට ළිං තැනීම.

පිලියන්දල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ රෙජිඩේල් වත්ත ජනපදය නාන ළිඳක් හා බොනු ළිඳක් තැනීම,

රු. 10,000 කට හෝ ඊට වැඩියෙන් රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හෝ සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හෝ කම්කරු සමිතිවලටද, ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර්කරු විසින් එක් එක් වැඩය සඳහා රු. 15 ක් ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු 1969 ජූලි මස 2 දින පෙරවරු 12 දක්වා මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක.

ටෙන්ඩර් ඉදිරිපත් කරන කවරයේ වම් කෙලවර ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතු අතර 1969 ජූලි මස 4 දින පෙරවරු 12 ට පෙර මට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ උප දිසාපති තැනගේ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ හෝ බහා ලිය යුතු ය.

1969 ජූලි 4 දින දවල් 12 ට කොළඹ උප දිසාපති තුමාගේ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

වැඩි විස්තර කොළඹ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබා ගත හැක.

ඩී. ජී. පල්ලියගුරු,
කොළඹ දිසාපති වෙනුවට.

1969 ජූනි මස 11 දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දී ය.

6–692 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 11 වැනි දා ප. ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. ගා/බලපිටිය ගුරු විද්‍යාලය | නේවාසිකාගාරය. |
| 2. ගා/බලපිටිය ගුරු විද්‍යාලය | භෝජනාගාරය. |
| 3. ගා/කලහෙ මහ විද්‍යාලය | විද්‍යාරසායනාගාරය. |
| 4. ගා/තවලම මහ විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 5. ගා/කොටගොඩ විද්‍යාලය | අළුත්වැඩියාව |
| 6. ගා/ඊක්ඹුර සිද්ධාර්ථ විද්‍යාලය | අළුත්වැඩියාව |

සංලක්ෂ්‍යය.—ගා = ගාලු දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, වැඩ අංක 1 සහ 2 සඳහා රු. 35,000, වැ. අ. 3 රු. 25,000, වැ. අ. 4 සඳහා රු. 21,000, වැ. අ. 5 සඳහා රු. 15,000, වැ. අ. 6 සඳහා රු. 10,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 10 වැනි දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ/අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

1969 ජූලි මස 11 වැනි ද ප. ව. 2.30 ට ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතු යි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේදී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සලකනු ලැබේ.

පී. ඇම්. වෙලගෙදර,
ගාලු ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූනි මස 10 වෙනි දින,
ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

6–775—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 11 වැනි සිකුරාදා ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| (1) මහ/ගැටඹේ ම. වි. ... | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (2) මහ/අම්පිටිය බෙරවට්ස් ම. වි. | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (3) මහ/ඝතරලියද්ද ම. වි. ... | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (4) මහ/දෙහි අංග අල් අසාර් ම. වි. | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (5) මහ/නාවලපිටිය ශාන්ත මේරි ම. වි. | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (6) මහ/වලල ම. ම. වි. ... | පාසල් ගොඩනැගිල්ලක වහල අළුත්වැඩියාව |
| (7) මහ/ලගමුව වි. ... | වීදුරු ජනෙල් සවිකිරීම |
| (8) මහ/දුනුවිල රතනපාල වි. | 40′×20′ පාසල් ගොඩනැගිල්ල |
| (9) මහ/ගිරිහාගම වි. ... | 80′×20′ පාසල් ගොඩනැගිල්ල |
| (10) මහ/අකුරණ මුස්ලිම් කණිෂ්ඨ වි. | 80′×20′ පාසල් ගොඩනැගිල්ල |
| (11) මහ/පුෂ්පදාන බාලිකා ම. වි. | පංති කාමර දෙකක් ජීව විද්‍යාගාරයකට පරිවර්තනය කිරීම |

සංලක්ෂ්‍යය.—මහ = මහනුවර ප්‍රදේශය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත්කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 8 දක්වා රු. 10,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 9 සිට 11 දක්වා රු. 20,000 හා ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 10 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර්

තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූලි මස 11 වැනි සිකුරාදා ප. ව. 2.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘති අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූනි මස 12 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

6–778 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මාන්කුලම් පොලිස් ස්ථානය—ගොඩනැගිලිවලට යන්ත්‍රාගාරයක් සැපයීම හා ස්ථාපනය කිරීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් 69.7.25 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.7.24 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලු ටෙන්ඩර් කවරයන් හි වම්පස ඉහළ කෙළවරේ "මාන්කුලම් පොලිස් ස්ථානයට යන්ත්‍රාගාරයක් සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන් ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තකවනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

8. කොළඹ එච්ලින් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.7.25 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරුතැනගෙන් විමසන්න.

සී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායසීලය,
කොළඹ, 69.6.12.
සීවී/2/377

6–772— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### මහනුවර, ප්‍රදේශයන්ට අයත් පහත සඳහන් කැලෑවලින් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් ප්‍රදේශයන්ගෙන් එහි දැක්වෙන වටිනාකමට දැව සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265, දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරි කළමනාකරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| | සුදුසුකම් ඇති ටෙන්ඩර්කරුවෝ |
|---|---|
| 1. මහනුවර ප්‍රදේශය. | |
| 1. වෑ උඩකන්ද යෝජිත රක්ෂිතය. කඳන් හා සිල්පර සැපයීම, රු. 5,00,000 වටිනාකමට. | කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් පමණකි. |
| 2. බදුල්ල ප්‍රදේශය | |
| 1. දඹගම ජලාශ යෝජනා ක්‍රම යට යටවන ප්‍රදේශය. කඳන් සැපයීම, රු. 75,000 වටිනාකමට. | කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රු. 75,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය. |
| 3. දකුණු ප්‍රදේශය | |
| 1. රම්මල් කන්ද කඳන් හා සිල්පර සැපයීම, රු. 1,50,000 වටිනාකමට. | කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා පොදු ආකෘති පත්‍ර 170 හි රු. 1,50,000 වටිනාකමට වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අය. |

4. 1969.7.3 වැනි දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. 1969.7.4 වැනි දින පූ. භා. 11 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකාරවරුන්ගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරි කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1969 ජූනි මස 20 වැනි දින, ක්‍රියාකාරි කළමනාකරුගේ අංශය,
265, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

6–863— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### වාෂ්පුවේ සිට බඩු ඉවත් කිරීම හා ප්‍රවාහණය කිරීම

ඉහත සඳහන් සේවාවන් ඉටු කිරීම සඳහා, මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 1969.6.30 දින පස්වරු 3 දක්වා ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

ආපසු ලබාගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් සහ ආපසු නොගෙවන රු. 10 ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු, 1969.6.28 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් සහ ටෙන්ඩර් කොන්දේසි පහත සඳහන් අයගෙන් ලබා ගත හැක.

සැපයීම් කළමනාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාෂ්පු දෙපාර්තමේන්තුව,
අංක 55, රෝස්මීඩ් පෙදෙස, කොළඹ 7.

6–868 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/28/ 6

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පැරපින් දියර බී.පී. සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පැරපින් දියර බී. පී. සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. :—

(i) අංක 14,843 දරණ 1969.2.28 වැනි දිනැති '' රජයේ ගැසට් පත්‍රයේ '' පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම් ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(iv) ඕස්ට්‍රයාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රූ.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, සෙලින්කෝ මන්දිරයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 19 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින් ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත් ;

(ii) 1 වැනි ඡේදයේ IV වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට ය.

1969 ජූනි මස 10 වැනි දින,
කොළඹ.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | Paraffin Liquid B. P. (Liquid Paraffin Light not accepted) | 2,500 Imperial gallons | In 10 gallon good quality drums |

6–679—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1969 ඔක්තෝබර් 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළයුතුය

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට ආපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවර යෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන වීට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10 **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969.6.5 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රු. | රු. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 1. හිඟුරක්ගොඩ දිස්ත්‍රික් රෝහල ... | 100... | 1,000 | 1969 ජූලි මස 15වන දින පෙරවරු 10ට | 550... | 500... | 500... | 2,000... | 3,000... | 3,200... | 2,800... | 12,000 |
| 2. ගලේවෙල පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 500... | 500... | 500... | 2,000... | 2,200... | 2,000... | 2,100... | 8,300 |
| 3. නාලන්ද පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 250... | 250... | 250... | 250... | 1,000... | 1,050... | 1,000... | 5,000 |
| 4. රත්තොට පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 250... | 200... | 250... | 900... | 1,500... | 1,600... | 1.400... | 5,500 |
| 5. මාදිපොල ගෘහ රෝහල ... | 100... | 800 | | 350... | 350... | 375... | 1,300... | 1,000... | 950... | 1,000... | 3,500 |
| 6. කෝන්ගහවෙල ග්‍රාමීය රෝහල ... | 100... | 800 | | 250... | 250... | 250... | 900... | 1,200... | 1,300... | 1,200... | 5,000 |

6—642/1 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍යසේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙත'' ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කරගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘතිපත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘතිපත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර්පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති තුපත් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969.6.5 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මස් | සේවකයන්ට: මාළු | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පල්ලේගම ගෘහ රෝහල ... | 100... | 800 | 1969.7.15 වැනි දින පෙරවරු 10ට | — ... | 500... | 1,000... | 2,000... | — ... | 1,500... | 3,000... | 5,500 |

6—642/2— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 1969–70 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 69.10.1 වනද සිට 1970.9.30 වනද දක්වා වකවානුව තුල දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාලයයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතන වලිනුත්, සමුපකාර සමිතිවලිනුත් මාතලේ සෞ. සේ. අධිකාරි තැන ටැන්ඩර් බාරගනු ඇත.
සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් වියැ යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘතිපත්‍රය මතැයි. රු. 100 ක මුදලක් ළහැමැ ඇති කච්චේරියේ මාතලේ සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබා ගෙනැ ටැන්ඩර්පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ටර්පත්‍ර 1969.7.17 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකියැ :—

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම | මඩකලපුව |
| යාපනය | කුරුණෑගල | රත්නපුර | බදුල්ල | කලුතර |
| මාතලේ | වවුනියා | කොළඹ | මහනුවර | මාතර |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගකුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියැවුණු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළයුතු ටැන්ඩර්පත්‍ර '' බඩු ඇදීම සඳහා ටැන්ඩරය '' යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා මාතලේ සෞ. සේ. අධිකාරි වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1969.7.18 වනදු පෙරවරු 10 ට පෙර මාතලේ සෙං. සේ. අධිකාරී වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් සෙං. සේ. අධිකාරී කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයැ. ටැන්ඩර්කරුවන් කැමැති නම් ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෙං. සේ.අධිකාරී කාර්යාලවලැ, ලේකම්/ගණකාධිකාරී වෙත බාරදී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර්කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විටැ දක්විය යුතුයි.

8. ටැන්ඩර්පත්‍ර 1969.7.18 වනදු පෙරවරු 10 ට මාතලේ සෙං. සේ. අධිකාරී කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරමලත් නියෝජිතයින්ට හෝ, තමන් කැමති නම්, මාතලේ සෙං. සේ. අධිකාරී සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිටැ, ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළගණන්. ටැන්ඩර් බාරගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

10. මාතලේ සෙං. සේ. අධිකාරී ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරිමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර්කරු සේවයට ගතයුත්තේ ලාංකිකයින් පමණකි. මෙහිදී '' ලාංකිකයා '' යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. මාතලේ සෙං. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සළකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොට එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්. එකතු කිරීම්, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. මාතලේ සෙං. සේ. අධිකාරී තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 300 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කරන බවට සෙං. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව මාතලේ සෙං. සේ. අධිකාරී විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවූවහොත් හෝ අපොහොසත් වූවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. මාතලේ සෙං. සේ. අධිකාරිගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකොට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිසැ අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. මාතලේ සෙං. සේ. අධිකාරි තැන, සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දැකීමත්. යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෙං. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්තුකරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලව එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස මාතලේ සෙං. සේ. අධිකාරි වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තිමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ, ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතහොත්. කිසිදු ටැන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡෙදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිවවුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේං මෙහි දක්වෙන දුර ප්‍රමාණේ නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙනගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවහොත්. හෝ හොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්-හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද අතුළත් කොටැ, අලාභහානි සිදුවූ හෝ හොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදීයෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දක්විය යුතු මිළ ගණන්.**—(අ) (i) බඩු ඇදීය සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී—1 උපලේඛන යෙහි දක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද.
දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,
සිව්වැනුවැ රාත්තල 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,
පස්වැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,
හයවැනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද.
හත්වැනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,
අටවැනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,
නමවැනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,
දස වැනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරුමැ ගෙනැ යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිළ ගණන් දක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දක්වෙන බර කුමක් වුවද මුළු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4කට අඩුනම්, ඒවායේ ගෙවීම් බී—I උප ලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී—II උප ලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යෑම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී—II උපලේඛනයෙහි මිළ ගණන් දක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා

(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා

(4) ටොන් 1කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිල ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන්කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

වෛද්‍ය, ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

දිනය ; 1969.6.5

.............................................
දිනය : 196...................................... නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

.....................................
දිනය : 196...................................... ටැන්ඩර්කරුගේ අත්සන.

මාතලේ සෞ. සේ. අධිකාරි කොටසේ 1969-70 වර්ෂය තුළදී ගබඩා ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියවෙන උපලේඛනය

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්‍යාලවලින්/කාර්‍යාලවලට | කිට්වුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| **I වන කොටස** | | |
| ටෙන්ඩර් තැන්පත් මුදල—රු. 100.00 | | |
| ඇප මුදල—රු. 500.00 | | |
| මාතලේ ... ... ... ... ... | මාතලේ සෞ. සේ. අධිකාරි ... | ½ |
| | මාතලේ රෝහල ... ... | ½ |
| | මාතලේ සෞ. වෛ. නි. ... ... | ½ |
| | මාතලේ දන්ත චිකිත්සාගාරය ... | ½ |
| | අලුවිහාරේ ම. බෙ. හල ... ... | 2 |
| | රත්තොට සෞ. වෛ. නි. ... ... | 8 |
| | රත්තොට රෝහල ... ... | 8 |
| | උතුරු මාතලේ මා. නි. ... ... | 9 |
| | යටවත්ත මා. නි. ... ... | 10 |
| | ඕවිලිකන්ද මා. නි. ... ... | 5½ |
| | පල්ලේදෙනිය ම. බෙ. හල ... ... | 11 |
| | ගම්මඩුව ම. බෙ. හල ... ... | 14 |
| | නාලන්ද රෝහල ... ... | 16 |
| | මාදිපොල රෝහල ... ... | 18 |
| | කෝන්ගහවෙල රෝහල ... ... | 24 |
| | ඉලුක්කුඹුර මා. නි. ... ... | 24 |
| | කෝට්ටපිටිය ම. බෙ. හල ... ... | 40 |
| | ලග්ගල පල්ලේගම රෝහල ... ... | 56 |
| | විල්ගමුව ම. බෙ. හල ... ... | 66 |
| | මාරක ම. බෙ. හල ... ... | 70 |
| උකුවෙල ... ... ... ... ... | උකුවෙල ම. බෙ. හල ... ... | ⅛ |
| | ලැලි අඹේ ම. බෙ. හල ... ... | 4½ |
| | ඇල්කඩුව ම. බෙ. හල ... ... | 7 |
| **II වන කොටස** | | |
| ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100.00 | | |
| ඇප මුදල රු. 500.00 | | |
| හිඟුරක්ගොඩ ... ... ... ... | හිඟුරක්ගොඩ රෝහල ... ... | 2 |
| | හිඟුරක්ගොඩ සෞ. වෛ. නි. ... | 2 |
| | ගිරිතලේ මා. නි. ... ... | 7 |
| | ගල්අමුණ ම. බෙ. හල ... ... | 6 |
| | දිවුලන්කඩවල ම. බෙ. හල ... ... | 9 |
| | මැදගිරිය මා. නි. ... ... | 16 |
| | අත්තනකඩවල රෝහල ... ... | 22 |
| පොළොන්නරුව . ... ... ... ... | පොළොන්නරුව රෝහල ... ... | 2 |
| | පලුගස්දමන දන්ත චිකිත්සාගාරය ... | 3½ |
| | පරාක්‍රම සමුද්‍ර ම. බෙ. හල ... ... | 7 |
| | බී. ඕ. පී. 400 රෝහල ... ... | 20 |
| මනම්පිටිය ... ... ... ... | මනම්පිටිය මා. නි. ... ... | 1 |
| | අරලගන්විල ම. බෙ. හල ... ... | 13 |

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතන වලින්/ආයතනවලට කාර්යාල වලින්/කාර්යාලවලට | කිවටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| වැලිකන්ද ... ... ... ... | තමන්කඩුව ම. බෙ. හල ... ... | 16 |
| කැකිරාව ... ... ... ... ... | දඹුල්ල රෝහල ... ... | 15 |
| | දඹුල්ල සෞ. වෛ. නි. ... ... | 15 |
| | කලුන්දව ම. බෙ. හල ... ... | 25 |
| හබරන ... ... ... ... ... | කිබිස්ස ම. බෙ. හල ... ... | 13 |
| කලාවැව ... ... ... ... ... | ගලේවෙල රෝහල ... ... | 23 |
| | දේවහුව මා. නි. ... ... | 15 |
| | අලුත්වැව ම. බෙ. හල ... ... | 29 |

6–642/3— 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙන යාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, පිටි කිරි දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කායාීාල වල) සීනි, සමුපකාර තොග ගබඩාවල සිට සෞඛ්‍ය කායාීාල වලට ද සෞඛ්‍ය කායාීාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට ද ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කායාීාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායාීාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්කර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොකරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්කර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූවිට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු පිටිකිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, මාතලේ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායාීාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම මගේ කායාීාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන ඡේදයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීමට හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉක්මවන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේ ය.

11. **වෙනත් විස්කර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් විමසන්න.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

69.6.5 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කායාීාලයේ දීය.

### උපලේඛනය

| සේවය | ප්‍රදේශය | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය — පිටිකිරි හො. | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය — සීනි හො. | විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමූපකාර බඩු ගබඩාවේ සිට සීනි ද, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායාීාලයට සහ මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායාීාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... ... | මාතලේ ... | 21⅜ ... | 8½ | 69.7.18 පූ.භා. 10 ට |
| කදුරුවෙල දුම්රිය ස්ථානයේ සිට පිටි කිරිද, තමන්කඩුව සමූපකාර සංගමයේ සිට සීනි ද, හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායාීාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායාීාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ද ... ... ... | හිඟුරක්ගොඩ | 13½ ... | 6¼ | |
| කැකිරාවේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි ද, දඹුල්ල සමූපකාර සංගමයේ සිට සීනි ද, දඹුල්ලේ සෞඛ්‍ය කායාීාලයට සහ දඹුල්ලේ සෞඛ්‍ය කායාීාලයේ සිට දඹුල්ලේ සෞඛ්‍ය කායාීාලය භාර නිළධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | දඹුල්ල ... | 22½ ... | 8½ | |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටි කිරි ද, මාතලේ සමූපකාර සංගමයේ සිට සීනි ද, රත්තොට සෞඛ්‍ය කායාීාලයට සහ රත්තොට සෞඛ්‍ය කායාීාලයේ සිට රත්තොට සෞඛ්‍ය කායාීාලය භාර නිලධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | රත්තොට ... | 30 ... | 11½ | |

6—642/4 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—එළකිරි ප්‍රවාහනය කිරීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කාර්යාල වල) ආණ්ඩුවේ ගොවිපළවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයේ 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, මාතලේ '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුන බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කරගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් විමසන්න.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969.6.5 වෙනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

### උප ලේඛනය

| සේවය | ප්‍රදේශය | මසකට යැවිය හැකි ප්‍රමාණය පයින්ට් | විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|
| හිඟුරක්ගොඩ දුම්රිය ස්ථානයේ හෝ පොළොන්නරුව මධ්‍යම සත්ව පර්යේෂණ ස්ථානයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතැනගේ කාර්යාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | හිඟුරක්ගොඩ ... | 8,556 ... | 69.7.18 වන දින පෙ. ව. 10 ට |

6–642/5—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වැනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මෙ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ ආණ්ඩුවේ ගොවිපළවල සිට කිරි මධ්‍යස්ථාන වලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි රු. 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය, පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනෙහි, දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—ප්‍රවාහනය කළ යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, කෑගල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම් මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම් කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සඳහන් අදාල කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මඟින් පුළුවන.

මා. වි. ආ. බලසේකර,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන.

1969 ජූනි 8 වැනි දින,
කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | (1) සේවය | (2) ප්‍රදේශය | | (3) ප්‍රමාණය දළ වශයෙන් මසකට පයින්ට්ස් | (4) අවසන් දිනය |
|---|---|---|---|---|---|
| 1. | කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කෑගල්ල | ... | 14,510 | 1969 ජූලි 18 වෙනි දින පෙ.ව. 10 ට |
| 2. | ගලිගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට ගලිගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | ගලිගමුව | ... | 16,266 | |
| 3. | මාවනැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට මාවනැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | මාවනැල්ල | ... | 15,100 | |
| 4. | අලව්ව දුම්රිය ස්ථානයේ සිට වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයට, වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | වරකාපොල | ... | 13,262 | |
| 5. | දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | දෙහිඕවිට | ... | 3,477 | |
| 6. | රුවන්වැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ කායසීලයේ සිට රුවන්වැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | රුවන්වැල්ල | ... | 8,137 | |

6–632 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වැනිද සිට 1970 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය,තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන් ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංක පැහැදිළිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළඳමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම්කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කම් විස්කර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡෙදයේ(ii) වන කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වෙන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න. තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුට රෝගීන්ට සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිලයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

5. **ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල'' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි එහි කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවා මෙන්ම එහි වම් පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාල යෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත්කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙළ කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන තබන පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුල ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

මා. වි. ආ. බලසේකර,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කෑගල්ල, 1969 ජූනි 9 වැනි දින.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| ·3 | රු. | රු. | | | | | | | | | |
| දූරනියගල ප්‍රා. රෝහල ... | 100... | 800 | | 296... | 298... | 283... | 1,183... | 2,094... | 1,974... | 2,016... | 8,335 |
| මාවනැල්ල පා. ඒකකය ... | 100... | 600 | | 3,359... | 357... | 366... | 1,458... | 1.445... | 1,488... | 1.469... | 6,031 |
| හෙම්මාතගම ග්‍රා. රෝහල ... | 100... | 400 | 1969 යේ | — ... | 207... | 102... | 395... | — ... | 1,838... | 1,034... | 3,490 |
| මහපල්ලේගම ග්‍රා. රෝහල ... | 100... | 400 | ජූලි මස | 277... | 291... | 305... | 1,156... | 837... | 809... | 816... | 2,312 |
| දෙමටන්පිටිය මා. නිවාසය ... | 100... | 300 | 18 වැනිද | 108... | 104... | 103... | 413... | 197... | 199... | 189... | 787 |
| බෙලිගල ග්‍රා. රෝහල ... | 100... | 400 | පෙ.ව. 10ට | 288... | 300... | 288... | 1,392... | 456... | 468... | 468... | 2,112 |
| අටාල මා. නිවාසය ... | 100... | 300 | | 84... | 84... | 84... | 372... | 48... | 60... | 72... | 264 |
| වේරගල මා. නිවාසය ... | 100... | 300 | | 108... | 96... | 108... | 408... | 24... | 36... | 24... | 96 |

6—615 — 69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969.10.1 සිට 1970.9.30 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමඟ ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛණයේ 2 වැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතු ය.

අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කල යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, මහනුවර සහ වවුනියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කල බවට සාක්ෂි වශයෙන් නිකුත් කරණ ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—සියලුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදීත් ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේදීත් ටෙන්ඩර් අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් 2 වන ඡෙදයේ (II) වැනි කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛණයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, රත්නපුර '' කියා එවිය යුතුය. සිල් කරණ ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කල යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කල යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචිකල තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව හෝ ගණකාධිකාරි/ ලේකම් තැනට බාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හිදී පෙ.ව. 12.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම මෙම කාර්යාලයේදී විවෘත කරණු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛණයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුලු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයේ ''සී'' උපලේඛණයට වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩුගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරණු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරු විසින් සඳහන් කරණ ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුවන්ගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙණෙන උපලේඛණයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කලයුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සළසා දෙනු ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපසය දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරු විසින් සැළකිය යුතුය.

69.6.9 වැනි දින,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

වෛද්‍ය. එස්. ජී. කුලතිලක,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි.

## උපලේඛණය

| ආයතනය | | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාලු | සේවකයින්ට: මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවලු | නොගෙවන රෝගීන්ට: මාලු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | අයගම මා.නි. ... | 100... | 400 | 1969 ජූලි 11 ද දවල් 12.00දක්වා | — ... | — ... | 400... | 650... | — ... | 250... | 650... | 1,100 |
| 2. | ගල්ලැල්ල මා.නි. ... | 100... | 400 | | — ... | 150... | 200... | 550... | — ... | 200... | 450... | 900 |
| 3. | ගිලීමලේ ගැමි රෝහල ... | 100... | 600 | | — ... | 250... | 500... | 1,000... | — ... | 450... | 900... | 1,700 |
| 4. | කල්තොට දි. රෝහල ... | 100... | 600 | | — ... | 350... | 700... | 1,400... | — ... | 500... | 950... | 1,900 |
| 5. | කලවාන ප.ඒකකය ... | 100... | 800 | | — ... | 250... | 500... | 1,000... | — ... | 450... | 900... | 1,700 |
| 6. | කිරිඇල්ල මා.නි. ... | 100... | 400 | | — ... | — ... | 450... | 650... | — ... | 250... | 650... | 1,100 |
| 7. | මහවලතැන්න ගැ.රෝහල ... | 100... | 600 | | — ... | 300... | 650... | 1,250... | — ... | 250... | 650... | 1.100 |
| 8. | නිවිතිගල මා.නි. ... | 100... | 400 | | — ... | 250... | 550... | 1,100... | — ... | 200... | 400... | 850 |
| 9. | පල්ලෙබැද්ද දි.රෝහල ... | 100... | 800 | | — ... | 200... | 375... | 825... | — ... | 1,850... | 3,600... | 7,250 |
| 10. | පොතුපිටිය ගැ.රෝහල ... | 100... | 600 | | — ... | 350... | 700... | 1,300... | — ... | 350... | 800... | 1,550 |
| 11. | රත්වල මා.නි. ... | 100... | 400 | | — ... | 125... | 400... | 800... | — ... | 150... | 350... | 600 |
| 12. | වැලිගෙපොල ගැ.රෝහල ... | 100... | 600 | | — ... | 290... | 550... | 1,100... | — ... | 750... | 1,400... | 2,800 |

616/1—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම—1969–70

**සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1969.10.1වෙනි දින සිට 1970.9.30 වනදයින් (දින 2ම ඇතුලුව) අවසන් වන වර්ෂය තුල මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියේ දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරණ ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරණ ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරණ විට ඒ ඒ සමාගම්වල හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කල යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12.00 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, කුරුණෑගල සහ වවුනියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරිමේදී මුදල් තැන්පත් කල බවට සාක්ෂි වශයෙන් නිකුත් කරණ ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරිමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරණ අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරිමේදි ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙණෙන දෙවැනි ඡෙදයේ දෙවැනි කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරිමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරිමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර සඳහා තැන්පත් කරණ ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි පිළිබඳ විස්තරය.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උප ලේඛණයෙහි 4 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සෞඛ්‍ය සේවා අධිකාරි, රත්නපුර කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කලයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුයි. කවරයෙහි දමන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් එය ලැබුණු බවට ඔහු හෝ මා විසින් නිකුත් කරණු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කල තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දින පෙරවරු 11 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරණු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරණ වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරණ මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරණ ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කල හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරිමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛණයෙහි 3 වැනි තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත.**—ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැළසුව හොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂ බීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩල තුළ ඇති නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

වෛද්‍ය එස්. ජී. කුලතිලක,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 ජුනි මස 9 වැනි දින,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
රත්නපුර.

## උපලේඛනය

| | (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) මසකට සේදිය යුතු කැලි ගණන | (5) මසකට සේදිය යුතු වාර ගණන | (6) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. | අයගම | 25 0 | 75 0 | 75 | 3 | 1969 ජූලි මස 11 වැනි දින පෙරවරු 11 දක්වා |
| 2. | ඇහැලියගොඩ | 25 0 | 100 0 | 1,750 | 4 | |
| 3. | ඇඹිලිපිටිය | 25 0 | 75 0 | 450 | 4 | |
| 4. | බලන්ගොඩ | 25 0 | 100 0 | 2,500 | 4 | |
| 5. | ගල්ලෑල්ල | 25 0 | 75 0 | 200 | 3 | |
| 6. | ගිලිමලේ | 25 0 | 75 0 | 200 | 3 | |
| 7. | ගොඩකවෙල | 25 0 | 75 0 | 400 | 3 | |
| 8. | කහවත්ත | 25 0 | 100 0 | 2,000 | 4 | |
| 9. | කල්තොට | 25 0 | 75 0 | 125 | 3 | |
| 10. | කලවාන | 25 0 | 75 0 | 450 | 3 | |
| 11. | කිරිඇල්ල | 25 0 | 75 0 | 250 | 3 | |
| 12. | කොලොන්න | 25 0 | 75 0 | 750 | 3 | |
| 13. | මහවලතැන්න | 25 0 | 75 0 | 300 | 3 | |
| 14. | නිවිතිගල | 25 0 | 75 0 | 200 | 3 | |
| 15. | පල්ලෙබැද්ද | 25 0 | 75 0 | 325 | 3 | |
| 16. | පොතුපිටිය | 25 0 | 75 0 | 175 | 3 | |
| 17. | රක්වාන | 25 0 | 100 0 | 1,200 | 4 | |
| 18. | රන්වල | 25 0 | 75 0 | 150 | 3 | |
| 19. | රත්නපුර (1) | 100 0 | 200 0 | 14,000 | දිනපතා | |
| 20. | රත්නපුර (2) | 100 0 | 200 0 | 6,000 | 4 | |
| 21. | වැලිගෙපොල | 25 0 | 75 0 | 250 | 3 | |

6–616/2—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අයිතිකම් නොකියන ලද මෘතශරීර අස්කිරීම හා වැළලීම—රත්නපුර මහ රෝහල

වර්ෂ 1969 ඔක්තෝබර 1 වැනි දින සිට 1970 සැප්තැම්බර 30 වැනිද දක්වා (දින දෙකම ඇතුලුව) කාල පරිච්ඡේදය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති පරිදි රත්නපුර, රෝහලේ අයිතිකම් නොකියන ලද මෘතශරීර අස්කිරීම හා වැළලීම සඳහා එවනු ලැබූ සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද ෆෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ 2 වැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට කච්චේරියක මුදල් තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබා ගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පෙර දින දවල් 12.00 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය ෆෝර්ම ලබා ගත යුතුයි. තැපැලෙන් ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය ෆෝර්ම ලබා ගත හැකිය.

6. සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය ෆෝර්ම මෙම කාර්යාලයෙන් හෝ දිවයිනේ අනිකුත් සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳව තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත් පිළිබඳ ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාරදී හෝ ලැබුණු බවට කුවිතාන්සියක් ද ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් එවීමට පිළිවන. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය පෙරවරු 10.00 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතු ද වන්නේය.

9. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීම ද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

10. වැඩි විස්තර මේ කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දැනගත හැකිය.

වෛද්‍ය එස්. ජී. කුලතිලක,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 ජූනි මස 9 වැනි දින,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| අයිතිකම් නොකියන ලද මෘතශරීර අස්කිරීම හා වැළලීම—රත්නපුර මහ රෝහල ... | 100 0 ... | 100 0 ... | 1969.7.12 වැනි දින පෙ.ව. 10.00 ට |

6–616/3—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1969–70 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැම්මට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගත යුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1969.10.1 වනද සිට 1970.9.30 වන ද දක්වා වකවානුව තුල දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින් / ආයතනවලට/කාර්යාලයට/කාර්යාලයයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකික වූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතන වලිනුත්, සමුපකාර සමිතිවලිනුත් කෑගල්ලේ සෞ. සේ. අධිකාරී තැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලී ද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියම වූ ආකෘති පත්‍රය මතැයි. රු. 100ක මුදලක් ළඟැම ඇති කච්චේරියේ කෑගල්ලේ සෞ. සේ. අධිකාරී නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙනැ ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නියි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1969.7.17 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරී කාර්යාලවලින් ලබාගත හැකියැ—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කළුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමින් දෙපාර්තමේන්තුව සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර් කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරී කාර්යාලයයෙකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර " බඩු ඇදීම සඳහා ටැන්ඩරය " යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා කෑගල්ලේ සෞ. සේ. අධිකාරී වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1969 ජූලි 18 වන ද පෙරවරු 10ට පෙර කෑගල්ලේ සෞ. සේ. අධිකාරී වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරී කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයැ. ටැන්ඩර් කරුවන් කැමැති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරී කාර්යාලවලැ, ලේකම්/ගණකාධිකාරී වෙත බාරදී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

1969/70 ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසිවල 24 වැනි ඡේදයේ කියැවෙන උපලේඛනය

කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

දුම්රියපොලෙන්/පොලට, ආයතනවලින්/කාර්යාලවලින්/ආයතනවලට/කාර්යාලවලට දුර ප්‍රමාණය දළ වශයෙන්

| දුම්රියපොලෙන්/පොලට/දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර |
|---|---|---|
| අවිස්සාවේල්ල ... | කරවනැල්ල දි. රෝ. ... | 9 |
| | දුරණියගල දි. රෝ. ... | 14 |
| | කිතුල්ගල දි. රෝ. ... | 19 |
| | දෙහිඕවිට සෞ. වෛ. නි. ... | 6 |
| | රුවන්වැල්ල සෞ. වෛ. නි. ... | 10 |
| | බුලත්කොහුපිටිය මා. නි. ... | 19 |
| | අම්තිරිගල ම. බෙ. ශා. ... | 5 |
| | යටියන්තොට ම. බෙ. ශා. ... | 13 |
| | දේදුගල ම. බෙ. ශා. ... | 26 |
| | කොටියාකුඹුර ම. බෙ. ශා. ... | 18 |
| | බස්නාගල ම. බෙ. ශා. ... | 25 |
| | රුවන්වැල්ල පා. ද. වි. ... | 10 |
| පරකඩුව ... | හිඟුරලකන්ද මා. නි. ... | 10 |

6–680—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන්ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරින්ගෙන්ද ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දින . පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සටහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙලවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (නැහෝ මාහට) දීමෙන් ඒ ලැබුනු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සඳහා එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

මා. වි. ආ. බලසේකර,
සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල.

1969 ජූනි මස 10 වැනි දින,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලය.

### උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. | 3<br>ඇප මුදල<br>රු. | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| කරවනැල්ල ප්‍රා. රෝහල ... ... ... | 50 ... | 100 ... | 4 ... | 3,221 | 1969 ජූලි මස 18 වැනි දින පෙ.ව. 10 ට |
| අරනායක ප්‍රා. රෝහල ... ... ... | 25 ... | 100 ... | 4 ... | 1,418 | |
| වරකාපොල පා. ඒකකය ... ... ... | 25 ... | 100 ... | 4 ... | 972 | |
| කෑගල්ල ප්‍රා. රෝහල— | | | | | |
| ශල්‍යාගාරය ... ... ... | 25 ... | 100 ... | 10 ... | 5,000 | |
| වාට්ටු අංක 3, 9 සහ 8 ... ... | 25 ... | 100 ... | 10 ... | 2,200 | |
| වාට්ටු අංක 1, 2, 4, 5, 6, 7 සහ වෙනත් සියලුම කොටස්... | 25 ... | 100 ... | 4 ... | 4,900 | |

6–675—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සතුන් සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1970 සැප්තැම්බර් මස 30 (දෙදිනම ඇතුළත්ව) වැනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමු වැනි තීරයෙහි දක්වා ඇති සේවය සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම්වලින් කොළඹ රජින වීදියේ සෙලින්කො මන්දිරයේ 5 වැනි මහලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

2. කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ඉල්ලුම් කළ විට ඔහු විසින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. නියමිත පෝර්මයේ නොවන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර්පත්වල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් මණ්ඩලයේ අනුමතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කොළඹ කච්චේරියෙහි හැර අනිකුත් කච්චේරිවල හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කළ යුතුය. මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල් බැංකුව භාරගනු නොලැබේ.

විවිධ සේවා සමුපකාර සමිති හා විවිධ සේවා සමුපකාර සමිති සංගම් ඇතුළුව අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

සැළකිය යුතුයි.—ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි. වටිනාකම පිළිබඳ තොරතුරු හෝ මුදල් තත්වයේ තොරතුරු ඉදිරිපත් කිරීමට බැරි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වේ.

7. සෑම ටෙන්ඩරයක්ම කොළඹ, රජින වීදියේ සෙලින්කො මන්දිරයේ 5 වැනි මහලේ කාමර අංක E10 දරණ සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ඉහත සඳහන් I වෙනි ඡෙදයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් කරුවෝ ඔවුන්ගේ ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට බලාපොරොත්තු නොවන්නේ නම් ඔවුන් හෝ නියෝජිතයන්ට ඉහත සඳහන් ලිපිනයෙහි සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී තැනට පුද්ගලිකව භාරදිය හැක.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් බහාලන කවරයේ පිටපැත්තේ වම් උඩ කෙළවරේ සේවයේ ස්වභාවය, නම හා ලිපිනය සටහන් කළ යුතුය.

සැළකිය යුතුයි.—ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ පෙරවරු 10යෙන් පසු තැපෑලෙන් හෝ වෙනයම් ක්‍රමයකින් ලැබෙන ටෙන්ඩර් ගැන සළකා බලනු නො ලැබේ.

8. 1968 අප්‍රේල් මස 1 දින සිට 1969 මාර්තු මස 31 දින දක්වා ලබාගත් සැපයීම් ප්‍රමාණය දළ වශයෙන් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇත.

9. සපයනු ලබන වසු පැටවුන්ගෙන් වසා,ලබා ගත් පසු එම සතුන් නැවතත් කොන්ත්‍රාත්කරු වෙත ආපසු භාර දෙනු ලැබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන ලද මිළ ගණන් අඩු වශයෙන් මාස 3 ක කාලපරිච්ඡෙදයක් දක්වා වලංගු විය යුතුයි.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතු ද වන්නේය. එම කොන්දේසිවලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කළ හැකි බැවිනි.

12. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාරගැනීමටද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

13. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දනගත හැකිය.

ජේ. ඒ. ජෙහරාජා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූනි මස 10 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 584,
කොළඹ 1

## උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| කොළඹ වෛද්‍ය පර්යේෂණායතනයට සහ කොළඹ මහාරෝග්‍යශාලාවට සතුන් සැපයීම... | 100 ... | 700 ... | 1969.7.23 දින පෙ.ව. 10 |

### උපලේඛනය (දළ වශයෙන්)

| | | | |
|---|---|---|---|
| වසු පැටවුන් | ... | ... | 85 |
| මීහරක් පැටවුන් | ... | ... | 2 |
| එලුවෝ ... | ... | ... | 820 |
| හාවුන් (ලොකු) | ... | ... | 270 |
| ගිනි පිග්ස් (රට මීයන්) | ... | ... | 20 |
| ගෙම්බන් ... | ... | ... | 8,400 |

6–674—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වන ද සිට 1970 සැප්තැම්බර් 30 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත්කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

**සැ.යු.**—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියාව සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡෙදයේ (ii) සඳහන් ඕනෑ ම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයේ 5 තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි තැන, පුත්තලම " කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහාලන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය,**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍ර සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිලේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරි, පුත්තලම.

1969 ජුනි මස 10 වෙනි දින,
පුත්තලම, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | සේවකයින්ට: මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුන්දලම ග්‍රා. රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | 69.7.11 පෙ.ව. 10 ට | 500... | 500... | 500... | 2,000... | 1,500... | 1,500... | 1,500... | 600... | 1,600 |
| ආනමඩුව දිස්ත්‍රික් රෝහල ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 1,500... | 1,500... | 1,500... | 6,000... | — |
| දංකොටුව ග්‍රා. රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 300... | 300... | 300... | 1,200... | 1,700... | 1,700... | 1,700... | 7,000... | 2,500 |
| මාදම්පෙ ග්‍රා. රෝහල ... | 100... | 800 | | 200... | 200... | 200... | 800... | 900... | 900... | 900... | 3,600... | — |
| ගල්මුරුව ග්‍රා. රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 150... | 150... | 150... | 600... | 1,200... | 1,200... | 1,200... | 4,800... | — |

6-671—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන අයුරු දුම්රියපලේ සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවීමට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි තුන්වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය සේවා අධිකාරි තැනට භාර දී එය ලැබුන බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි හතරවන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරණ ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලබන නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කිරීම කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතු ද වේ.

11. **වෙනත් විස්තර.**—වැඩිදුර විස්තර දනගැනීම සඳහා වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන අමතන්න.

පො. රත්නසභාපති,
වැ. බ. වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

1969 ජුනි 12 වන දින,
වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) සේවාව | (2) පෙදෙස | (3) මාසයකට සැපයිය යුතු පයින්ට් ගණන | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. මාන්කුලම් දුම්රිය ස්ථානයේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලයටත්, එතැන් සිට මුලතිව් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථානවලටත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... | මුලතිව් ... | 6,975 ... | 12. 7.69 |
| 2. මන්නාරම දුම්රිය ස්ථානයේ සිට මන්නාරම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයටත් එතැන් සිට මන්නාරම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... | මන්නාරම ... | 11,335 ... | 12. 7.69 |
| 3. වවුනියාව රජයේ ගොවිපලේ සිට වවුනියාව සෞඛ්‍ය කාර්යාලයටත් එතැන් සිට වවුනියාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළ කිරි ප්‍රවාහනය කිරීම ... | වවුනියාව ... | 360 ... | 12. 7.69 |

6-770—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1969 ක්වූ ජූලි මස 11 වැනි දින පෙරවරු 10 වන තෙක් මෙහි පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| ආයතනයේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| සී. ඒ. හේවාවිතාරණ කණිෂ්ඨ විද්‍යාලය, කෑගල්ල | පංති කාමර 3 තේ ගොඩනැගිලි 2 ක් තැනීම. |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රුපියල් 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 50,000 කට හෝ ඊට වැඩි මුදලකට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 9 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිපත් කරණ අයට පමණි.

3. 2වැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද මේ වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ඔවුන් 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේද වල සඳහන් පරිදි කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්මවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැන ගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩය, විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලක නිළධාරි වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබ ගත යුතුයි.

5. 1969 ජූලි මස 11 වැනි දින පෙරවරු 10 ට කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිළධාරියා ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් වන තුරු තමන් ඉදිරිපත් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වේනොත් කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඔලිවර් අබේසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
කෑගල්ල.

1969 ජූනි මස 8 වැනි දින,
කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

6-648—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 12 වැනි සෙනසුරාදා ප. ව. 1 වන තෙක් මෙහි පහත වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. ර/ඉළුක්කුඹුර විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 2. ර/උඩගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 3. ර/උතුම්පුල්ලිගොඩ විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 4. ර/වැල්කෙණියාය විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 5. ර/දෙනගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 6. ර/මැදගීන්න විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 7. ර/හාන්දුකන්ද විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 8. ර/සීවලී මධ්‍ය මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 9. ර/හොරණැකාරකන්ද විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 10. ර/දියවින්න විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළිය තැනීම. |
| 11. ර/වැද්දාගල දකුණ මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 12 ර/සුදගල ශ්‍රී රාහුල විද්‍යාලය | ගුරු නිවාසය තැනීම. |
| 13. ර/ඕමල්පේ විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම. |
| 14. ර/බුත්කන්ද විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම. |
| 15. ර/යහලෙවෙල විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම. |
| 16. ර/එල්ලාවල මහා විද්‍යාලය... | හස්ත කර්මාන්ත ශාලාව තැනීම |
| 17. ර/උඩගම මහා විද්‍යාලය ... | හස්ත කර්මාන්ත ශාලාව තැනීම |
| 18. ර/ගල්ලෑල්ල මහා විද්‍යාලය | විද්‍යා රසායනාගාර තැනීම. |
| 19. ර/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය | විද්‍යා රසායනාගාර වැඩිදියුණුව |

18. සෞ. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්තුකරු බැඳුණු ගිවිසුම කවරක් වුව ද, තමන් කැමති අන්දමකින්, තමන් කැමති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස අනුරාධපුර සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ ලාභයක් හෝ අඩු කිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහත කී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙන ගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වුවොත් නැත්නම් අපොහොසත් වුවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වුවොත් හෝ එකී කොන්දේසි කීසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුවේ ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතු වී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල් වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කළෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරටමැ සපුරා නැතොත්, කිසිදු ටෙන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැන ගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත් ඉහත 2 වැනි ඡෙදයේ දැක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබා ගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිට්ටුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක් වේ. මෙහි දැක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවොත් හෝ හොරකම් කරනු ලැබුවොත් හෝ බඩුබාහිරාදියට අලාභයක්-හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරී ට සිදුවන රේගු බදු යනාදිය කීසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ, අලාභ හානි සිදු වූ හෝ සොරකම් කරන ලද හෝ නැති වූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දැක්විය යුතු මිළ ගණන්.**— (අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී.—1 උප ලේඛනයෙහි දැක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,
දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,
සිව්වනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,
පස්වනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,
හයවනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,
හත්වනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,
අටවනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,
නමවැනුව හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,
දසවනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බරගොල්ල උදෙසා මිළ ගණන් දැක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දැක්වෙන බර කුමක් වුවද මුළුදුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුනම්, ඒවායේ ගෙවීම් බී—I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී—II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී—II උපලේඛනයෙහි මිළ ගණන් දැක්විය යුතුයි :—

1. හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා
2. හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා
3. හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා
4. ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිල ගණන් වෙන වෙනමැ දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දැක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

පී. රත්නසභාපති,
වැ.බ. අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී.

1969.6.11

.......................................................
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 196......

.......................................................
ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 196......

## 1968-69 ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියවෙන උපලේඛනය

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රය බාහිර න්යෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර |
|---|---|---|
| | **I කොටස** | |
| | | හැ. |
| තඹුත්තේගම ... | ගාලේවැව ම. බෙ. ... ... | 7 |
| | තඹුත්තේගම ම.බෙ.හා.ම.නි. ... | 2 |
| තලාව ... | එප්පාවල ම.බෙ.හා.මා.නි. ... | 8 |
| | කටියාව ම.බෙ. ... ... | 14 |
| | තලාව ම.බෙ.හා.මා.නි. ... ... | ½ |
| තඹුත්තේගම ... | රාජාංගනය ම.බෙ. ... ... | 11 |
| රත්මලේ ... | නෙළුබැව ග්‍රා.රෝ. ... ... | 2 |
| අනුරාධපුර ... | සෞ.සේ.අධි. කාර්යාලය, අනුරාධපුර ... | 1 |
| | සෞ.කා.අනුරාධපුර ... ... | 2 |
| | අනුරාධපුර රෝහල ... ... | 2 |
| | ගල්කුලම ම.බෙ. ... ... | 11 |
| | කහටගසදිගිලිය රෝහල ... | 21 |
| | මිහින්තලේ ග්‍රා. රෝ. ... ... | 8 |
| | නොච්චියාගම ප. ඒ. ... ... | 16 |
| | එලයාපත්තුව ම.බෙ. හා මා.නි. ... | 10 |
| | මෛත්‍රී ජංගම ... ... | 2 |
| | ශුද්ධ නගරය ම.බෙ. ... ... | 2 |
| | තම්මැන්නාව ගැ.රෝ. ... ... | 14 |
| | කහටගසදිගිලිය සෞ. කා. ... | 21 |
| | කෝන්වැව ම.බෙ. ... ... | 29½ |
| | මහවිලච්චිය ම.බෙ.හා.මා.නි. ... | 22½ |
| | රණෝරාව ම.බෙ. ... ... | 20 |
| | **II කොටස** | |
| තම්පලාකාමම් ... | තම්පලාකාමම් ග්‍රා. රෝ. ... | 2 |
| කන්තලායි ... | කන්තලායි ම.බෙ. ... ... | 6½ |
| | ගන්තලාව ම.බෙ. ... ... | ¾ |
| ත්‍රිකුණාමලය ... | ත්‍රිකුණාමලය රෝහල ... ... | 1½ |
| | ත්‍රිකුණාමලය සෞ. කා. ... ... | 1½ |
| | ගෝමරන්කඩවල ග්‍රා.රෝ. ... | 24 |
| | මොරවැව ම.බෙ. ... ... | 17 |
| | නිලාවලි ම.බෙ. ... ... | 9 |
| | කිරියායි ම.බෙ. ... ... | 31 |
| | පුල්මුඩ්ඩේ ම.බෙ.මා.නි. ... | 36 |
| | කුච්චවේලි ග්‍රා.රෝ. ... ... | 22 |
| චයිනබේ ... | පෙරියකින්යායි ප.ඒ. ... ... | 5 |
| | මූතූර් රෝහල ... ... | 12 |
| | තෝපූර් ම.බෙ. ... ... | 13 |
| | ඉච්ලන්පත්තෙයි ම.බෙ.... ... | 23 |
| | අල්ලයි ම.බෙ. ... ... | 26 |
| | **III කොටස** | |
| නෑගම ... | නෑගම්පහ ම.බෙ. හා ම.නි. ... | 2½ |
| | ගල්කිරියාගම ම.බෙ. ... ... | 14 |
| | ආඩියාගල ම.බෙ. ... ... | 3 |

III කොටස—සම්බන්ධයි

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | කිලෝමීටරවලින් සැලකිය හැකි දුර හැ. |
|---|---|---|
| කලාවැව ... | කලාවැව ම.බෙ. ... ... | 2 |
| | සේනපුර ම.බෙ. හා මා.නි. ... | 11 |
| කැකිරාව ... | මරදන්කඩවල ම.බෙ. හාම.නි. ... | 5 |
| | කුන්චිකුලම ම.බෙ. ... ... | 29 |
| | ගලෙන්බිඳුනු වැව ම.බෙ. සහ මා.නි. ... | 22 |
| | යකල්ල ග්‍රා.රෝ. ... ... | 15 |
| | කැකිරාව ප.ඒ. ... ... | 2 |
| | කැකිරාව සෞ. කා. ... ... | 2 |
| | හබරන ම.බෙ. හා.මා.නි. ... | 1¾ |

IV කොටස

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | කිලෝමීටරවලින් සැලකිය හැකි දුර හැ. |
|---|---|---|
| පරසන්ගහවැව ... | පරසන්ගහවැව ම.බෙ. ... ... | 1 |
| මැදවච්චිය ... | මැදවච්චිය රෝහල ... ... | 2½ |
| | රත්මල්ගහවැව ම.බෙ.හා.මා.නි. ... | 16 |
| | හොරොව්පතාන ප.ඒ. ... ... | 28 |
| | එතාකඩ ම.බෙ. ... ... | 12 |
| | කල්ලන්චිය ම.බෙ. ... ... | 16 |
| | කපුගොල්ලෑව ම.බෙ. ... ... | 37 |
| | කැඳෑව ම.බෙ. ... ... | 13 |
| | කරුණා ජංගම ... ... | 2½ |
| වව්නියා ... | කැබිතිගොල්ලෑව ම.බෙ.හාමා.නි. ... | 15 |
| | පදවිය ම.බෙ. ... ... | 41 |
| | පදවිය දි.රෝ. ... ... | 35 |
| | තිත්තගෝනෑව ම.බෙ. ... ... | 21 |
| | සිරිපුර ම.බෙ. ... ... | 47 |
| මැදවච්චිය ... | පූනෑව ම.බෙ. ... ... | 6 |

6–776—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වනද සිට 1970 සැප්තැම්බර් 30 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර පත්‍ර වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරීතැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝර්ක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සැ.යු.**—කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තරය.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (II) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරීතැන, වවුනියාව'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවර ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කෙරෙන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩුබාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

පො. රත්නසභාපති,
වැ.බ. සෞඛ්‍ය සේවා අධිකාරි, වවුනියාව.

වවුනියාව,
සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලය,
69.6.11.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | (3) ඇප තැන්පත් මුදල රුපියල් | (4) ටෙන්ඩර් අවසාන වන දිනය සහ වේලාව | (5) අවශ්‍ය ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින් මාළු | සේවකයින් මස් | සේවකයින් කරවල | සේවකයින් එළවළු | රෝගීන් මාළු | රෝගීන් මස් | රෝගීන් කරවල | රෝගීන් එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වවුනියාව කොට්ඨාශය— | | | | | | | | | | | |
| මාන්තොට ආරෝග්‍යශාලාව | 100 | 800 | 69.7.12 දින පෙ.ව. 10ට | 1,740 | — | 270 | 2,710 | 2,640 | — | 430 | 4,180 |
| මුරුන්කන් ආරෝග්‍යශාලාව | 100 | 800 | | 980 | — | 470 | 2,000 | 2,210 | — | 1,080 | 4,350 |
| පුතුකුඩියිරිප්පු ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | | 500 | — | 450 | 1,260 | 910 | — | 970 | 2,440 |
| තලෙයිමන්නාරම ආරෝග්‍යශාලාව | 100 | 600 | | 570 | — | 470 | 1,480 | 1,040 | — | 930 | 2,860 |
| විඩතල්තිව් ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | | 700 | — | 330 | 1,400 | 1,110 | — | 510 | 2,180 |
| නෙඩුන්කෙනිමානි | 100 | 400 | | 200 | — | 400 | 850 | 270 | — | 530 | 1,550 |

6-769—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.—1969 ඔක්තෝබර් පළමු වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වනදසින් (දින දෙකත් ඇතුළුව) අවසන්වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උප ලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් තැන්පත් මුදල්.—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා ඩුප්ලිකේට් පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු හෝ ම විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේ ය.

11. අනික් විස්තර.—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරීතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම.—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කොළඹ,
1969.6.13.

වෛද්‍ය එච්. සී. ගෝමස්,
කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරී.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍යයෙන් | ටෙන්ඩර් බාර ගැනීම අවසාන වන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| 1. උතුරු කොළඹ රෝහල, රාගම | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 3, 4, 6, 8, 9, 11, 12, 13, 14, 15, 16, මහලු වාටවු දෙකයි, ඕ. පී. ඩී ඇක්ස්රේ, රසායනාගාරය, මුළුතැන්ගෙය, හෙදි නිවාස, හෙදි පාලිකා නිවාස, කායචිකිත්සාලය, දන්ත විකිත්සාගාරය, සමාජ රෝග විකිත්සාගාරය, විකිත්සාගාරය, ගිලන් රථ ගරාජය ... ... | 100 ... | 400 ... | 10 ... | 13,000 | — |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු අංක 2, 10 ... ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 1,900 | — |
| කොටස් අංක 3 | | | | | |
| මාතෘ වාට්ටු, ශල්‍යාගාරය, ප්‍රසූතිකාගාරය ... | 100 ... | 400 ... | දිනපතා ... | 12,500 | — |
| 2. දකුණු කොළඹ රෝහල, කළුබෝවිල | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 7, 9, 11, ලේ බැංකුව, ඕ.පී.ඩී., කායචිකිත්සාලය, මුළුතැන්ගෙය, හෙදි නිවාසය, වෛද්‍ය නිවාසය, මෘත ශරීරාගාරය, රසායනාගාරය, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, විකිත්සාගාරය, කායික වෛද්‍යකර්ම දෙපාර්තමේන්තුව, ඊ. සී. ජී., නැවතුම් කරන දෙපාර්තමේන්තුව... | 100 ... | 500 ... | වාර 4 ... | 9,600 | |
| කොටස් අංක 2 | | | | | |
| ශල්‍යාගාරය, ළමා වාට්ටු (15ඒ), ගර්භනී මාතෘ වාට්ටු අංක 14, 16, 17, 18 ... ... ... | 100 ... | 800 ... | දිනපතා ... | 21,231 | |
| කොටස් අංක 3 | | | | | |
| ළමා වාට්ටු (අංක 15බී), අංක 10, 12 ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 4,566 | |
| 3. අවිස්සාවේල්ල රෝහල | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| සාමාන්‍ය වාට්ටු 11, කායචිකිත්සාලය, මුළුතැන්ගෙය, හෙදි නිවාස, දන්ත විකිත්සාගාරය ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,873 | |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු, ගර්භනී මාතෘ වාට්ටු, ශල්‍යාගාරය ... | 100 ... | 200 ... | දිනපතා ... | 1,823 | |
| 4. මොරටුව රෝහල | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| සාමාන්‍ය වාට්ටු 7, බාහිර අංශය, මුළුතැන්ගෙය, දන්ත විකිත්සාගාරය, ඕ. පී. ඩී. ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,900 | 1969.7.11 දින පෙ.ව. 10 |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු සහ මාතෘ වාට්ටු ... ... | 100 ... | 200 ... | වාර 10 ... | 425 | |
| 5. හෝමාගම රෝහල | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 2 (පිරිමි), වාට්ටු අංක 3, 4 (ගැහැණු), ශල්‍යාගාරය, මුළුතැන්ගෙය, හෙදි නිවාසය ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,345 | |
| කොටස් අංක 2 | | | | | |
| ගර්භනී වාට්ටු, 5, 6, 8, ළමා වාට්ටු අංක 9 ... | 100 ... | 200 ... | වාර 10 ... | 1,803 | |
| 6. වතුපිටිවල රෝහල | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 8, 9, ගෙවන වාට්ටු, බෙහෙත්හල, දන්ත විකිත්සාගාරය, පර්යේෂණාගාරය, මුළුතැන්ගෙය, ගිලන්රථ ගරාජය ... ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,727 | |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු සහ මාතෘ වාට්ටු අංක 6 සහ 7 ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,350 | |
| 7. දෙම්පේ රෝහල | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, ඕ. පී. ඩී., කාර්යාලය, බෙහෙත්හල, මුළුතැන්ගෙය ... ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,083 | |
| 8. දිවුලපිටිය රෝහල | | | | | |
| වාට්ටු අංක 1 (මාතෘ වාට්ටු), වාට්ටු අංක 2 (පිරිමි), වාට්ටු අංක 3 (ගැහැණු) ... ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,775 | |
| 9. කොළඹ පාඨශාලා දන්ත විකිත්සාගාර | | | | | |
| ජින්තුපිටිය, සහිරා විද්‍යාලය, ලුම්බිනි විද්‍යාලය, මෝදර, විසාකා විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, ශා. පීටර් විද්‍යාලය, ඉසිපතනාරාමය, කොටහේන මහා විද්‍යාලය, ශ්‍රී ජයවර්ධන පුර, කෝට්ටෙ, කුමාර විද්‍යාලය, ශා. බෙනඩික් විද්‍යාලය, නාලන්දා විද්‍යාලය, මාලිගාවත්ත මහා විද්‍යාලය, රාජකීය විද්‍යාලය, කාන්තා විද්‍යාලය, ශා. පීටර් විද්‍යාලය, ශා. ජෝන්විද්‍යාලය, ආනන්ද ශාස්ත්‍රාලය, කෝට්ටෙ, අනුලා විද්‍යාලය, නුගේගොඩ, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොටහේන. | 25 ... | 100 ... | වාර 4 ... | 890 | |

6-786—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාතීමේන්තුව

කොළඹ, ගාළුමුවදොර, ධීවර දෙපාතීමේන්තුවේ භෝජනාගාරය සඳහා මුළුතැන් ගෙයක් ඉදි කිරීම පිණිස ටැන්ඩර් 1969.7.18 වැනි දින පෙ. ව. 10 වන තුරු ධීවර අධ්‍යක්‍ෂ විසින් භාරගනු ලැබේ.

ටැන්ඩර් ආකෘති පත්‍ර 1969.7.17 වැනි දින දහවල් 12 වන තෙක් ආයතන ශාඛාවෙන් ලබාගත හැකිය.

ටැන්ඩර් තැන්පත් මුදල රු. 100 කි.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්‍ෂ.

කොළඹ 3, ගාළුමුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

6–673—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### තැපැල් ගෙනයාම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

මෝටර් ලොරියකින් හෝ මෝටර් වෑන් රියකින් හෝ මීගමුව තැපැල් කාර්යාල හා මීගමුව දුම්රිය ස්ථානය අතර, 69.8.1 දින සිට දෙවසක් තුළ තැපැල් ගෙනයාම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 1, පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයේ තැපැල් සහ විදුලි සන්දේශ දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූලි මස 4 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

පෝස්ට්මාස්ටර් ජනරාල් තැනගෙන් ඉල්ලුම් කොට ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙළ කළ යුතුය. මීට අදාළ සියළුම විස්තර ද ඔහුගෙන් ලබාගත හැකිය. රු. 10 ක් තැන්පත් කර තැපැල් කාර්යාලයකින් හෝ කච්චේරියකින් හෝ ලබාගත හැකි කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනුයේ 1969 ජූනි 28 වැනි දින දහවල් 12 වන තෙක් පමණි.

වී. එම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

6–634—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. එම් 1505(2).

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩය සඳහා 1969 ජූනි මස 25 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල |
|---|---|
| කළුදැල්ල මහපතන තරුණ ගොවිජනපද පාර අඩි 8′0″ පළලට ගල්අතුරා තාර දැමීම. | රු. 30,000 |

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1969 ජූලි මස 18 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් ඉල්ලුම් කරන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවර වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1969 ජූලි මස 25 වැනි දින පස්වරු 2.30 ට ඉහතකී 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු සහ නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම් වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා 'ලාංකික' යන්නෙන් පාරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නක් එකී පාඨයට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරන වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරේවුටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය තොරතුරු ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 ජූනි මස 4 වැනි දින,
මහනුවර කච්චේරියේදීය.

6–644—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 2/18/36/68.

## දැන්වීමයි

නුවරඑළියේ දිස්ත්‍රික්කයේ මල්ලන්ද දෙරුවාදෙණිය මැණික්වත්ත පාරේ තැනීම් වැඩ සම්බන්ධයෙන් 69.5.22 දින අංක 14,855 දරණ ගැසට් පත්‍රයේ 5-588 දරණ නිවේදනයේ සඳහන් ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසන් දිනය 1969.6.27 වෙනි දින පස්වරු 2.30 දක්වා කල් දමන්ට යෙදුන බව මෙයින් දන්වමි.

ඩබ්. එච්. නවරත්න,
නුවරඑළියේ උප දිසාපති.

1969. 6. 9 වෙනි දින,
නුවරඑළියේ දිසාපති කාර්‍යාලයේ දීය.

6–661—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : 2/18/8/66.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

නුවර එළිය දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩය සඳහා 1969 ජූලි මස 25 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|---|
| මහකුඹුගල ජලසම්පාදන ව්‍යාපාරය | ... | රු. 35,000 |

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙහි සඳහන්කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තු කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ටද, 1969 ජූලි 23 වැනි දින දහවල් 12 දක්වා නුවරඑළියේ දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයන් විසින් ඒ ඒ වැඩ වෙනුවෙන් රුපියල් 100ක මුදලක් නුවරඑළියේ දිසාපති කාර්යාලයේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් නුවරඑළියේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. චෙක්පත්, මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛන ගත තැපෑලෙන් කොළඹ 1, මහ ලේකම් කාර්යාලය, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කියා එවිය යුතුයි. ටෙන්ඩරය බහා එවන කවරය සීල් තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තැබිය යුතුයි.

5. 1969 ජූලි 25 වෙනි දින පස්වරු 2.30 ට ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔවුන් පමණක් එසේ නියුක්ත කරනු ලැබිය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිය බලය පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින්, එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා ලාංකික යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු බව අදහස් කෙරෙන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

9. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ විය යුතුයි.

10. කොන්ත්‍රාත්කරු විසින් වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

11. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මගින් නුවරඑළියේ දිසාපතිගෙන් ගත හැකිය.

ඩබ්ලිව්. එච්. නවරත්න,
නුවරඑළියේ දිසාපති වෙනුවට.

1969 ජූනි මස 9 වෙනි දින,
නුවරඑළියේ දිසාපති කාර්යාලයේ දීය.

6-662—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### එළිසබෙත් රැජින වේදිකාවේ පිහිටි වරාය සංවර්ධන අංශයේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1969. 6. 27 වැනි දින පස්වරු 2. 30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1969. 6. 26 වැනි දින පස්වරු 2. 30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

6-693—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පේරාදෙණිය, ලංකා විශ්ව විද්‍යාලයේ භූවිද්‍යා අංශයට අතිරේක ගෘහ භාණ්ඩ සැපයීම සඳහා වූ ටෙන්ඩර්පත්, පේරාදෙණිය, රජයේ වැඩ දෙපාර්තමේන්තු විශ්ව විද්‍යාලීය යෝජනා ක්‍රමයේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුතැනගේ කාර්යාලයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1969 ජූලි මස 2 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් බාරගනු ලැබේ.

2. පේරාදෙණිය, විශ්ව විද්‍යාලීය යෝජනා ක්‍රමයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වෙන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවලට රු. 4,000 කට නොඅඩු වටිනාකම් ඇති ගෘහභාණ්ඩ සපයා පෙර පළපුරුද්දක් ඇති බව ඔප්පු කොට පෙන්වීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ජූනි මස 27 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරන්නන් විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ, කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඒ. ඒ. සී. ඩබ්ලිව්. ජයසේකර,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන,
විශ්ව විද්‍යාලීය යෝජනා ක්‍රමය, පේරාදෙණිය.

ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුතැනගේ කාර්යාලය,
විශ්ව විද්‍යාලීය යෝජනා ක්‍රමය,
පේරාදෙණිය,
1969 ජූනි මස 1 දින.

6-774—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : ඒසී/එල්. 93.

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළොන්නාවේ ර. වැ. දෙ. රජයේ කර්මාන්ත ශාලාවට චීනච්චට්ටි ලුනු ඉරා ලොට්ට 150 ක සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා වූ වූ ටෙන්ඩර්පත් කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, ට්‍රාන්ස් වර්ක් හවුස් හි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ක් ජූලි මස 9 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළොන්නාවේ රජයේ කර්මාන්ත ශාලා ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැකි පත්වල වෙන ටෙන්ඩර්පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැක.

3. ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර්පත් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය සමඟ 1969 ජූලි මස 4 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජේ. බෝර්හැම්,
කර්මාන්තශාලීය ඉංජිනේරු වෙනුවට.

රජයේ කර්මාන්ත ශාලාව,
කොළොන්නාව,
1969 ජූනි 10 වැනි දින.

6–751—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## පොලිස් දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසිය

පරිහරනය කරන ලද පහත සඳහන් පොලිස් නිල ඇඳුම් සහ වෙනත් භාණ්ඩයන් 1969 ජූනි මස 26 වෙනි දින පෙ. ව. 9.30 සිට ගම්පහ පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියට පෙර කාර්යාල විවෘත වේලාවන්හි මෙම භාණ්ඩයන් පරීක්ෂාකර බැලිය හැක. වෙන්දේසිය අවසන්වූ වහාම මුදල් ගෙවා බඩු ඉවත් කර ගත යුතුය.

කේ. ඩී. සී. ඒකනායක,
ස/පොලිස් අධිකාරී, බ. ප. (උ).

11.6.69.

| | |
|---|---|
| කාකි හට කබා ... ... ... | 186 |
| කාකි කෑලෑ කබා ... ... | 47 |
| කාකි කොට කලිසම් ... ... | 245 |
| බූට්ස් සපත්තු කුට්ටම් ... ... | 265 |
| සපත්තු කුට්ටම් ... ... ... | 952 |
| ඇල තොප්පි ... ... ... | 620 |
| දිග මේස් කුට්ටම් ... ... | 103 |
| කැන්වස් සපත්තු කුට්ටම් ... ... | 109 |
| රබර් වැහිකබා ... ... ... | 45 |
| කළු වැහිකබා ... ... ... | 29 |
| ඇඳුම් කට්ටල් පලස් ... ... | 138 |
| ඝට්ඨන තොප්පි ... ... | 6 |
| යකඩ තොප්පි ... ... ... | 9 |
| පොලිස් රියදුරු තොප්පි ... ... | 16 |
| හම් පටි ... ... ... | 68 |
| කාකි දිග කලිසම් ... ... ... | 12 |
| උණ්ඩ උර ... ... ... | 63 |
| කැප් තොප්පි ... ... ... | 2 |
| සපත්තු සහ රෙදි බුරුසු ... ... | 102 |
| පටිස් ජෝඩු ... ... ... | 32 |
| කොට මේස් ජෝඩු ... ... | 1 |
| ඇඳුම් කට්ටල් පෙට්ටි ... ... | 35 |
| ඇඳුම් කට්ටල් රාක්ක ... ... | 13 |
| කොහු ගුදිරි ... ... ... | 166 |
| වතුර පෙරන ... ... ... | 3 |
| පාපැදි ... ... ... | 39 |
| වැහිකබා පටි ... ... ... | 15 |
| හිස් ගැලුම් ටින් ... ... ... | 110 |
| හිස් ගැලුම් 4 ටින් ... ... | 28 |
| යතුරලියන ... ... ... | 7 |
| මදුරු දැල් ... ... ... | 134 |
| බයිසිකල් ඩයිනමෝ ලාම්පු ... ... | 1 |
| හරිකේන් ලාම්පු ... ... | 5 |
| ඇලඩින් ලාම්පු ... ... | 1 |
| මේස ලාම්පු ... ... ... | 1 |
| සෝලර් ලාම්පු ... ... ... | 1 |
| කැලෑ කබා බකල් ... ... | 1 |
| ලී බංකු ... ... ... | 7 |
| කතුරු ... ... ... | 2 |
| පෝජැප්ස් ... ... ... | 1 |
| පාන් කපන පිහි ... ... ... | 4 |
| කුස්සි පිහිය ... ... ... | 5 |
| මේස පිහිය ... ... ... | 7 |
| ටින් කපනය ... ... ... | 1 |
| මේස හැඳි ... ... ... | 2 |
| තේ හැඳි ... ... ... | 7 |
| ඉබියතුරු ... ... ... | 36 |
| බේසම් ... ... ... | 7 |
| ඇනමල් ජෝගු ... ... ... | 2 |
| ඇනමල් පිඟන් ... ... ... | 17 |
| ඇනමල් කෝතල ... ... ... | 2 |
| ඇලුමිනියම් ජෝගු ... ... ... | 3 |
| ඇලුමිනියම් පිඟන් ... ... ... | 38 |
| ඇලුමිනියම් බේසම් ... ... | 2 |
| ඇලුමිනියම් වතුර උනුකරණ භාජන ... | 1 |
| කුණු බාල්දි ... ... ... | 1 |
| දන්වීම් පුවරු ... ... ... | 1 |
| ප්‍රථමාධාර දීසි ... ... ... | 2 |
| මිනුම් පටි ... ... ... | 3 |
| කප්පාදු කතුරු ... ... ... | 1 |
| තෙල් කෑන් ... ... ... | 1 |
| තීන්ත කුඩු ... ... ... | 6 |
| ඇඟිලි ලකුණු රෝල් ... ... | 3 |
| ඇඟිලි ලකුණු ලෑලි ... ... ... | 3 |
| බදින තාච්චි ... ... ... | 5 |
| බත් හැලි ... ... ... | 1 |
| බයිසිකල් කැරියර් ... ... ... | 6 |
| රෙදි රාක්ක ... ... ... | 4 |
| ගුවන් විදුලි රාක්ක ... ... | 1 |
| උදළු තල ... ... ... | 1 |
| ව්‍යාජ පිස්තෝල ... ... | 1 |
| ව්‍යාජ කිනිසි ... ... ... | 1 |
| බඳුන් ... ... ... | 1 |
| කැරම් ලෑලි ... ... ... | 2 |
| ක්‍රිකට් පිති ... ... ... | 2 |
| පටි කොකු ජෝඩු ... ... ... | 42. |

6–700—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ දැව වෙන්දේසියක්

මිද්දෙනිය මහා විද්‍යාලයයේ යෝජිත ක්‍රීඩා භූමියට අයත් කොටසේ පිහිටි ඝන අඩි 1200 ක් පමණ වූ තේක්ක ගස් 248 ක් 1969.7.14 වෙනි දින උදේ 10.30 ට මිද්දෙනිය මහා විද්‍යාලයට යාබද එම ගස් පිහිටි ඉඩමේදී. උතුරු ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. වෙන්දේසියෙන් ගස් ලබා ගන්නා අය තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තුමා හෝ එතුමා ගේ නියෝජිතයෙකුගේ සෑහීමට හේතුවන පරිදි සියලුම ගස් මුලින්ම ගලවා ඉවත් කළයුතුය.

2. ඒ සඳහා රු. 300 ක ආරක්ෂක මුදලක් වෙන්දේසියෙන් ගස් තීන්දු වූ වහාම ගැණුම්කරු විසින් තැන්පත් කළයුතුය. තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තුමාගේ අනුමැතිය පිට එම ආරක්ෂක මුදල හම්බන්තොට දිසාපති තුමා විසින් නිදහස් කරනු ඇත.

3. රු. 1,250 ක ලන්සුවකින් වෙන්දේසිය ආරම්භ කරනු ඇත.

4. වෙන්දේසියේ උපරිම ඉල්ලුම්කරු සිය ඉල්ලීමෙන් ¼ ක්වූ මුදලක් සහ ආරක්ෂක මුදල වූ රු. 300 ද වෙන්දේසිය අවසන් වූ අවස්ථාවේ මා වෙත ගෙවිය යුතුය.

5. වෙන්දේසියේ උපරිම ඉල්ලුම්කරුට එය තීන්දු කරනු ලබන්නේ හම්බන්තොට දිසාපති තුමාගේ අනුමැතියට යටත්වය. එතුමාගේ අනුමැතිය ලද බව වෙන්දේසියේ උපරිම ඉල්ලුම්කරුට මවිසින් ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලිපියකින් දන්වා දින හතක් ඇතුලත ¾ ක්වූ ඉතිරි මුදල මා වෙත තැන්පත් කර ගස් ඉවත් කිරීමට බලපත්‍රය ලබා ගත යුතුය.

6. බලපත්‍රයක් ලබාගෙන මිස මොනම හේතුවක් නිසාවත් කිසිම ගසක් කැපීම, ගැලවීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

7. මෙම වෙන්දේසිය අවලංගු කිරීම, කල් දැමීම, හෝ නැවත වෙන්දේසියක් පැවැත්වීමට නියම කිරීමේ බලය හම්බන්තොට දිසාපති තුමා සතුවන අතර මෙම වෙන්දේසිය පිළිබඳ අවසාන තීරණය එතුමාගේ තීරණය වනු ඇත.

8. වෙන්දේසි කරනු ලබන ගස් සියල්ල අංක 1 සිට 248 දක්වා අංක යොදා ලකුණු කර ඇත.

ජේ. සමරනායක,
ප්‍රාදේශීය ආදායම් නිලධාරී,
උතුරු ගිරුවා පත්තුව.

1969.5.27 වෙනි දින,
වීරකැටියේ, ප්‍රා. ආ. නි. කාර්යාලයේදීය.

6–761—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

### මහෙස්ත්‍රාත් උසාවිය, ගම්පහ

මෙතෙක් අයිතිකරුවන් ඉදිරිපත් නොවීම නිසා බොහෝ කලක පටන් උසාවියේ තබා ඇති මෙහි පහත සඳහන් නඩු අංකවලට අයත් නොයෙක් වර්ගයේ පරණ පාපැදි 1969 ජූලි මස 12 දින ප. ව. 1 ට උසාවි භූමියේදී ප්‍රසිඬ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම පාපැදිවලට අයිතිකරුවන් ඇතොත් හෝ යම් පාපැදියක් වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීමට හේතුවක් තිබේ නම් 1969 ජූලි මස 10 දිනට ප්‍රථම පිළිගත හැකි සාක්ෂිකරුවන් සමග උසාවියට ඉදිරිපත් විය යුතුය.

| නඩු අංකය | | පාපැදි අංකය |
|---|---|---|
| 1. ඒ. ආර්. 186 | ... | ඇෆ්. ඇස්. 16524 |
| 2. ඒ. ආර්. 6178/බී | ... | ඒ. එච්. 83920 |
| 3. අංකයක් නැත | ... | බී. ඇල්. 82874 |
| 4. ඒ. ආර්. 44 (14.12.65) | ... | බී. ඕ. 32807 |
| 5. 20970/ඒ | ... | බී. ඇල්. 43729 |
| 6. ඒ. ආර්. 4201/66 | ... | ඒ. ඇස්. 2100 |
| 7. 23806 | ... | බී. වී. 9708 |
| 8. ඒ ආර්. 6106/68 | ... | ඇෆ්. සී. 84785 |
| 9. ඒ. ආර්. 5806 | ... | වයි. 5219 |
| 10. 19635 | ... | 51891 |
| 11. අංකයක් නැත | ... | ඒ. බී. 5043 |
| 12. ඒ. ආර්. 2466 | | 5348 |
| 13. ඒ. ආර්. 678/66 | ... | අංකයක් නැත |
| 14. අංකයක් නැත | ... | රැලේ බයිසිකලය |
| 15. ඒ. ආර්. 6537/ඒ | ... | ඒ. 51403 |
| 16. ඒ. ආර්. 6398 | ... | 2597 |
| 17. 24053/ඒ | ... | ටී. ආර්. 1119 |
| 18. අංකයක් නැත | ... | සැකිල්ලක් |

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
මහෙස්ත්‍රාත්, ගම්පහ.

ගම්පහ,
මහෙස්ත්‍රාත් උසාවියේදීය.

6–627—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාරයේ) පුත්තලම ළය රෝහලේ පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය

පුත්තලම ළය රෝහලේ තිබෙන පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් බඩු 1969 ජූලි මස 1 වැනි දින පෙ. ව. 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. උදළු තල | ... | ... | 2 |
| 2. උදළු මිට | ... | ... | 2 |
| 3. ගැල්වනයිස් යකඩ නාන බාල්දි | ... | ... | 2 |
| 4. යකඩ රේක්ක | ... | ... | 1 |
| 5. ලී ස්ක්‍රීන් ආවරණ | ... | ... | 2 |
| 6. අවුල්පත් හැඳි | ... | ... | 3 |
| 7. බෙහෙත් රාක්ක | ... | ... | 1 |
| 8. ආදර්ශ කිරි පෙට්ටි | ... | ... | 1 |
| 9. වොලිබෝල් හුලං බට | ... | ... | 1 |
| 10. බයිසිකල් ටියුබ් | ... | ... | 2 |
| 11. ශීතකරන ඒකකය | ... | ... | 1 |
| 12. ඇනමල් සබන් පෙට්ටි | ... | ... | 2 |
| 13. මේස පිහියා | ... | ... | 1 |
| 14. විදුලි පන්දම් (කෝෂ 3 වර්ගය) | ... | ... | 1 |
| 15. අත්බාල්දි (ගැල්වනයිස්) | ... | ... | 2 |
| 16. ආහාර ද්‍රව්‍ය ගෙන යන වේවැල් පෙට්ටි මලු (ඇන්ඇන්ද සමඟ) | ... | ... | 2 |
| 17. කොන්ඩා කපන කතුරු | ... | ... | 1 |

2. විකුණන දිනට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා මෙම බඩු පරීක්ෂා කර බැලීමට ඉඩ ඇත.

3. මිළදී ගන්නා බඩු වෙනුවෙන් මුදල් ගෙවීම් එම ස්ථානයේදීම කළයුතු අතර එදිනම සවස 4.30 ට කලින් එම බඩු ඉවත් කර ගත යුතුයි.

ක්ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරී.

1969.6.12 වැනි දින,
කොළඹ දීය.

6–779—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

ඒ. ඇක්ස් 4/68

## අරක්කු රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය 1969--70

1969 ඔක්තෝබර් 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා ඇති තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මෙහි දක්වෙන අරක්කු තැබෑරුම්වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(1) 1969 ජූනි මස 6 දින අංක 14,857 දරණ රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි.

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ' පහත (එච්) තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය:—

(අ) ඕනෑම කච්චේරියකින්;
(ආ) කොළඹ 7 සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන්;
(ඇ) කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය;
(ඈ) කළුතර සුරාබදු මණ්ඩල කාර්යාලය;
(ඉ) හලාවත සුරාබදු මණ්ඩල කාර්යාලය.

ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික ඒවායේ උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත්කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැත්නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ.

3. සිල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර් පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ "අංක.........දරණ අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය 1969/70" යනුවෙන් සඳහන්කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපැලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම්දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9(1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබද්ද බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසුදීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වා ම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. 1969/70 වර්ෂය සඳහා දැනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන විශේෂයෙන්ම අංක 10 කෙරගෙපොකුණ තැබෑරුම් ස්ථානය ලබාගත හැකිවේදැයි කිව නොහැක. සෑම ස්ථානයක්ම කොළඹ දිසාපති තුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබා ගත හැක.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1969 ජූනි මස 12 දින.

**කොළඹ දිස්ත්‍රික්කය**

## ඉහත දැක්වූ අනුමත කළ තැබෑරුම් ලැයිස්තුව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන මේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | මොරටුව නගර සභාවේ අංක 9 කොට්ඨාශය | මොරටුව නගර සභා ප්‍රදේශයේ අංක 9 කොට්ඨාශයේ දිගරොල්ල ගමේ පමණක් | 69.7.14... | පෙ.ව. 9.30... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 5,000 |
| 2 ... | නො. 27 කොට්ඨාශය, බම්බලපිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—ස්කූල් පටුමගේ සහ කොල්ලුපිටිය පටුමගේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ගාලුපාරේ නැගෙනහිර පෙදෙස දක්වා සහ සාන්ති කිල්ඩා පටුමගේ ද, 14 වෙනි පටුමගේ ද සන්ධිය දක්වා එම සන්ධියේ සිට ගාලුපාරේ බටහිර පෙදෙස ද වෙත්. | එම | ...පෙ.ව.10.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 5,000 |
| 3 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (පිකරින්ස් පාර) ... | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට කොලේජ් වීදියේ දකුණු පෙදෙස, අළුත් මාවත පාර සහ කොටහේන වීදියේ සන්ධියේ සිට වූ පෙදෙස: නැගෙනහිරට: කොටහේන වීදියේ බටහිර පෙදෙසේ සිට කොලේජ් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස, උතුරු ස්කිනර් පාරේ පළමු කී සන්ධිය දක්වා වූ පෙදෙස; දකුණට: උතුරු ස්කිනර් පාරේ කොලේජ් වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එහි සන්ධියේ සිට කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස; බටහිරට: අලුත් මාවත පාරේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට කෝටුබෝන් වීදියේ නැගෙණහිර පෙදෙස සහ කොලේජ් වීදියේ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ නැගෙණහිර පෙදෙස | එම | ...පෙ.ව.11.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 5,000 |
| 4 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (ජම්පටා වීදිය) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: ලැස්කරීන් වීදියේ සහ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වාද එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට : ජම්පටා වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා සහ එම සන්ධියේ සිට ලැස්කරීන් වීදියේ බටහිර පෙදෙස; දකුණට: කෝටබෝන් වීදියේ සහ ලැස්කරීන් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස; බටහිරට: උතුරු ස්කිනර් පාරේ සහ ජම්පටා වීදියේ සන්ධිය දක්වා | එම | ...දවල් 12.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු 5,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 5 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට මෝදර වීදියේ සන්ධියේ සිට වෙරළාසන්න පෙදෙස සහ එම සන්ධියේ සිට ටෙම්පල් පාරේ දකුණු පෙදෙසද, අළුත් මාවත පාර සහ මෝදර වීදියේ සන්ධිය දක්වා ද, එහි සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට: මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එහි සිට අළුත්මාවත පාරේ බටහිර පෙදෙස; දකුණට; වෙරළාසන්න පෙදෙසේ සිට අලුත් මාවත පාරේ සන්ධිය දක්වා සහ එහි සිට මාෂල් වීදියේ උතුරු පෙදෙස ද; බටහිරට: මාෂල් වීදිය සහ ටෙම්පල් පාර අතර වූ වෙරළාසන්න කොටස ද වෙත්. | 6..7.14... | ප.ව. 2.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 4,000 |
| 6 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙණ හිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා, එම සන්ධයේ සිට නාගලගම් විදියේ බටහිර පෙදෙස; දකුණට: ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා පෙදෙස, එම සන්ධයේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස; බටහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධය දක්වා පෙදෙස, එම සන්ධියේ ලූකස් පාරේ නැගෙණහිර පෙදෙස ද වෙත්. | එම ... | ප.ව. 3.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 5,000 |
| 7 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට ගඟ දක්වා වූ මට්ටක්කුලිය පල්ලිය පාරේ පෙදෙස සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධියේ සිට වූ පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙණහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එම සන්ධියේ සිට ලූකස් පාරේ බටහිර පෙදෙස: දකුණට: දනියෙල් පාරේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස; බටහිරට: හීනමුල්ල පටු මගේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට දනියෙල් පාරේ නැගෙණහිර පෙදෙස ද වෙත්. | එම ... | ප.ව. 4.00... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 4,000 |
| 8 ... | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශය | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස්යාය ගමේ පමණක් | 69.7.15... | පෙ.ව. 9.30... | පෙ.ව. 9.00... | ප.ව. 8.00... | රු. 2,500 |
| 9 ... | බටහිර සියනෑ කෝරළේ (අ.ප.) | නුවර පාරෙන් හැරී යාර 400කට නොඅඩු දුරින් කඩවත-රාගම පාරේ දෙපස පිහිටි කරගහමූනේ පහළ ගමේ පමණක් | එම | ...පෙ.ව.10.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 3,000 |
| 10 ... | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශයේ කෙරගෙපොකුණ ගමේ පමණක් | එම | ...පෙ.ව.10.30... | පෙ ව. 9.00... | ප.ව. 9.00... | රු. 2,500 |
| 11 ... | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් ... | එම | ...පෙ.ව.11.00... | පෙ.ව. 8 00... | ප.ව. 7.00... | රු. 500 |
| 12 ... | කඳාන සුළු නගර සභාවෙ අංක 2 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | එම | ...පෙ.ව.11.30... | පෙ.ව. 9.00... | ප.ව. 9.00... | රු. 2,500 |
| 13 ... | ජාඇල නගරසභාවේ අංක 6 කොට්ඨාශය | ජාඇල නගර සභා ප්‍රදේශයේ අංක 6 කොට්ඨාශයේ වැලිගම්පිටිය ගමේ පමණක් | එම | ... දවල් 12.00... | පෙ.ව. 9.00... | ප.ව. 8.00... | රු. 2,000 |
| 14 ... | ජාඇල නගර සභාවේ අංක 1 කොට්ඨාශය | ජාඇල නගර සභාවේ ප්‍රදේශයේ කනුවන උතුර අංක 1 කොට්ඨාශයේ කනුවන ගමේ පමණක් | එම | ... ප.ව. 2.00... | පෙ.ව 9.00... | ප.ව. 8.00... | රු. 3,000 |
| 15 ... | දකුණු අළුත්කුරුකෝරළේ | දඹුගම ගමේ පමණක් ... | එම | ... ප.ව. 2.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 16 ... | එම ... | බෝපිටිය ගමේ පමණක් ... | එම | ... ප.ව. 3.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 1,000 |
| 17 ... | දකුණු අළුත්කුරුකෝරළේ සහ උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කැපුන්ගොඩ ගමේ පමණක් ... | එම | ... ප.ව. 3.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 18 ... | උතුරු අළුත්කුරුකෝරළේ (ඒ) | සීදුව ගමේ පමණක් ... | 69.7.15... | ප.ව. 4.00... | පෙ.ව... 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 19 ... | එම ... | කටුනායක ගමේ පමණක් ... | එම ... | ප.ව. 4.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 2,000 |
| 20 ... | එම ... | පිටිපන ගමේ පමණක් ... | 69.7.16... | පෙ.ව. 9.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 1,000 |
| 21 ... | මීගමුව මහා නගර සභාව අංක 11 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 11 කොට්ඨාශයේ කුරණ ගමේ පමණක් ... | එම | ...පෙ.ව.10.00... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 2,000 |
| 22 ... | මීගමුව මහා නගර සභාව අංක 10 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 10, මහවීදිය කොට්ඨාශයේ බෝලවලාන ගමේ පමණක් ... | එම | ...පෙ.ව.10.30... | පෙ.ව.10.00... | ප.ව. 9 00... | රු. 2,500 |
| 23 ... | මීගමුව මහ නගර සභාව අංක 8 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 8 කොට්ඨාශයේ උඩයාර්තෝප්පු ගමේ පමණක් ... | එම | ...පෙ.ව.11 00... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 4,000 |
| 24 ... | මීගමුව මහ නගර සභාව අංක 4 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 4 වැල්ලවීදිය කොට්ඨාශයේ කුඩාපාඩුව ගමේ පමණක් | එම | ...පෙ.ව.11.30... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 500 |
| 25 ... | මීගමුව මහ නගර සභාව අංක 5 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 5 කොට්ඨාශයේ පෙරියමුල්ල ගමේ පමණක් | එම | ...දවල් 12.00... | පෙ.ව.10.00... | ප.ව. 9.00... | රු. 2,000 |
| 26 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කඳවල ගමේ පමණක් ... | එම | ... ප.ව. 2.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |
| 27 ... | එම ... | දළුවාකොටුව ගමේ පමණක් ... | එම | ... ප.ව. 2.30... | පෙ ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |
| 28 ... | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශය | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශයේ සීමාව තුළ පමණක් | එම | ... ප.ව. 3.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 1,000 |
| 29 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | ඇත්තගාල ගමේ පමණක් ... | එම | ... ප.ව. 3.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 250 |
| 30 ... | එම ... | හේනේමුල්ල ගමේ පමණක් ... | එම | ... ප.ව. 4.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 250 |
| 31 ... | උතුරු අළුත්කුරු කෝරළේ (බී) | දගොන්න ගමේ පමණක් ... | එම | ... ප.ව. 4.30... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 500 |

6–756—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

## 1969-70 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුල පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා, 1969 මාර්තු මස 21 වෙනි දින අංක 14,846 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා තැබෑරුම් රේන්ද කොන්දේසිවලට සහ පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක් වෙනුවෙන්ම දනට බලපවත්වන කොන්දේසිවලට යටත්ව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 1 දරණ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 2,000 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් නියමිත කච්චේරි කුවිතාන්සිය සමග සෑම ටෙන්ඩරයක්ම, ලබාගත් නියමිත ටෙන්ඩර් පෝර්මයක ඉදිරිපත් කළ යුතු ය. තව ද, ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි මාලාවේ 4(3) (1) යන වගන්තිවල ප්‍රකාර නියමයන් අනුව වත්කම් සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු ය.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1969–70 රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වෙනි කොන්දේසිය යටතේ නුසුදුසු වූවන්ගේ ටෙන්ඩර් පත්‍ර බාරගනු නොලැබේ.

4. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල්වන ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

5. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා ලියුම් කවරයේ වම්පස මුදුනේ ''හම්බන්තොට අංක 1 දරණ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් 1969–70'' යනුවෙන් සඳහන් කර 1969 ජූලි මස 9 වෙනි දින පහත දක්වෙන තැබෑරුමට ඉදිරියෙන් සඳහන් කර ඇති වේලාවට පෙර ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට කලින් කච්චේරියට ලැබෙන පරිදි, හම්බන්තොට දිසාපති නමට ලිපිනය ලියා ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. සෑම ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් වසන වේලාවේදී පැමිණ සිටිය යුතු ය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන් කර හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන ලද මුදලක් ගෙවිය යුතු ය.

7. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර නියමිත හේතුවක් නොදක්වා ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති වෙත පැවරී ඇත.

8. වැඩි විස්තර හම්බන්තොට කච්චේරියෙන් ලබාගත හැක.

9. 1968–69 වර්ෂයට දනට රා තැබෑරුම පිහිටුවා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කරත හොත් ඒ සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ අනුමැතිය ලබාගත යුතු ය.

ඩබ්ලිව්. ආර්. සී. තිලකරත්න,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 8 දින,
හම්බන්තොට කච්චේරියේදී ය.

### 1969/70 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාව | තැබෑරුමවිවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | හම්බන්තොට නගර සභා ප්‍රදේශය ... | හම්බන්තොට නගර සභා සීමාව තුල ... | පෙ.ව. 10.00 ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 |

6–747—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

පන්නිපිටියේ, රුක්මලේ–කොට්ටාව පාරේ පිහිටි පන්නිපිටියේ දුම්රිය ස්ථානයට මිනිත්තු පහකින් පයින් යා හැකි දුර පිහිටි නවීන පහසුකම් සහිත අළුත් සොල්දර බංගලාවක් ජාතික නිවාස සහකාර කොමසාරිස් ඩී. ඇස්. **වීරසිංහ මහත්මා විසින් මා වෙත නිකුත් කර තිබෙන බලය සහ ඊට පසුව** කර ඇති අනඤ ප්‍රකාර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇස්. ගුණසේකර මහතා විසින් 1956 අගෝස්තු මස 10 වෙනි දින සහතික කරන ලද අංක 379 දරණ උකස්කරය යටතේ පන්නිපිටියේ රුක්මලේ පාරේ ඒ. කේ. රණවක මහතා වෙනුවෙන් නීති ප්‍රකාර පත් කරන ලද බලකාරී සී. ඒ. ඊ. රණවක මහත්මිය විසින් ගෙවිය යුතු මුදල රුපියල් 51,392.42 නොගෙවීම නිසා එම මුදල රුපියල් 51,392.42 ක සහ 1967 පෙබරවාරි 10 වෙනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවන දින හෝ ඉඩම වෙන්දේසි කරන දින දක්වා තව දුරටත් වූ රුපියල් 24,587.20 කට වසරකට 4 ගණනේ පොලියද, යථෝක්ත උකස් කරය ප්‍රකාර 1967 පෙබරවාරි 10 වෙනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවන තුරු හෝ ඉඩම වෙන්දේසි කරන දින දක්වා එකතු වන වන සියලුම දඩ මුදල් සමග 5.1.1968 වන දින ගෙවන ලද රු. 2,000 ක් අඩුව ඉතිරි මුදල් අයකර ගැනීමත් එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තුද, අයකර ගැනීම සඳහා **වර්ෂ 1969 ක් වූ ජූලි මස 5 වෙනි සෙනසුරාද අ. භා. 5 ට මෙහි පහත සඳහන් ඉඩම එම ස්ථානයේදී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**එනම්.**—බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කොට්ටාවේ පිහිටි (හරි ආකාර පන්නිපිටියේ පිහිටි) (එකට යාබද වැලි අඹගහලන්ද සහ හැඩවකගහවත්ත නොහොත් වැලි අඹගහලන්දේ වත්ත නැමති එකට යාබද ඉඩම් දෙකෙන් බෙද වෙන් කරන ලද කොටසක් වූ) බලයලත් මිනින්දෝරු තැන වී. සිවසුන්දරම් විසින් 29.2.1956 වන දින අංක 202 යටතේ සාදන ලද පැලැනයේ ලොට් 3 දරන උතුරට එම පැලැනයේ පෙන්වන ලොට් 2 ද, නැගෙනහිරට මොරවකගේ ඩැනියෙල් පෙරේරාගේ රබර් වත්තද, දකුණට එම පැලැනයේ ලොට් 8 ද සහ බස්නාහිරට පාරට වෙන්කරන ලද කොටසද මායිම්වූ එම පැලැනයේ ප්‍රකාර බිම් ප්‍රමාණය රූඩ් 2 ක් සහ පර්චස් එකකින් 00.25 පංගුවක්ද ඇති ඉඩම් කොටස එහි තිබෙන දැන් "අරලිය" යන නමින් හඳුන්වන ගොඩ නැගිල්ලද සමග එම අංක 202 දරණ පැලැනයේ පෙන්නුම් කරන ලොට් 10 පාරක් හැටියට පාවිච්චි කිරීමට අයිතිවාසිකම්ද සමග.

ඔප්පු බැලීමට සහ වෙනත් විස්තරවලට කොළඹ 2, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ජාතික නිවාස කොමසාරිස් තුමාගෙන් විමසන්න.

කේ. ජී. එඩ්මන්,
කොමසාරිස්, වෙන්දේසිකාර බ්‍රෝකර්තැන සහ තක්සේරුකරු.

7, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

6–871—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ලංකා සේවිංස් බැංකුව

### මුදල් තැන්පත් කරන්නන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම

ලංකා සේවිංස් බැංකුවෙහි මුදල් තැන්පත් කරන්නන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම 1969 ජූනි මස 27 වෙනි සිකුරාදා පස්වරු 3 ට ලංකා සේවිංස් බැංකුවෙහිදී පැවැත්වේ.

ටී. ජී. කාරියවසන්,
කළමනාකාර තැන.

ලංකා සේවිංස් බැංකුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1,
1969.6.10 වන දින දීය.

6–827—69.6.20 දින අංක 14,859 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජුනි ... | 69. 6. 6 සිකුරාද ... | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද ... | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද ... | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද ... | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජුලි ... | 69. 7. 4 සිකුරාද ... | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද ... | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද ... | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද ... | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 69. 8. 1 සිකුරාද ... | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද ... | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද ... | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද ... | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද ... | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 69. 9. 5 සිකුරාද ... | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද ... | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද ... | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද ... | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 69.10. 2 බ්‍රහස්පතින්ද ... | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද ... | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද ... | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් ... | 69.11. 7 සිකුරාද ... | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද ... | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද ... | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් ... | 69.12. 5 සිකුරාද ... | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද ... | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජුනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි